# වාර්ෂික වාර්තාව සහ ගිණුම්

# 2005

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන
නියෝජිතායතනය (නාරා)
කාක දූපත, මට්ටක්කුලිය
කොළඹ - 15.

ARA-038

# පටුන


| | | පිටුව |
|---|---|---|
| 01. | සාමාන්‍ය පරිපාලනය | - 1 |
| 02. | පරිසර අධ්‍යයන අංශය | - 12 |
| 03. | ධීවර තාක්ෂණ අංශය | - 18 |
| 04. | ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය | - 20 |
| 05. | අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය | - 22 |
| 06. | තොරතුරු තාක්ෂණ අංශය | - 32 |
| 07. | පුස්තකාල හා තොරතුරු අංශය | - 35 |
| 08. | සමුද්‍ර ජීව සම්පත් අංශය | - 38 |
| 09. | සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය | - 45 |
| 10. | පසු අස්වනු තාක්ෂණ අංශය | - 49 |
| 11. | සාගර විද්‍යා අංශය | - 56 |
| 12. | සේවා සහ මෙහෙයුම් අංශය | - 63 |
| 13. | වාර්ෂික මූල්‍ය ප්‍රකාශනය | - 66 |
| 14. | විගණකාධිපති වාර්තාව | - 70 |

# සාමාන්‍ය පරිපාලනය

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය (නාරා), ජලජ සම්පත් ක්ෂේත්‍රයට අයත් පර්යේෂණ, සංවර්ධන හා කළමනාකරණ කටයුතු දියත් කිරීම සහ සම්බන්ධීකරණය කිරීම පිළිබඳව පූර්ණ වගකීම දරණ ප්‍රධාන ජාතික ආයතනයයි. ධීවර දෙපාර්තමේන්තුවේ පර්යේෂණ අංශය ප්‍රතිව්‍යුහගත කොට 1981 වසරේදී නාරා ආයතනය පිහිටුවන ලදී. මෙම ප්‍රතිව්‍යුහගත කිරීමේදී, 1996 අංක 32 දරණ ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතන පනත මගින් පසුව සංශෝධනය කරන ලද, 1981 අංක 54 දරණ ජාතික ජලජ සම්පත් නියෝජිතායතන පනත නම් පාර්ලිමේන්තු පනත යටතේ අංග සම්පූර්ණ පර්යේෂණායතනයක් ලෙස නාරා ආයතනය ස්ථාපනය කිරීම සඳහා එවකට මට්ටක්කුලිය, කාක දූපතේ වර්තමාන නාරා පරිශ්‍රයේ පැවති ධීවර තාක්ෂණ ආයතනය සමඟ එම පර්යේෂණ අංශය ඒකාබද්ධ කෙරිණි. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය යටතේ වූ ව්‍යවස්ථාපිත ආයතනයක් ලෙස නාරා ආයතනය කටයුතු කරයි.

නියෝජිතායතනයේ අරමුණු සහ එයට පැවරී ඇති කාර්යභාරයන් පහත පරිදි වේ.

- ජාතික සංවර්ධන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීමෙහිලා විද්‍යාත්මක සහ තාක්ෂණික විශේෂඥ දැනුම නිසි සේ යොදවනු ලබන බවට සහ ප්‍රයෝජනයට ගනු ලබන බවට වග බලා ගැනීම.

- සම්පත් හඳුනා ගැනීම, තක්සේරු කිරීම, කළමනාකරණය සහ සංවර්ධනය උදෙසා යොමු වූ පර්යේෂණ කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම.

- ජීවී සහ අජීවී ජලජ සම්පත් වල උපයෝජනය, කළමනාකරණය සහ සංවර්ධනයට අදාල කටයුතු සඳහා අවශ්‍ය උපදෙස් සහ විශේෂඥ දැනුම සැපයීම සහ සම්බන්ධීකරණය කිරීම.

- තොරතුරු සහ දත්ත එක්රැස් කිරීම, බෙදාහැරීම සහ ප්‍රකාශයට පත් කිරීම.

    - පුහුණුව සැපයීම.

## 1. ආයතනික ව්‍යුහය.



## 2. පාලක මණ්ඩලය

තෝරා පත් කරන ලද සාමාජිකයන් 04 දෙනෙකුගෙන් සහ නිලය අනුව පත් වූ සාමාජිකයන් 08 දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත වේ. 2004 ජුනි 15 සිට 2005 සැප්තැම්බර් 01 වනදා දක්වා අදාල වූ පාලක මණ්ඩල සාමාජිකයින්ගේ නම් පහත දැක්වේ.

පත්කරන ලද සාමාජිකයන් :

01. ආචාර්ය කේ. කේ. සී. කේ. පෙරේරා (සභාපති)
02. මහාචාර්ය කේ. දහනායක
03. ආචාර්ය සී. කේ. එම්. දෙහෙරගොඩ
04. ආචාර්ය පී. ආර්. ටී. කුමාරණතුංග මිය

නිලය අනුව පත්වූ සාමාජිකයන්

05. ජ. ජිනදාස මහතා – ධීවර අමාත්‍යාංශයේ ලේකම්.
06. ජ. කුමාරසිරි මහතා – මුදල් අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
07. කේ. වී. පී. රංජිත් ද සිල්වා මහතා – වරාය සහ නාවුක කටයුතු අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා.
08. රෙයාර් අද්මිරාල් එල්. ඩී. ධර්මප්‍රිය – නාවික හමුදාපති නියෝජනය කිරීම සඳහා.
09. බී. ජේ. එෆ්. මෙන්ඩිස් මහතා – මැණුම්පති.
10. ජ. එම් එන් විජේරත්න මෙනෙවිය – විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
11. ජී. පියසේන මහතා – අධ්‍යක්ෂ ජනරාල්, ධීවර දෙපාර්තමේන්තුව.
12. ආචාර්ය එස්. සී. ජයමාන්න මිය – අධ්‍යක්ෂ ජනරාල් / නාරා (අප්‍රේල් මස අවසානය දක්වා).
13. ආචාර්ය කේ. ඩී. පී. හේමලාල් – අධ්‍යක්ෂ ජනරාල් / නාරා (සැප්තැම්බර් මස අවසානය දක්වා)

නැවත 2005 සැප්තැම්බර් 01 දින සිට දෙසැම්බර් 20 දක්වා තෝරා පත් කරන ලද සාමාජිකයින් 05 දෙනෙකුගෙන් සහ නිලය අනුව පත්වූ සාමාජිකයින් 08 දෙනෙකුගෙන් සමන්විත පාලක මණ්ඩලයකින් සමන්විත විය.

පත් කරන ලද සාමාජිකයින් :

01. ඇලෝයි ඩබ්. ප්‍රනාන්දු මහතා (සභාපති)
02. සුරේන් ප්‍රනාන්දු මහතා
03. ඩබ්. ජෝන් මාකස් ප්‍රනාන්දු මහතා
04. මොහොමඩ් නිසාර් මොහොමඩ් නසාම් මහතා
05. ආචාර්ය ගාමිණී වීරසිංහ

නිලය අනුව පත්වූ සාමාජිකයින්:

06. ජ. ජිනදාස මහතා – ලේකම් / ධීවර අමාත්‍යාංශය.
07. ජ. කුමාරසිරි මහතා – මුදල් අමාත්‍යාංශ ලේකම් නියෝජනය කිරීම සඳහා.
08. කේ.වී. පී. රංජිත් ද සිල්වා මහතා – වරාය සහ නාවුක කටයුතු අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා.
09. රෙයාර් අද්මිරාල් එල්. ඩී. ධර්මප්‍රිය – නාවුක හමුදාපති නියෝජනය කිරීම සඳහා
10. බී. ජේ. එෆ්. මෙන්ඩිස් මහතා – මැණුම්පති.
11. ජ. එම්. එන්. විජේරත්න මෙනෙවිය – විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
12. ජී. පියසේන මහතා – අධ්‍යක්ෂ ජනරාල්, ධීවර දෙපාර්තමේන්තුව.
13. ආචාර්ය චම්පා අමරසිරි මිය – අධ්‍යක්ෂ ජනරාල් / නාරා.

නැවත දෙසැම්බර් 20 සිට තෝරා පත් කරන ලද සාමාජිකයින් 07 දෙනෙකුගෙන් හා නිලය අනුව පත්වූ සාමාජිකයින් 08 දෙනෙකුගෙන් පාලක මණ්ඩලය සමන්විත විය.

**පත් කරන ලද සාමාජිකයින් :**

01. කේ. හපුතන්ත්‍රි මහතා (සභාපති)
02. ජේ. එන්. ලියනගේ මහතා.
03. ආචාර්ය පී. එස්. ආර්. අමරතුංග.
04. එම්. එන්. ඩී. පීරිස් මහතා.
05. ආචාර්ය එස්. එච්. කේ. සමරවීර මහතා.
06. ආර්. ඩී. ඩී. ප්‍රදීප් සංජීව මහතා.
07. ප්‍රියන්ත රොෂාන් මොරපිටිය මහතා.

**නිලය අනුව පත්වූ සාමාජිකයින් :**

08. ඒ. හෙට්ටිආරච්චි මහතා - ධීවර අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
09. ඒ. කුමාරසිරි මහතා - මුදල් අමාත්‍යාංශ ලේකම් නියෝජනය කිරීම සඳහා.
10. කේ. ටී. පී. රංජිත් ද සිල්වා මහතා - වරාය සහ නාවුක කටයුතු අමාත්‍යාංශය නියෝජනය කිරීම සඳහා.
11. රෙයාර් අද්මිරාල් ටී. එස්. පී. සමරසිංහ - නාවුක හමුදාපති නියෝජනය කිරීම සඳහා.
10. බී. ජේ. එෆ්. මෙන්ඩිස් මහතා - මැණුම්පති.
11. ඒ. එම්. එන්. විජේරත්න මෙනෙවිය - විද්‍යාත්මක කටයුතු අමාත්‍යාංශයේ ලේකම් නියෝජනය කිරීම සඳහා.
12. පී. පියසේන මහතා - අධ්‍යක්ෂ ජනරාල්, ධීවර දෙපාර්තමේන්තුව.
13. යොෂාන් සද්ධාසේන මහතා - අධ්‍යක්ෂ ජනරාල් / නාරා.

## 3. සංවිධානය

ආචාර්ය කේ.කේ.සී.කේ.පෙරේරා මහතා සැප්තැම්බර් 01 වනදා දක්වා සභාපතිවරයා ලෙස කටයුතු කල අතර, ඇලෝයි ඩබ්. ප්‍රනාන්දු මහතා සැප්තැම්බර් 01 වන දින සිට දෙසැම්බර් 20 දක්වා සභාපතිවරයා ලෙස පත්විය. කේ.හපුතන්ත්‍රි මහතා 2005 දෙසැම්බර් 21 දින සිට සභාපතිවරයා ලෙස පත්විය. ආචාර්ය සේපාලිකා ජයමාන්න මහත්මිය මැයි 02 දින දක්වා අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කල අතර, පිළිවෙලින් ආචාර්ය කේ. ඩී. පී. හේමලාල් මහතා සැප්තැම්බර් 01 දක්වා ද, ආචාර්ය චම්පා අමරසිරි මහත්මිය දෙසැම්බර් 20 දක්වා ද අධ්‍යක්ෂ ජනරාල් තනතුරේ කටයුතු කළහ. යොෂාන් සද්ධාසේන මහතා 2005 දෙසැම්බර් 21 සිට අධ්‍යක්ෂ ජනරාල් තනතුරට පත්විය.

නියෝජිතායතනය, පරිසර අධ්‍යයන අංශය, ධීවර තාක්ෂණ අංශය, ජල ශාස්ත්‍රීය කාර්යාලය, තොරතුරු තාක්ෂණ අංශය, අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීව වගා අංශය, පුස්තකාල හා තොරතුරු අංශය, සමුද්‍ර ජීව සම්පත් අංශය, සාගර විද්‍යා අංශය, සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය, පසු අස්වනු තාක්ෂණ අංශය, ලෙස විද්‍යාත්මක හා තාක්ෂණික අංශ 08 කින් ක්‍රියාත්මක වන අතර, ඒ සඳහා පාලන අංශය, සේවා හා මෙහෙයුම් අංශය සහ මූල්‍ය අංශය උපකාරක අංශ වේ.

## 4. අංශ ප්‍රධානීන්

සමාලෝචිත වර්ෂය තුල පහත දැක්වෙන නිලධාරින් අංශ ප්‍රධානීන් ලෙස කටයුතු කරන ලදී.

**පර්යේෂණ අංශ.**

| | |
|---|---|
| එන්. සුරේෂ් කුමාර් මහතා | පරිසර අධ්‍යයන අංශය. |
| එන්. බී. පී. පුන්‍යදේව මහතා | ධීවර තාක්ෂණ අංශය. |
| එම්. ඒ. ආරියවංශ මහතා | ජලශාස්ත්‍රීය කාර්යාලය. |

| | |
|---|---|
| ඒ. බී. ඒ. කේ. ගුණරත්න මහතා | තොරතුරු තාක්ෂණ අංශය. |
| එම්. එච්. එස්. ආරියරත්න මෙනෙවිය | අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීව වගා අංශය. |
| වී. රූපසිංහ මිය (වැඩ බලන) | පුස්තකාල හා තොරතුරු අංශය. |
| ආචාර්ය චම්පා අමරසිරි මිය | සමුද්‍ර ජීව සම්පත් අංශය. |
| ආචාර්ය කේ. අරුලානන්තන් | සාගර විද්‍යා අංශය. |
| ආචාර්ය ආර්. එදිරිසිංහ මහතා | පසු අස්වනු තාක්‍ෂණ අංශය. |
| ආචාර්ය ආර්. මල්දෙනිය මිය | සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය. |

**උපකාරක අංශ**

යූ. ඒ. සිරිසේන මහතා / සුමේධ ජයසිංහ මහතා – පරිපාලන අංශය.
එම්. ඩී. සේනාරත්න මහතා – මූල්‍ය අංශය.
පී. ඕ. එල්. පී. බණ්ඩාර මහතා – සේවා සහ මෙහෙයුම් අංශය. (2006/03/31 සිට)

## 5. බඳවා ගැනීම්

2005 වර්ෂය තුළදී පහත සඳහන් බඳවා ගැනීම් සිදු කරන ලදී.

| අංකය | නම හා තනතුර | පත්කළ දිනය |
|---|---|---|
| 01 | සුමේධ ජයසිංහ මහතා / පරිපාලන නිලධාරි | 2005/03/01 |
| 02 | පී.ඕ.එල්.පී.බණ්ඩාර මහතා / නඩත්තු ඉංජිනේරු (කොන්ත්‍රාත් පදනම) | 2005/03/01 |
| 03 | ආනන්ද අමරසිංහ මහතා – මිලදී ගැනීමේ නිලධාරි / සැපයුම් නිලධාරි | 2005/04/07 |
| 04 | ආර්.එල්.ඩී.ලියනගේ මෙනෙවිය / රසායනාගාර සහායක | 2005/07/01 |
| 05 | එස්.මුරලිදරන් මහතා / සනීපාරක්‍ෂක කම්කරු | 2005/07/01 |
| 06 | කේ.ඩබ්.ඉන්දික මහතා / රසායනාගාර සහායක | 2005/07/01 |
| 07 | එච්.එම්.සී.හේමමාලි මෙනෙවිය / ගිණුම් ලිපිකරු | 2005/07/01 |
| 08 | සී.එච්.ජයසිංහ මිය – අධ්‍යක්‍ෂ ජනරාල් / පුද්ගල සහකාර (කොන්ත්‍රාත් පදනම මත) | 2005/09/26 |
| 09 | එස්.සසිතරන් මහතා / ව්‍යාපෘති සහකාර/පී.අයි.එස්./ආර්.එස්. | 2005/10/03 |
| 10 | ඩබ්.ඩී.එන්.වික්‍රමාරච්චි මහතා / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 11 | පී.ඩබ්.එස්.එන්.ජයරත්න මෙනෙවිය – ව්‍යාපෘති සහකාර / දත්ත පද්ධති | 2005/10/03 |
| 12 | ඒ.එම්.එම්.සෙනෙවිරත්න මිය – ව්‍යාපෘති සහකාර / කළමනාකාර | 2005/10/03 |
| 13 | ඩී.එන්.ඒ.රත්මලුගල මිය / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 14 | වයි.වයි.කේ. ද සිල්වා මහතා / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 15 | කේ.එස්.ඩී.චින්තක මහතා / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 16 | ඩබ්.එන්.සී.ප්‍රියදර්ශනී මෙනෙවිය / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 17 | ඩී.ඩී.පී.එල්.දහනායක මහතා / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 18 | ඒ.ඒ.සී.අමරතුංග මහතා / පර්යේෂණ නිලධාරි | 2005/10/03 |
| 19 | එන්.අයි.කාලසිංහ මහතා – ව්‍යාපෘති සහකාර /කළමනාකාර | 2005/10/03 |
| 20 | වයි.එම්.ආර්.එන්.කුමාරි මිය / ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 2005/10/03 |

6. ස්ථාවර සේවයෙන් ඉවත්වීම් - 2005

| නම | තනතුර | ක්‍රියාත්මක දිනය | වෙනත් |
|---|---|---|---|
| වයි.සමරරත්න මහතා | ගණකාධිකාරී | 2005/01/10 | මරණයට පත්විය. |
| ආර්.පී.ගුණදාස මහතා | ගබඩා භාරකරු | 2005/02/15 | විශ්‍රාම ගැනීම |
| ආනන්ද අමරසිංහ මහතා | පර්යේෂණ සහකාර | 2005/04/07 | අස්වීම |
| එන්.එච්.දසනායක මහතා | පර්යේෂණ නිලධාරී | 2005/04/04 | සේවය අතහැර යාම |
| එම්.පත්තප්පෙරුම මෙනෙවිය | කම්කරු | 2005/06/01 | විශ්‍රාම ගැනීම |
| වසන්ති සමරසේකර මෙනෙවිය | ලිපිකරු/කොන්ත්‍රාත් | 2005/06/01 | අස්වීම |
| එස්.එස්.ජයසේකර මිය | පර්යේෂණ සහකාර | 2005/06/03 | අස්වීම |
| කේ.එච්.රසික චන්දිමාල් මහතා | සංචාරක බංගලා භාරකරු | 2005/07/01 | සේවය අතහැර යාම |
| යූ.ජී.සිරිසේන මහතා | පරිපාලන නිලධාරී | 2005/07/01 | විශ්‍රාම ගැනීම |
| සී.එච්.ජයසිංහ මිය | පුද්ගලික සහකාර / අධ්‍යක්ෂ ජනරාල් | 2005/07/31 | විශ්‍රාම ගැනීම |
| කේ.පී.පී.වික්‍රමසිංහ මහතා | ආදර්ශකරු | 2005/10/18 | සේවය අතහැර යාම |
| ඩබ්.එච්.ආර්.කේ.දේවින්ද මහතා | ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 2005/11/01 | අස්වීම |
| වයි.වයි.කේ.ද සිල්වා මහතා | පර්යේෂණ නිලධාරී | 2005/12/13 | අස්වීම |
| එම්.වී.ප්‍රේමසිරි මහතා | රියදුරු | 2005/12/09 | අස්වීම |
| ඕ.ආර්.වී.ජ්.ඩබ්.ඩී.ඔබ්ටිපාත මහතා | ජලශාස්ත්‍රීය මිනින්දෝරු | | අස්වීම |
| එම්.කීර්තිසිංහ මහතා | ජලශාස්ත්‍රීය මිනින්දෝරු | | සේවය අතහැර යාම |

7. 2005 වසරේදී උසස්වීම්.

| නම | උසස්වීම ක්‍රියාත්මක දිනය | උසස්වීම ලැබූ ශ්‍රේණිය |
|---|---|---|
| යූ.එන්.එම්.ප්‍රනාන්දු මහතා / රියදුරු | 2005/03/09 | VI |
| ඩී.එම්.ප්‍රේමරත්න මහතා / රියදුරු | 2005/09/28 | VII |
| තරංග බුද්ධික මහතා / ලිපිකරු | 2005/06/20 | VII |
| පී.ආර්.එස්.රූපිකා මිය / පර්යේෂණ සහකාර | 2005/06/22 | VI |
| ටී.එස්.දහනායක මෙනෙවිය / පර්යේෂණ සහකාර | 2005/06/22 | VI |
| ආර්.එම්.එස්.සී.ද සිල්වා මෙනෙවිය / වචන සැකසුම් ක්‍රියාකාරිණී | 2005/08/26 | VI |
| අරුණ ප්‍රභාත් මහතා / ආදර්ශකරු | 2005/08/31 | VI |
| ඩබ්.ඩී.තිලකරත්න මහතා / විදුලි කාර්මික | 2005/09/01 | VII |
| කේ.පී.කේ.රුවන් මහතා / පර්යේෂණ සහකාර | 2005/12/06 | VI |
| ජේ.පී.ලොකුගමගේ මහතා / පර්යේෂණ සහකාර | 2005/12/06 | VI |
| ඩබ්.ඩබ්.ජ්.බොතේජු මහතා / කම්කරු | 2005/11/22 | IX |

(2005/08/26 දින සිට ක්‍රියාත්මකයි.)

8. **2005/12/31 දින වනවිට නාරා ආයතනයේ පිරවීමට ඉතිරි වූ පුරප්පාඩු.**

| <u>තනතුර</u> | <u>සංඛ්‍යාව</u> |
|---|---|
| පාලක මණ්ඩල ලේකම් / නීති නිලධාරි | 01 |
| ගණකාධිකාරි | 01 |
| පුහුණු කම්කරු | 01 |
| ගබඩා භාරකරු | 01 |
| විගණන ලිපිකරු | 01 |
| භාෂා පරිවර්තක | 01 |
| ප්‍රධාන පරිපාලන නිලධාරි | 01 |
| පරිපාලන සහකාර | 01 |
| සාමාන්‍ය ලිපිකරු | 01 |
| වචන සැකසුම් ක්‍රියාකරු | 01 |
| පර්යේෂණ නිලධාරි | 11 |
| පර්යේෂණ සහකාර | 05 |
| ආදර්ශකරු | 01 |
| රසායනාගාර සහායක | 01 |
| කම්කරු | 07 |
| වැඩ ලිපිකරු | 01 |
| උපකරණ තාක්ෂණ ශිල්පී | 01 |
| මේසන් | 01 |
| පැස්සුම්කරු | 01 |
| විදුලි කාර්මික | 01 |
| සනීපාරක්ෂක කම්කරු | 02 |
| බංගලා භාරකරු | 01 |
| රියදුරු | 05 |
| ආර්ථික විද්‍යාඥ | 01 |
| පර්යේෂණ නිලධාරි (සමාජ විද්‍යාඥ) | 01 |
| සහායක බංගලා භාරකරු | 01 |
| ඩෙක්හැන්ඩ් | 01 |
| නැව් | 02 |
| බොට්ස්වේන් | 01 |
| ජ්. ආර්. ජ්. | 02 |
| අරක්කැමි / "සමුදුමාරු" | 01 |
| යාත්‍රාපති | 01 |
| ප්‍රධාන නිලධාරි | 01 |
| නියෝජ්‍ය අධ්‍යක්ෂ / ජලශාස්ත්‍රඥ | 01 |
| ප්‍රධාන ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 01 |
| ජලශාස්ත්‍රීය මිනින්දෝරු | 04 |
| මිනින්දෝරු | 02 |
| ප්‍රධාන සිතියම් විද්‍යාඥ | 01 |
| නියෝජ්‍ය ප්‍රධාන සිතියම් විද්‍යාඥ | 01 |
| සිතියම් විද්‍යාඥ | 01 |
| ක්‍රම විශ්ලේෂක | 01 |
| කෙටුම්පත්කරු | 01 |
| ක්‍රම විශ්ලේෂක / සම්පාදක | 02 |
| ජ්. ඩී. පී. සහකාර | 01 |
| විදුලි ඉංජිනේරු | 01 |
| තාක්ෂණික සහකාර (යාන්ත්‍රික) | 01 |
| යාත්‍රාපති (සයුරි) | 01 |
| කොක්ස්වේන් | 01 |
| මුරකරු | 01 |
| අමතර පර්යේෂණ නිලධාරි පුරප්පාඩු ස්ථාපන (පුහුණු උපාධිධාරි) | 05 |

9. **විනය පරීක්ෂණ හා උසාවි නඩු :**
පවත්වන ලද විනය පරීක්ෂණ වල විස්තර පහත දැක්වේ.

9. 1 **කම්කරු උසාවියේ නඩු.**

ජේ.කේ.බාලපටබැඳි මයා – විභාග වෙමින් පවතී.

9. 2 **දිස්ත්‍රික් උසාවියේ නඩු.**

කඩොල්කැලේ නඩු අංක 6137/L – විභාග වෙමින් පවතී.

9. 3 **ඉහල උසාවියේ නඩු.**

ඩී.ඒ.කරුණාසේන මහතා – විභාග වෙමින් පවතී.

9. 4 **විනය පරීක්ෂණ.**

(1) **පුස්තකාලයාධිපති / ඔ.කේ.පී.නන්දන මයා** – විනය පරීක්ෂණය අවසන්වී ඇත. ඔ.කේ.පී.නන්දන මයා 06/12/2004 දින සිට නැවත සේවයේ පිහිටුවීමට පාලක මණ්ඩල අනුමැතිය දෙන ලදී. නැවත පරීක්ෂණයක් පවත්වන ලෙස ඔ.කේ.පී.නන්දන මයා ඉල්ලීමක් කර ඇත.

(2) **ජේ.බී.ඒ.මාගම්මන මයා සහ පී.ලමාහේවා මයා** – විභාග වෙමින් පවතී.

(3) **ආචාර්ය ආර්.ආර්.පී.මල්දෙනිය මිය**
**එච්.එම්.වසන්ත බණ්ඩාර මහතා**
**ඩබ්.පී.අනුර මහතා**
**නීල් සමන්ත ගුණතිලක මහතා** } විභාග වෙමින් පවතී.

(4) ඩී.ඒ.කරුණාසේන මහතා – විභාග වෙමින් පවතී.

10. **සුභසාධන කටයුතු.**

කාර්යාල ප්‍රවාහන පහසුකම් අඛණ්ඩව ක්‍රියාත්මක කෙරිණි.

11. **2005 වසර තුල දේශීය සම්මන්ත්‍රණ, වැඩමුළු, පුහුණුවීම් සඳහා සහභාගිත්වය.**

| නම සහ තනතුර | පුහුණුව/වැඩමුළු/සම්මන්ත්‍රණ | ආයතනය |
|---|---|---|
| එල්.පී.එන්.පෙරේරා මිය<br>ගණකාධිකාරී | වෘත්තිකයන් සඳහා වූ ඉංග්‍රීසි ඩිප්ලෝමාව. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය. |
| එම්.එම්.අලවතුගොඩ මිය<br>දුරකථන ක්‍රියාකරු/පිලිගැනීමේ නිලධාරී | සන්නිවේදනය සඳහා වූ ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව. | ජාතික ව්‍යාපාර හා කළමනාකරණ ආයතනය. |
| එන්.සුරේෂ් කුමාර් මහතා<br>පර්යේෂණ නිලධාරී | ආපදා කළමනාකරණය සඳහා වූ සම්මන්ත්‍රණය. | වනිතා කටයුතු හා සුභසාධන අමාත්‍යාංශය. |
| එස්.ඒ.එම්.අස්මි මහතා<br>පර්යේෂණ නිලධාරී | – එම – | – එම – |
| ආචාර්ය චම්පා අමරසිරි මිය<br>පර්යේෂණ නිලධාරී | අන්තර්ජාතික මිළදී ගැනීම් | |
| පී.ඕ.එල්.පී.බණ්ඩාර මයා<br>යාන්ත්‍රික ඉංජිනේරු | ටෙන්ඩර් ඇගයීම. | – එම – |
| ඩී.හේරත් මිය<br>පර්යේෂණ නිලධාරී | බිනාසියා – ශ්‍රී ලංකා ජාතික වැඩමුළුව | ජාතික විද්‍යා පදනම |

| | | |
|---|---|---|
| පී.පී.එම්.හීනටිගල මිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| එන්.සුරේෂ් කුමාර් මයා<br>පර්යේෂණ නිලධාරි | විද්‍යාත්මක දත්ත ඇගයීම් හා ක්‍රියාත්මක කිරීම් පිළිබඳවැඩමුළුව | කැලණිය විශ්ව විද්‍යාලය. |
| ඩී.ඒ.අතුකෝරළ මයා | - එම - | - එම - |
| ආචාර්ය චම්පා අමරසිරි මිය<br>පර්යේෂණ නිලධාරි | සුදුසු විනය කළමනාකරණය තුලින් මනුෂ්‍ය සම්පත් සංවර්ධනය කිරීම. | විනය කළමනාකරණ පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය. |
| ආචාර්ය එස්.සී.ජයමාන්න මිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| කේ.අරුලානන්තන් මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| ජේ.බී.ඒ.කේ.ගුණරත්න මයා<br>තොරතුරු නිලධාරි | - එම - | - එම - |
| ජේ .එස් .එල් .ඊ .කොරයා මිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| ජේ.ඩී.ඩබ්.ආර්.රාජපක්ෂ මිය<br>පර්යේෂණ නිලධාරි | ශ්‍රී ලංකාවේ සම්පත් සංරක්ෂණ හා කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව. | පේරාදෙණිය විශ්ව විද්‍යාලය |
| එම්.එච්.එස්.ආරියරත්න මෙනෙවිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| ආචාර්ය කේ.කපිල<br>සී.කේ.පෙරේරා<br>සභාපති | සැලසුම් ක්‍රියාත්මක කිරීමේ සහයෝගිතා වැඩමුළුව. | ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය. |
| ආචාර්ය කේ.ඩී.පී.හේමලාල්<br>අධ්‍යක්ෂ ජනරාල් | - එම - | - එම - |
| ආචාර්ය චම්පා අමරසිරි මිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| එන්.සුරේෂ් කුමාර් මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| එම්.ඩී.සේනාරත්න මයා<br>සහකාර ගණකාධිකාරි | වැඩසටහන් කරුවන් නොවන අය සඳහා වූ දත්ත පදනම් කළමනාකරණය | ජාතික ව්‍යාපාර කළමනාකාර ආයතනය |
| කේ.පී.එල්.අයිරාංගනී මිය<br>පොත් තබන්නා | මූලික ගණකාධිකරණය | රජයේ ගිණුම් හා මූල්‍ය ආයතනය |
| වී.කේ.පී.ජයසේන මිය<br>ලිපිකරු | පරිගණක සඳහා හැඳින්වීම පුහුණුවීම. | රජයේ ගිණුම් හා මූල්‍ය ආයතනය |
| එන්.බී.පී.පුන්‍යදේව මයා<br>පර්යේෂණ නිලධාරි | පර්යේෂණ යෝජනා ලිවීම ඉදිරිපත් කිරීමේ හා මුද්‍රණය පිළිබඳ වැඩමුළුව. | ශ්‍රී ලංකා උසස් විද්‍යාත්මක සංගමය |
| එච්.බී.ජයසිරි මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| එස්.යූ.පී.ජිනදාස මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| එම්.පී.අයි.එස්.පරාක්‍රම මිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| පී.පී.එම්.හීනටිගල මිය<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| ඩී.ඒ.අතුකෝරළ මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| පී.ඒ.ඩී.ඒ.කුමාර මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| කේ.ඩී.චින්තක මයා<br>පර්යේෂණ නිලධාරි | - එම - | - එම - |
| එම්.කේ.චන්ද්‍රානි මෙනෙවිය<br>වචන සැකසුම් ක්‍රියාකරු | අළුත් තරගකාරි සංවිධාන වලට මුහුණදීම සඳහා කාර්යාලීය සේවක සංවර්ධනය. | කාර්මික තාක්ෂණ කළමනාකාර පෞද්ගලික ආයතනය. |
| කේ.සී.ද සිල්වා මෙනෙවිය<br>වචන සැකසුම් ක්‍රියාකරු | - එම - | - එම - |

| | | |
|---|---|---|
| එල්.පී.එන්.පෙරේරා මිය<br>ගණකාධිකාරී | විනය ක්‍රියාකාරී මාර්ග පිළිබඳ පුහුණුව. | රජයේ ගිණුම් හා මූල්‍ය ආයතනය. |
| එච්.එම්.ප්‍රියන්ත මයා<br>අභ්‍යන්තර විගණක | වැඩසටහන් කරුවන් නොවන අය සඳහා වූ මූලික දත්ත කළමනාකරණය. | ජාතික ව්‍යාපාර හා කළමනාකරණ ආයතනය. |
| ආචාර්ය කේ.ඩී.පී.හේමලාල්<br>අධ්‍යක්ෂ ජනරාල් | සුදුසු විනය කළමනාකරණය තුළින් මනුෂ්‍ය සම්පත් සංවර්ධනය කිරීම | විනය කළමනාකරණ පිළිබඳ අධ්‍යයන මධ්‍යස්ථානය. |
| වී.කේ.පී.ජයසේන මිය<br>ලිපිකරු | වින්ඩෝස් පදනම් මත යෙදුම් පිළිබඳ පුහුණුව. | රජයේ ගිණුම් හා මූල්‍ය ආයතනය. |
| එස්.ජයසිංහ මයා<br>පරිපාලන නිලධාරී<br>ජී.ඔ.එල්.පී.බණ්ඩාර මයා<br>කාර්මික ඉංජිනේරු | ජපන් "එස් 5" සංකල්පය පිළිබඳ ප්‍රායෝගික පුහුණුව. | - එම - |

## 12. විදේශ ගමන් - 2005

| කාලය | රට | කාර්යය | අරමුදල් | වියදම | නම |
|---|---|---|---|---|---|
| 03-04/01/05 | ඉන්දියාව | සේතු සමුදුම් ව්‍යාපෘතිය පිළිබඳ විශේෂඥ කණ්ඩායම් හමුව. | විදේශ කටයුතු GOSL | - | ආචාර්ය කේ. කපිල සී.කේ.පෙරේරා සභාපති/නාරා |
| 03-08/03/05 | ප්‍රංශය | යුනෙස්කෝ මූලස්ථානයේ පැවති ගෝලීය රාමුව තුළ ඉන්දියානු සාගරයේ සුනාමි අනතුරු හැඟවීමේ හා ලිහිල් පද්ධති සංවර්ධනය කිරීම පිළිබඳ ජාත්‍යන්තර සම්බන්ධතා රැස්වීම. | නාරා / GOSL | 23,630,000 | - එම - |
| 08-12/03/05 | ඉතාලිය | ලෝක ආහාර හා කෘෂි කර්මාන්ත සංවිධානයට සම්බන්ධ ධීවර අමාත්‍යවරුන්ගේ 26 වැනි කමිටු සැසිය සඳහා. | - එම - | | |
| 14-16/04/05 | සීෂෙල්ස් | ඉන්දියානු සාගරයේ සුනාමි අනතුරු හැඟවීම් හා ලිහිල් පද්ධතිය උසස් කිරීමේ රැස්වීම. | - එම - | 17,622,100 (17,159,000 ) ආපසු ගෙවන ලදී. | |
| 30/06/05 | ප්‍රංශය | යුනෙස්කෝ සංවිධානයේ පැවැති රජයන් අතර සාගර විද්‍යා කොමිසම ඇති කිරීමෙහිලා 23 වැනි සැසිය. | - එම - | 734,171.98 (409,159.53 ) ආපසු ගෙවන ලදී. | |
| 03-04/01/05 | ඉන්දියාව | සේතු සමුදුම් ව්‍යාපෘතියේ විශේෂඥ උපදේශක රැස්වීම. | විදේශ කටයුතු GOSL | 11,526.50 | ආචාර්ය කේ.අරුලානන්තන් පර්යේෂණ නිලධාරී/අංශ ප්‍රධානී - සාගර විද්‍යා අංශය. |
| 14-18/02/05 | ඔස්ට්‍රේලියාව | ඉන්දියානු සාගර සමුද්‍ර පරිසර සමුළුව | අයොමැක් හා ජාතික විද්‍යා පදනම | - | ආචාර්ය ජ්.එම්.එස්.විජේරත්න පර්යේෂණ නිලධාරී/සාගර විද්‍යා |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | | | අංශය. |
| 14-18/02/05 | ඕස්ට්‍රේලියාව | ඉන්දියානු සාගර සමුද්‍ර පරිසර සමුළුව | අයොමැක් හා ජාතික විද්‍යා පදනම | - | ආචාර්ය කේ.අරුලානන්තන් පර්යේෂණ නිලධාරී/අංශ ප්‍රධානී-සාගර විද්‍යා අංශය. |
| 27/01/2005 සිට 01/02/2005 | සවුදි අරාබියාව | උතුරු ඉන්දියානු සාගර රටවල් හි ජලමාන විද්‍යාව පිළිබඳ 5 වැනි කලාපීය කමිටු රැස්වීම. | එච්.ඕ./බ්‍රිතාන්‍ය | - | එම්.ජේ.ආරියවංශ මයා / ජලශාස්ත්‍රඥ |
| 11-15/04/05 | මොනැකෝ | 3 වැනි විශේෂ ජාත්‍යන්තර ජලශාස්ත්‍රීය සමුළුව. | ඒකාබද්ධ සමුද්‍ර සහ ජලශාස්ත්‍රීය ආයතනය / ජර්මනිය | 18,764.00 | |
| 25-29/04/05 | ඉන්දියාව | ඇන්ටාටිකාව පිළිබඳ ජාතික මධ්‍යස්ථානය හා ගෝවා හි සාගර පර්යේෂණ පිළිබඳ 5 වැනි වැඩමුළුව. | ඩියකොම් ව්‍යාපෘතිය | - | එස්.යූ.පී.ජිනදාස මයා පර්යේෂණ නිලධාරී/සාගර විද්‍යා අංශය |
| 20/04/2005 සිට 19/04/2006 | තායිලන්තය | පුහුණු හා පර්යේෂණ වැඩසටහන. | ඒ. අයි. ටී. / තායිලන්තය | - | ජේ.කේ.රාජපක්ෂ මයා පර්යේෂණ නිලධාරී/ සාගර විද්‍යා අංශය |
| 27/06/2005 සිට 28/01/2006 | ඉන්දියාව | 8 වැනි ජලශාස්ත්‍රීය පාඨමාලාව. | ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය / ඉන්දියාව | | ඒ.ආර්.ඒ.ගෆූර් මයා ජලශාස්ත්‍රීය මිනින්දෝරු / ජලශාස්ත්‍රීය කාර්යාලය. |
| 30/08/2005 සිට 28/02/2006 | අයිස්ලන්තය | සමුද්‍ර හා අභ්‍යන්තර ජලජ සම්පත් අධීක්ෂණය හා තක්සේරු කිරීම. | අයිස්ලන්ත රාජ්‍යය | - | ඩී.සී.ටී.දිසානායක මිය පර්යේෂණ නිලධාරිණී/සමුද්‍ර ජීව විද්‍යා අංශය. |
| 01/10/2005 සිට 30/09/2008 | ඉන්දියාව | ආචාර්ය උපාධිය සඳහා | කාප් | 9,420.70 | ඒ.ඩී.ඩබ්.රාජපක්ෂ මිය පර්යේෂණ නිලධාරිණී/ අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය. |
| 01/10/2005 සිට 30/09/2008 දක්වා | ඉන්දියාව | ආචාර්ය උපාධිය සඳහා | කාප් | 8,221.79 | එම්.පී.අයි.එස්.පරාක්‍රම මිය පර්යේෂණ නිලධාරිණී/ අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය |
| 01/10/2005 සිට 30/09/2008 දක්වා | ඉන්දියාව | ආචාර්ය උපාධිය සඳහා | කාප් | 8,221.79 | වී.පහලවත්තආරච්චි මිය පර්යේෂණ නිලධාරිණී/ අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශය. |
| 05/09/2005 සිට 07/09/2005 | එංගලන්තය | අවසාන රැස්වීම. MAMAS ව්‍යාපෘතිය. | MAMAS ව්‍යාපෘතිය | 103,728.57 | එන්.සුරේෂ් කුමාර් මයා පර්යේෂණ නිලධාරී/ පරිසර අධ්‍යයන අංශය. |
| 08/08/2005 සිට 13/08/2005 | ඉන්දුනීසියාව | IOGOOS වැඩමුළුව හා 3 වැනි වාර්ෂික රැස්වීම. | සංවිධායක කමිටුව | 58,534.00 | ආචාර්ය ටී.කේ.ඩී.තෙන්නකෝන් පර්යේෂණ නිලධාරී/ සාගර විද්‍යා අංශය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| 23/08/2005 සිට 12/09/2005 | සිංගප්පූරුව | මුහුදු ආහාර ආරක්ෂක කළමනාකරණය පිළිබඳ පුහුණුව. | ජයිකා | - | එම්.පී.අයි.යූ.කාරියවසම් මිය පර්යේෂණ නිලධාරී/ පසු අස්වනු තාක්ෂණ අංශය. |
| 05/09/2005 සිට 07/09/2005 | තායිලන්තය | BIMSTEC තාක්ෂණික රැස්වීමට සහභාගි වීම. | ශ්‍රී ලංකා රජය | - | ආචාර්ය චම්පා අමරසිරි මිය පර්යේෂණ නිලධාරී/ අංශ ප්‍රධානී- සමුද්‍ර ජීව විද්‍යා අංශය. |
| 22/09/2005 සිට 31/08/2005 | පිලිපීනය | වැඩමුළුව /කොරල්පර කළමනාකරණය ප්‍රජාව මූලික වෙරළබඩ කළමනාකරණ අධ්‍යයන චාරිකාව. | වෙරළබඩ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | - | පී.ඒ.ඩී.ඒ.කුමාර මයා / පර්යේෂණ නිලධාරී අභ්‍යන්තර ජලජීවී වගා අංශය. |
| 22/09/2005 සිට 31/08/2005 | පිලිපීනය | වැඩමුළුව /කොරල්පර කළමනාකරණය ප්‍රජාව මූලික වෙරළබඩ කළමනාකරණ අධ්‍යයන චාරිකාව. | වෙරළබඩ සම්පත් කළමනාකණ ව්‍යාපෘතිය | - | යූ.එස්.පී.කේ.ලියනගේ මයා / පර්යේෂණ නිලධාරී සමුද්‍ර ජීව විද්‍යා අංශය. |
| 10/10/2005 සිට 14/10/2005 | තායිලන්තය | කෙටිකාලීන පුහුණුව වෙරළබඩ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ධීවර සම්පත් ප්‍රතිජීවක අඩු කිරීම නිර්ණය කිරීම. | වෙරළබඩ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය | - | ජේ.එම්.චන්ද්‍රිකා පර්යේෂණ සහකාර/පසු අස්වනු තාක්ෂණික අංශය. |
| 10/10/2005 සිට 14/10/2005 | තායිලන්තය | කෙටිකාලීන පුහුණුව වෙරළබඩ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය යටතේ ධීවර සම්පත් ප්‍රතිජීවක අඩු කිරීම නිර්ණය කිරීම. | වෙරළබඩ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය. | - | ටී.එස්.දසනායක මෙනෙවිය පර්යේෂණ සහකාර/පසු අස්වනු තාක්ෂණ අංශය |
| 11/09/2005 සිට 28/10/2005 | තායිලන්තය | උසස් ජලජීවී වගාව පිළිබඳ වැඩසටහන | TICA සහ JICA | - | පී.පී.එම්.හීනටිගල මිය පර්යේෂණ නිලධාරී / අභ්‍යන්තර ජලජීවී වගා අංශය |
| 05/09/2005 සිට 17/09/2005 | ජර්මනිය | උදම් මාපක පුහුණුව | ජර්මන් රජය | - | ආචාර්ය ආර්.එම්.එස්.විජේරත්න පර්යේෂණ නිලධාරී සාගර විද්‍යා අංශය. |
| 05/09/2005 සිට 17/09/2005 | ජර්මනිය | උදම් මාපක පුහුණුව | ජර්මන් රජය | - | කේ.පී.පී.වික්‍රමසිංහ මයා ආදර්ශකරු සාගර විද්‍යා අංශය. |
| 18/12/2005 සිට 25/12/2005 | ඉන්දියාව | සේතු සමුද්‍රම් නැව් මාර්ග ව්‍යාපෘතියේ උපදේශක සමූහයේ සහභාගිත්වය. | විදේශ කටයුතු අමාත්‍යාංශය. | - | ආචාර්ය පී.ඒ.ඒ.ටී.ජයවර්ධන මයා පර්යේෂණ නිලධාරී / සමුද්‍ර ජීව විද්‍යා අංශය. |

# පරිසර අධ්‍යයන අංශය

## අංශ ප්‍රධානි : එන්.සුරේෂ් කුමාර් මහතා

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

ජල දූෂණය සම්බන්ධ අධ්‍යයන සහ ජලජ පරිසරය ආශ්‍රිත පාරිසරික ගැටළු සම්බන්ධ තක්සේරු කිරීමේ කටයුතු දියත් කිරීම මෙම අංශයේ ප්‍රධාන කාර්ය භාරයයි. මෙම කාලසීමාව තුළදී එක් පර්යේෂණ නිලධාරියකු නාරා ආයතනයේ නොවන පැවරුමක් සඳහා වැටුප් රහිත නිවාඩු පිට මුදා හැර ඇත. තවත් නිලධාරියෙකු ඕස්ට්‍රේලියාවේදී සිදු කෙරෙන ආචාර්ය උපාධි අධ්‍යයන කටයුතු වල අධ්‍යයන නිවාඩු ලබා නියැලී සිටින අතර, 2005 අප්‍රේල් දක්වා ආපසු වාර්තා කර නැත. කෙසේ වුවත් උපාධි පුහුණු වැඩසටහන යටතේ 2005 අප්‍රේල් මස උපාධිධාරීන් දෙදෙනෙකු අංශයට අනුයුක්ත කර තිබූ අතර, 2005 ඔක්තෝබර් මසදී ඔවුන් ස්ථිර සේවයට එකතු කරන ලදී. අංශයේ කාර්ය මණ්ඩලය පර්යේෂණ සහකාරවරුන් තිදෙනෙක්, එක් වචන සැකසුම් ක්‍රියාකරවන්නියක් සහ විද්‍යාගාර කම්කරුවන් තිදෙනෙකුගෙන් ද සමන්විත වේ.

අංශයේ වැඩ කටයුතු විවිධ අවශ්‍යතාවයන් සඳහා ව්‍යාපෘති 05 ක් යටතේ ක්‍රියාත්මක විය. යුරෝපීය කොමිසමේ ආධාර මත ක්‍රියාත්මක වූ සහයෝගිතා පර්යේෂණ ව්‍යාපෘතිය සුනාමි බලපෑම නිසා දීර්ඝ කරන ලද අතර, අවුරුද්ද පුරා ක්‍රියාත්මක විය. ඊට අමතරව අංශය විසින් උපදේශන පදනම මත අධ්‍යයනයන් තුනක් සිදු කෙරිණි. මෙම ව්‍යාපෘති වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලබාදෙන ලදී. ඊට අමතරව සුනාමිය ආශ්‍රිත මූලික අධ්‍යයනය සඳහා යොමුවූ අතර, සේතු සමුද්‍රම් ව්‍යාපෘතියේ මන්නාරම, පෝක් සමුද්‍ර සන්ධිය, බෙංගාල බොක්ක සම්බන්ධ පර්යේෂණ වලට විශාල දායකත්වයක් ලබාදුනි.

2004 දෙසැම්බර් මසදී සිදුවූ සුනාමි ව්‍යසනය නිසා බොහෝ උපකරණවලට හානි පැමිණුනි. මෙනිසා මෙම කාලය තුළදී පර්යේෂණ වලට සම්බන්ධ පරීක්ෂණ හා විශ්ලේෂණ වලදී බොහෝ අපහසුකම් වලට මුහුණදීමට සිදුවිය. සුනාමිය නිසා පරීක්ෂණාගාර වල මූලික පහසුකම් අතර මේස හා කබඩ් වැනි දෑ අබලන් වී ඇත. මෙම කාලය තුළදී එම උපකරණ අළුත්වැඩියා කිරීම සඳහා පියවර ගෙන ඇත.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. ජලජ පරිසරය ආශ්‍රිත පරිසර දූෂණයේ තත්වය | 1.1 පරිසර දූෂණය සහ ඇල්ගී ප්‍රජාවට විශේෂ අවධානය සහිතව තෝරාගත් අභ්‍යන්තර ජලජ පරිසරවල ජලයේ ගුණාත්මක තත්වය අධ්‍යයනය කිරීම. | 0.3 | එන්.සුරේෂ් කුමාර් | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| 2. විශේෂඥ සේවා, උපදේශක සේවා, පරීක්ෂණ සේවා, හදිසි අවස්ථා පිළිබඳ අධ්‍යයනය. | 2.1 පරීක්ෂණ සේවා. | 0.02 | එන්.සුරේෂ් කුමාර් | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| | 2.2 හදිසි අවස්ථා පිළිබඳ අධ්‍යයනය | 0.06 | - එම - | - එම - | - එම - |
| | 2.3 විශේෂඥ සහ උපදේශන සේවා. | 0.02 | - එම - | - එම - | - එම - |
| 3. අංශයේ පර්යේෂණාගාරය සඳහා බලයලත් පර්යේෂණාගාරයක තත්වය ලබා ගැනීම. | 3.1 පරිසර අධ්‍යයන අංශයේ පර්යේෂණාගාරයට බලයලත් තත්වය ලබා ගැනීම සඳහා එම පර්යේෂණාගාරය වැඩිදියුණු කිරීමේ වැඩ සටහන | 0.2 | එන්.සුරේෂ් කුමාර් | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| 4. උපකරණ මිලදී ගැනීමේ කටයුතු | 4.1 උපකරණ මිලදී ගැනීමේ කටයුතු. | 0.32 | එන්.සුරේෂ් කුමාර් | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| 5. බාහිර ආධාර මත ක්‍රියාත්මක ව්‍යාපෘතීන් | 5.1 බහුකාර්ය ජලජ පරිසර පද්ධති තුළ කෘෂි රසායන කළමනාකරණය (MAMAS) | යුරෝ 39,778 | එන්.සුරේෂ් කුමාර් | 2005 ජනවාරි | 2005 දෙසැ: |

**කාර්ය සාධනය :**

**ව්‍යාපෘතිය 1.1 : පරිසර දූෂණය සහ ඇල්ගී ප්‍රජාවට විශේෂ අවධානය සහිතව තෝරාගත් අභ්‍යන්තර ජලජ පරිසරවල ජලයේ ගුණාත්මක තත්වය අධ්‍යයනය කිරීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, තෝරාගත් වාරිමාර්ග තුනක් වන වලවේ ගඟ, කිරිඳි ඔය හා මැණික් ගඟේ වාර්තමානයේ මතුපිට ජලය දූෂණය වීමේ ප්‍රවණතාවය හා ඉඩම් භාවිතා වන ක්‍රමයන් අධ්‍යයනයයි.

මෙහිදී මෙම ගංගා පද්ධති වල මතුපිට ජලයේ ගුණාත්මක තත්වය හා ප්‍රවණතාවයන් පිළිබඳ පූර්ණ මූලික තොරතුරු රැස් කරන ලද අතර, ඉඩම් භාවිතය හා ඒවා අතර ඇති සම්බන්ධය පරීක්ෂා කරන ලදී. ආවේණික ගංගාශ්‍රිත මසුන් හට ඇති තර්ජන හඳුනා ගැනීමටද, බීමට හා නෑමට භාවිතා වන ජලය අපවිත්‍ර වීමට බලපාන කරුණු හඳුනා ගැනීමටද, මෙම තොරතුරු ඉවහල් කරගනු ලැබේ.

වාරිමාර්ග පද්ධති ආශ්‍රිත මතුපිට ජලයේ නියැදි එකතු කිරීම මාසිකව සිදු කරන ලදී. APHA ක්‍රමය භාවිතා කර ජලයේ වැදගත් තත්ව පරාමිතියන් විශ්ලේෂණය කරන ලදී. භූ ලක්ෂණ තත්වයන් හා ඉඩම් භාවිතය මූලික කොට ගෙන කිරිඳි ඔයේ ස්ථාන 16 කින්ද, මැණික් ගඟේ ස්ථාන 16 කින්ද, වලවේ ගඟේ ස්ථාන 17 කින්ද නියැදි එකතු කරන ලදී. භාවිතයට ගත්තා බිම් ප්‍රමාණයන් හි ක්ෂේත්‍ර කටයුතු සම්පූර්ණ කළ යුතුවූ නමුත් නිම කිරීමට හැකි වූයේ, වාරිමාර්ග පද්ධති 03 ක මූලික ක්ෂේත්‍ර කටයුතු පමණකි.

වලවේ ගඟේ නයිට්‍රේට්, නයිට්‍රයිට්, පොස්පේට් හා ඇමෝනියා අගයන් ලීටරයකට මිලිග්‍රෑම් ලෙස පිළිවෙලින් 0.112 – 0.740 ද, 0.012 – 0.099 ද, 0.015 – 0.068 ද, 0.010 – 0.296 ලෙසද දක්නට තිබුණි. කිරිඳි ඔයේ නයිට්‍රේට්, නයිට්‍රයිට්, පොස්පේට් හා ඇමෝනියා අගයන් ලීටරයකට මිලිග්‍රෑම් ලෙස පිළිවෙලින් 0.291 – 0.085 ද, 0.014 – 0.110 ද, 0.036 – 0.0681 හා 0.015 – 0.171 ලෙසද දක්නට තිබුණි. මැණික් ගඟේ වාර්තා වූයේ, නයිට්‍රේට්, නයිට්‍රයිට්, පොස්පේට් හා ඇමෝනියා අගයන් පිළිවෙලින් 0.171 – 0.676 ද, 0.009 – 0.074 ද, 0.02 – 0.084 හා 0.01 – 0.219 ලෙසද වේ. මෙම වාරි පද්ධති 3 හිම මූලික විශ්ලේෂණ වලදී ජල තත්ව පරාමිතිකයන්ගේ විශාල වැඩිවීමක් දක්නට නොලැබුණි. කෙසේ වුවත් ප්‍රධාන වශයෙන් ජීව විද්‍යාත්මක ඔක්සිජන් ද්‍රාව්‍යතාවය (BOD) හා අවලම්බිත සංඝටක (TSS) වලදී දූෂකයන් ඉහළ අගයන් අවුරුද්ද තුළදී දක්නට ලැබුණි ජීව විද්‍යාත්මක ඔක්සිජන් ද්‍රාව්‍යතාවය (BOD) අගයන් වලට ගඟේ ලීටරයට මිලිග්‍රෑම් 2.4 – 3.6 දක්වාද, කිරිඳි ඔයේ ලීටරයට මිලිග්‍රෑම් 5.8 – 8.81 දක්වා ද විය. මේවායේ අවලම්බිත සංඝටක (TSS) අගයන් වලට ගඟේ ලීටරයට මිලිග්‍රෑම් 6.02 සිට 36.82 දක්වාද, කිරිඳි ඔයේ ලීටරයට මිලිග්‍රෑම් 6.0 සිට 13.5 දක්වාද, මැණික් ගඟේ ලීටරයට මිලිග්‍රෑම් 5.5 සිට 23.09 දක්වා ද විය. කෙසේ වුවත් මෙම වාරි පද්ධති 3 හි බොහෝ ස්ථානවල පානීය ජලයේ ගුණාත්මක ප්‍රමිතීන් හා ලෝක සෞඛ්‍ය සංවිධානයේ ප්‍රමිතියන් වූ පොස්පේට් (2.0 ලීටරයට මිලිග්‍රෑම් 1 මුළු ඝනත්වය (250 ලීටරයට මිලිග්‍රෑම්) හා සන්නායකතාවය (250μ) අගයන්ට වඩා ඉක්මවූ අගයන් දකින්නට ලැබුණි. තාක්ෂණික වාර්තාව පිළියෙල වෙමින් පවතී.

ප්‍රගතිය : (%) භෞතික : 90 මූල්‍යමය : 107

**ව්‍යාපෘතිය 2.1 : පරීක්ෂණ සේවා.**

මෙම වැඩසටහන දියත් කෙරෙන්නේ අංශය සතු විශේෂඥ දැනුම සහ පරීක්ෂණාගාර පහසුකම් උපයෝගී කොට ආදායම් උපයා ගැනීම සඳහාය. මෙම වැඩසටහන ධීවර හා ජලජ සම්පත් ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ට සහ අනෙකුත් කර්මාන්තකරුවන්ට ඔවුන්ගේ කර්මාන්ත කටයුතු නිසි ලෙස සහ ධීවර හා ජලජ සම්පත් පනත, ජාතික පරිසර ආරක්ෂක පනත යන පනත් යටතේ ගැසට් නිවේදනය කොට ඇති නීති රීති වලට අනුකූලව සිදු කිරීමට උපකාරී වීම සඳහා දියත් කෙරේ. පානීය ජලයන්ගේ පරීක්ෂණ සමහරක් මෙයින් සිදු කෙරේ. සුනාමි ව්‍යසනයෙන් උපකරණ හා මෙවලම් වලට වූ හානිය නිසා පිටස්තර සේවාදායකයන් ලබාදුන් පරීක්ෂණ වල වාර්තා ලබාදීම ප්‍රමාද විය. තිබූ සම්පත් ප්‍රමාණය මත පරීක්ෂණ විධිමත් ලෙස යළි සිදුවිය. මූලික පරීක්ෂණ ක්‍රමයෙන් වැඩි දියුණු කරන ලදී.

ප්‍රගතිය : (%) භෞතික : 80 මූල්‍යමය : 60

**ව්‍යාපෘතිය 2.2 : හදිසි අධ්‍යයනයන්.**

**සුනාමි ව්‍යසනය නිසා බෙන්තොට හා කොග්ගල ප්‍රදේශයේ පරිසරයට වූ හානිය පිළිබඳ ඉක්මන් තක්සේරුගත කිරීම.**

සුනාමි ව්‍යසනය නිසා බෙන්තොට සිට කොග්ගල දක්වා වූ වෙරළ තීරයේ සිදුවූ පාරිසරික හානිය පිළිබඳ ඉක්මන් තක්සේරු කිරීම සඳහා පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය හා වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව එක්ව ව්‍යසනය කළමනාකරණය සඳහා 2005 ජනවාරි 17 දින ජනාධිපති ලේකම් කාර්යාලයේදී උසස් ජාතික කමිටුවේ රැස්වීමක් පැවැත්විය.

මෙම තක්සේරුගත කිරීම් පරිදි, එම පරිසරයට වූ හානි ප්‍රමාණය අනුව නැවත ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා ගතයුතු ක්‍රියාමාර්ග ගැන පාරිසරික හා ස්වාභාවික සම්පත් අමාත්‍යාංශය වෙත 2005 පෙබරවාරි මාසයේදී නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

**සුනාමි ව්‍යසනය නිසා වෙරළබඩ ප්‍රදේශයේ ජල තත්වය පිළිබඳ අධ්‍යයනය.**

සුනාමිය නිසා වෙරළ තීරයේ හා ඒ ආශ්‍රිත ජල පද්ධතිවල වෙනස්කම් සිදුවිය. ජලයේ තත්වය අධ්‍යයනය කිරීමෙන් හා ඉක්මන් තාක්ෂණික මිතික භාවිතයෙන් පැමිණි විනාශකාරී රැලි නිසා පරිසර පද්ධතියට වූ හානිය පිළිබඳ අදහසක් ගත හැක. ප්‍රධාන නියැදි එකතු කළ ස්ථාන, කොළඹ, මොරටුව/පානදුර, කළුතර, සීනිගම/හික්කඩුව, ගාල්ල, මාතර, තංගල්ල, අම්බලන්තොට, හම්බන්තොට, කිරින්ද, පලටුපාන, බුටෑව හා යාල විය. නියැදි ලබා ගැනීමේ බාධක, විශ්ලේෂණ හා ගබඩා කිරීමේ අපහසුතා මත පානම, පොතුවිල්, තිරික්කෝවිල්, ඔලුවිල්, කල්මුණේ, කාත්තන්කුඩි, මඩකලපුව, එරාවූර්, ත්‍රිකුණාමලය, නිලාවැලි යන ස්ථාන අත්හැර දැමුනි. ආකුලතා අගයන් බොහෝ ප්‍රදේශවල 23.80 NTV ± 23.75 ලෙස ඉහළ අගයක් ගත්තේය. පොදුවේ ප්‍රතිඵල ගත්විට ප්‍රධාන ජල පරාමිතිකයන් ලෙස නයිට්‍රේට් 0.040 ± 0.020 ලීටරයට / මිලිග්‍රෑම්, නයිට්‍රයිට් 0.0163 ± 0.018 ලීටරයට / මිලිග්‍රෑම්, ඇමෝනියා 0.024 ± 0.048 ලීටරයට / මිලිග්‍රෑම් හා පොස්පේට් 0.02 ± 0.01 ලීටරයට / මිලිග්‍රෑම් ලෙස විය. විද්‍යාගාරවල අළුත්වැඩියා කටයුතු නිසා අධීක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කිරීමට නොහැකි විය. සම්පූර්ණ කරුණු සහිත වාර්තාව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරිණි.

**විශාල ලෙස මසුන් මිය යාමේ සිද්ධිය.**

2005 සැප්තැම්බර් මසදී අත්තිඩිය වගුරු බිමේදී විශාල ලෙස මසුන් මිය යාමේ සිද්ධියක් වාර්තා විය. මේ සඳහා ජලයේ දිය වී ඇති ඔක්සිජන් ද්‍රාව්‍යතාවයේ අඩුවීමක් හේතු වී ඇති බව සොයා ගැනිනි. මෙවැනි තත්වයන් ගවේෂණයන්හිදී වැදගත් වන දූෂක පරාමිතීන් නිර්ණයට අවශ්‍ය පර්යේෂණ මෙවලම් සඳහා ඉල්ලුම් කරන ලද අතර, ටෙන්ඩර් කැඳවීම් සිදු කරන ලදී.

**සේතු සමුද්‍රම් නැව් මාර්ග ව්‍යාපෘතිය.**

සේතු සමුද්‍රම් නැව් මාර්ග ව්‍යාපෘතියේ අධීක්ෂණ කටයුතු සඳහා නාරා ආයතනයට බලය පැවරිණි. ජලයේ තත්ව අධ්‍යයනය සඳහා අංශය ගවේෂණ චාරිකා දෙකකට සහභාගි විය. 2005 පෙබරවාරි මස පළමු ගවේෂණ චාරිකාව සිදුවිය. මෙය මන්නාරමේ සමීක්ෂණ කටයුතු සඳහා විය. දෙවන ගවේෂණ චාරිකාව ආදම්ගේ පාලම ප්‍රදේශය හා තලේමන්නාරම ප්‍රදේශවල 2005 ඔක්තෝබර්, නොවැම්බර් මාසවලදී සිදුවිය. මෙම සමීක්ෂණය යාපනයේ පෝක් සමුද්‍ර සන්ධිය, බෙංගාල බොක්ක ප්‍රදේශ දක්වා සිදුවිය. මෙම ගවේෂණ චාරිකා දෙකෙහි අරමුණ වූයේ, සමීක්ෂණ ප්‍රදේශවල මූලික තොරතුරු ලබා ගැනීම හා යෝග්‍ය පරාමිතිකයන් අධීක්ෂණය කිරීමයි. සමීක්ෂණයේ තොරතුරු එකතු කර, විශ්ලේෂණය කර විදේශ කටයුතු අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කෙරිණි.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 70%

**ව්‍යාපෘතිය 2.3 : විශේෂඥ හා උපදේශක සේවා.**

පහත සඳහන් ජාතික කමිටු නියෝජනය සඳහා අංශයේ කාර්ය මණ්ඩලය සහභාගි වූහ.

## 1. සේතු සමුද්‍රම් නැව් මාර්ග ව්‍යාපෘතිය.

විදේශ කටයුතු අමාත්‍යාංශයේ පැවති සේතු සමුද්‍රම් නැව් මාර්ග ව්‍යාපෘතියේ උපදේශක කණ්ඩායම සඳහා එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

## 2. ශ්‍රී ලංකාවේ තෙත් බිම් සංරක්ෂණය කිරීමේ ජාතික මෙහෙයුම් කමිටුව.

පාරිසරික හා ස්වභාවික සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ජාතික තෙත් බිම් සංරක්ෂණය කිරීමේ ජාතික කමිටුවේ (NWSC) සාකච්ඡාවක් සඳහා එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය. මෙහිදී තෙත් බිම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තියක් සකස් කර අවසන් වූ අතර, ඒ සඳහා රජයේ අනුමැතිය ලැබුණි. ජාතික තෙත්බිම් නාමාවලිය හා තෙත් බිම් නීති සැකසීමද ජාතික තෙත් බිම් සංරක්ෂණය කිරීමේ කමිටුව හරහා සිදුවිය.

## 3. තෙල් කාන්දුවීම ආශ්‍රිත හදිසි අවස්ථා කළමනාකරණය කිරීමට අවශ්‍ය ආයතනික ශක්තිය ගොඩ නැගීම.

තෙල් කාන්දුවීම පිළිබඳ හදිසි අවස්ථා පනත සංශෝධනය කිරීම පිණිස සමුද්‍ර දූෂණය වැලැක්වීමේ අධිකාරියට උපකාරී වීම සඳහා පිහිට වූ තෙල් කාන්දුවීම් සම්බන්ධ හදිසි අවස්ථා කළමනාකරණ ව්‍යාපෘතියෙහි ආයතනික අංශය ශක්තිමත් කිරීමේ කටයුතු සහ මෙහෙයුම් ප්‍රතිචාර කණ්ඩායමේ කාර්යයන් සඳහා එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

## 4. තුලන පිරවුම් ජලය කළමනාකරණය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය.

තුලන පිරවුම් ජලය කළමනාකරණය කිරීම සඳහා ඔක්තෝබර් මාසයේදී සමුද්‍ර දූෂණය වැලැක්වීමේ අධිකාරිය මගින් මධ්‍ය කණ්ඩායමෙහි රැස්වීමක් කැඳවන ලද අතර මෙම රැස්වීම සඳහා නාරා ආයතනය නියෝජනය කරමින් එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

## 5. ඵලදායිතාවය ඇති කිරීම සඳහා කෘතිම උපක්‍රම ප්‍රති නිර්මාණය කිරීම.

"කෘතිම පර, මසුන් ඒකරාශී කිරීමේ උපක්‍රම ඵලදායි ලෙය ගොඩ නැංවීම" සඳහා වූ වැඩසටහන ඉන්දියානු සාගර සමුද්‍ර කටයුතු සහයෝගිතාව (IOMAC) සංවිධානය කළ රැස්වීමට එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

## 6. සමුද්‍ර දූෂණය වීම් පිළිබඳ නියෝගයන්.

2005 ඔක්තෝබර් මසදී සමුද්‍ර දූෂණය වැලැක්වීමේ අධිකාරිය (MPPA) මගින් සංවිධානය කළ "සමුද්‍ර දූෂණය වීම් පිළිබඳ නියෝගයන්" යන මැයෙන් දූෂණයන් වැලැක්වීමේ නියෝග වැඩි දියුණු කිරීමේ සාකච්ඡාව සඳහා එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

පාරිසරික බලපෑම් තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සඳහා පහත ව්‍යාපෘතීන් ඇති කිරීමට ක්‍රියාශීලී ලෙස සහභාගී විය.

a. පාවෙන ගුවන් නැව් ක්‍රියාත්මක කිරීම.

මධ්‍යම පරිසර අධිකාරිය මගින් සංවිධානය කළ අභ්‍යන්තර ජල පද්ධති තුල පාවෙන ගුවන් නැව් මෙහෙයුම් වලදී අභ්‍යන්තර ජල පද්ධති තුල සිදුවන දූෂණයන් වැලැක්වීම සඳහා වූ කමිටු රැස්වීමට එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

b. ලුනාව හා මීගමුව කලපු වල තාවකාලිකව මඩ ගොඩ ගැසීම.

ලුනාව හා මීගමුව කලපු වල හාරා ඉවත් කළ මඩ තාවකාලිකව ගොඩ ගැසීම සම්බන්ධව කළ අධ්‍යයනයේ නිර්දේශ 2005 දෙසැම්බර් මස වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි.

c. මඩකලපුව තිරුක්කන්ඩියාමඩු ත්‍රිකුණාමල මාර්ගයේ කින්තියා වල ඉදි කරන පාලම් පාරු මාර්ගය.

මඩකලපුව තිරුක්කන්ඩියාමඩු ත්‍රිකුණාමලය මාර්ගයේ කින්තියා වල ඉදි කරන පාලම් පාරු මාර්ගය සම්බන්ධව වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ත්‍රිකුණාමලය ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තු කාර්යාලයේදී පැවැති ඉක්මන් කමිටු රැස්වීමට එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය. මෙහිදී වැඩබිම් සමීක්ෂණයක්ද සිදුවිය. මෙම රැස්වීමේදී නාරා ආයතනය, සමුද්‍ර පරිසරය ගැන වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව හා මාර්ග සංවර්ධන අධිකාරිය එක්ව සුදුසු ක්‍රියාමාර්ග ගැනිනි.

පහත සඳහන් උපදේශක සේවා කාලසීමාව තුළදී සිදුවිය.

a. රැකව, උස්සන්ගොඩ සහ කලමැටිය යන වෙරළාසන්න පරිසර පද්ධති ආශ්‍රිත ජල ස්කන්ධයන්හි ජල ගුණාත්මක තත්වය අධ්‍යයනය.

GEF ආයතනයේ ආධාර මත වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් ලබාදුන් රැකව, උස්සන්ගොඩ හා කලමැටිය යන වෙරළාසන්න පරිසර පද්ධති ආශ්‍රිත ජලස්කන්ධයන් හි ජල ගුණාත්මක තත්වය අධ්‍යයනය කෙරිණි. වාර්තාව සම්බන්ධව ලබාදෙන අනෙකුත් පැවරීම් අවසන් නොවූ අතර, 2006 අප්‍රේල් මස නිම කිරීමට බලාපොරොත්තු වේ.

b. හලාවත කලපුව සඳහා පාරිසරික පැතිකඩක් සැකසීම වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ඉල්ලීම් හා ආධාර මත සිදුවිය. 2005 දෙසැම්බර් මස දළ වාර්තාවක් සකස් කර ඉදිරිපත් කෙරිණි. අනෙකුත් කාර්යාලීය පැවරීම් අවසන් නොවුන බැවින් අවසාන වාර්තාව සකස් නොවූ අතර, 2006 අප්‍රේල් මස සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වේ.

c. කොග්ගල කලපුව අධ්‍යයනය.

මෙම ව්‍යාපෘතිය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය (CRMP) මගින් නාරා ආයතනයට ප්‍රදානය කෙරිණි. දළ වාර්තාවක් 2005 ජූලි මස ඉදිරිපත් කෙරිණි. අවසන් වාර්තාව පිළියෙල වෙමින් පවතී.

d. කඩොලාන පුනරුත්ථාපනය.

රැකව, උස්සන්ගොඩ සහ කලමැටිය ප්‍රදේශයේ කඩොලාන පුනරුත්ථාපනය කිරීම පිළිබඳ යෝජනා ඇතුලත් දළ ව්‍යාපෘති වාර්තාවක් වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි.

ප්‍රගතිය (%) භෞතික : 80% මූල්‍යමය : 35%

**ව්‍යාපෘතිය 3.1 : පරිසර අධ්‍යයන අංශයේ පර්යේෂණාගාරය වැඩි දියුණු කිරීමේ වැඩ සටහන.**

මෙම වැඩ සටහන යටතේ අංශයේ පර්යේෂණාගාරයේ මූලික පහසුකම් අතර විශේෂිත උපකරණ, සංකීර්ණ උපකරණ හා අනෙකුත් විද්‍යාගාර උපකරණ මාර්ගවල මූලික වැඩි දියුණු කිරීම් සිදුවිය. සුනාමි ව්‍යසනය නිසා විද්‍යාගාරයේ ඇති දැව භාණ්ඩ ද දිරායාමේ තත්වයක් ඇතිවී තිබුණි. හදිසි මිනුම් සඳහා මූලිකත්වය ලබා දෙමින් ජල නියැදි ශීතකරණ තුළ ගබඩා කිරීම සඳහා බෝතල් ශීතකරණ 02 ක් මිලදී ගැනීම සිදුවිය. සියලුම උපකරණ හා මෙවලම් පිරිසිදු කෙරිණි. අදාල දේශීය නියෝජිතයෙකු විසින් හානි වූ වර්ග තක්සේරු කළ අතර, අලුත්වැඩියා සඳහා සුදුසු ක්‍රියාමාර්ග ගැනිනි. BOD උණුසුම්කරණය හා ශීතකරණ අලුත්වැඩියා කර කාර්යයන් සඳහා යොදා ගැනිනි. පරමාණුක අවශෝෂණ වර්ණාවලිමානය සඳහා අවශ්‍ය වූ කොටසක් මිලදී ගැනුන අතර, ඉක්මණින් අලුත්වැඩියා කරන ලදී.

ප්‍රගතිය (%) භෞතික : 60% මූල්‍යමය : 25%

**ව්‍යාපෘතිය 4.1 : උපකරණ මිලදී ගැනීම.**

යුරෝපීය කොමිසමේ අනුමැතිය යටතේ බහුකාර්ය ජලජ පරිසර පද්ධති තුළ කෘෂි රසායන කලමනාකරණය (MAMAS) ව්‍යාපෘතිය හතරවන අවුරුද්ද සඳහා 2005 දෙසැම්බර් දක්වාද සිදු කෙරිණි. සුනාමි ව්‍යසනය නිසා මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් ලබා දී තිබූ උපකරණ හා පහසුකම් වලටද හානි සිදුවිය. තිලාපියා බීජ ගහණ, මොයිනා වගාව හා (ක්ලොරෙල්ලා) ඇල්ගේ මාධ්‍යයන් වලද නැවත ගොඩනැංවීම් සිදුකළ අතර, යල හා මහ කන්න ආවරණය වන පරිදි ජූලි, අගෝස්තු හා දෙසැම්බර් මාසවලදී ක්ෂේත්‍ර අධ්‍යයනය සිදු කෙරුණි. කලංකුටිය හා මිගලැව ප්‍රදේශයේ ජලයේ තත්වය හා පළිබෝධනාශක සහිත බව අධ්‍යයනයට ගැනුනි. 2005 සැප්තැම්බර් මස එංගලන්තයේ ස්ටර්ලිං විශ්ව විද්‍යාලයේ පැවති අවසාන රැස්වීමට එන්.සුරේෂ්කුමාර් මහතා සහභාගී විය.

පර්යේෂණ පාර්ශ්වකරුවන්ගේ එකගතාවය අනුව අවසාන අවදානම් තක්සේරු සඳහා වැඩමුළුවක් 2005 ඔක්තෝබර් මස 21 සිට 27 දක්වා නාරා ආයතනයේදී පැවැත්වුණි. අවසාන අවදානම් තක්සේරු කිරීම් සඳහා PRIMET පරිගණක මෘදුකාංගය වැඩිදියුණු කර ව්‍යාපෘතියේ අවසන් ප්‍රතිඵල නෙදර්ලන්තයේ පර්යේෂණ හවුල්කරුවන් වන අල්ටෙරා ග්‍රීන් වර්ල්ඩ් රිසර්ච් (Alterra Green World Research) වෙත ඉදිරිපත් කෙරිණි. අවසාන ප්‍රතිඵලයක් ලෙස "ශ්‍රී ලංකාවේ දේශීය විශේෂ පරීක්ෂණයේදී පටකයකට කරන බලපෑම් මගින් ද්‍රව්‍යයක සාන්ද්‍රණය මැනීම දියුණු කිරීම" හා "කෘමිනාශකල වල අවශේෂ සාන්ද්‍රණයන් පිළිබඳ අධ්‍යයනය" යනුවෙන් දළ වාර්තාවක් යුරෝපීය කොමිසමට සම්බන්ධ එංගලන්තයේ ස්ටර්ලිං විශ්ව විද්‍යාලයේ ව්‍යාපෘති නියෝජිත වෙත යවන ලදී.

මෙහි පසු ක්‍රියාමාර්ග ලෙස ප්‍රජාව හා පාසැල් ළමුන් ඉලක්ක කොට වැඩමුළු සංවිධානය කිරීමට නියමිතය.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 67%

**4. තාක්ෂණික වාර්තා සැකසීම.**

- අත්තිඩිය තෙත් බිම් ජල දූෂණය නිසා මසුන් මියයාම පිළිබඳ වාර්තාව 2005 සැප්තැම්බර් මස ධීවර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කෙරිණි.
- සුනාමි ව්‍යසනය නිසා වෙරළබඩ ප්‍රදේශවල ජලයේ තත්වයන් පිළිබඳ මූලික තාක්ෂණික වාර්තා 2005 පෙබරවාරි මස සකස් විය.
- තලෙයිමන්නාරම් හා ආදම්ගේ පාලම ආශ්‍රිත ප්‍රදේශයේ ජලයේ තත්වයන් පිළිබඳ තාක්ෂණික වාර්තාව 2005 මාර්තු මස.
- පෝක් සමුද්‍ර සන්ධිය, පෝක් විදිය, බෙංගාල බොක්ක ආශ්‍රිත ජලයේ තත්වයන්ගේ තාක්ෂණික වාර්තාව 2005 දෙසැම්බර් මස.

# ධීවර තාක්ෂණ අංශය

**අංශ ප්‍රධානී : එන්.බී.පී.පුන්‍යදේව මයා**

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :**

ශ්‍රී ලංකාවේ උතුරු, නැගෙනහිර හා ඊසානදිග වෙරළේ නොගැඹුරු වෙරළ තීරයේ සපත්තු සිංගි (Thenus) නෙලා ගැනීම් පිළිබඳ පර්යේෂණ ව්‍යාපෘතිය දියත් විය. මෙහිදී විදේශ වෙළඳපොළ සඳහා තිරසාර අස්වනු නෙලීමක් හෝ රෙගුලාසි ක්‍රියාත්මක කර නැති බව පෙනිනි. උතුර, නැගෙනහිර හා ඊසානදිග වෙරළ තීරයේ මෙම සපත්තු සිංගි ඉතා කුඩා ප්‍රමාණයෙන් නෙලීම සිදු කරන බව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් විය. මෙනිසා මේ පිළිබඳ සම්පූර්ණ අධ්‍යයනයක් කොට සුදුසු නිර්දේශ හා කළමනාකරණ ඉදිරිපත් කරන ලෙස නාරා ආයතනය වෙත පැවරිණි.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :**

සපත්තු සිංගින්ගේ වර්තමාන තත්වය පිළිබඳ පෞද්ගලික ආයතන හා අපනයන සංඛ්‍යාන පිළිබඳ දත්ත එකතු කෙරිණි. ප්‍රධාන වගාවන් ප්‍රදේශ වන කල්පිටිය, ත්‍රිකුණාමලය, මන්නාරම, යාපනය, මුත්තූර්, මුලතිව්, මඩකලපුව, කිරින්ද වැනි ස්ථාන නිරීක්ෂණයට ලක්විය. ධීවර සංවිධාන සහභාගී කරගෙන සපත්තු සිංගි සඳහා ධීවර පත්න ක්‍රමයක් ගොඩ නැංවීම සඳහා අත්හදා බැලීම් සිදුවිය. ක්ෂේත්‍ර චාරිකා මගින් දත්ත එකතු කළ අතර, වාණිජ අස්වනු සම්බන්ධ දත්ත විශ්ලේෂණය කරන ලදී. උතුරු, නැගෙනහිර ප්‍රදේශවල බාධාකාරී තත්වයන් නිසා අත්හදා බැලීම් සඳහා දුෂ්කරතා මතුවිය.

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| නව ධීවර තාක්ෂණය වර්ධනය කිරීම. | සපත්තු සිංගි (Thenus) සඳහා නව පත්න ක්‍රම අත්හදා බැලීම. | 1.5 | ආචාර්ය ඩී.එස්.ජයකොඩි එන්.බී.පී. පුන්‍යදේව | 2005 ජනවාරි | 2005 දෙසැ: |

**3. කාර්ය සාධනය :**

මෙම ව්‍යාපෘතිය යටතේ, ධීවර ප්‍රජාව සහභාගී කරගෙන ධීවර පත්න ක්‍රම සංවර්ධනය කිරීම හා අත්හදා බැලීම් සිදුවිය. මෙහිදී පෙනීගිය කරුණක් වූයේ සපත්තු සිංගි කර්මාන්තය බොහෝ ප්‍රදේශවල ධීවරයින් විසින් ඉලක්ක කරගත් පත්න ක්‍රමයක් ලෙස භාවිතා නොකරන බවයි. කෙසේ වුවත් මුලතිව් හා යාපනය දිස්ත්‍රික්කයන් හි මෙම කර්මාන්තය ප්‍රධාන වශයෙන් සිදුකරන බව පෙනී ගියේ සපත්තු සිංගි මිලදී ගැනීම සඳහාම වෙන්වූ ආයතන එම ප්‍රදේශවලින් අස්වනු එකතු කරන බව වාර්තා වීම නිසාය. සපත්තු සිංගි සඳහා අත්හදා බැලූ ධීවර පත්න ක්‍රමයෙන් සතුටුදායක වර්ධනයක් සේම ඉහළ අස්වනු ලැබුණු බව පෙනී ගියේය. කෙසේ වුවත් පත්න ක්‍රමය හඳුන්වාදීම හා වැඩිදියුණු කිරීම එහි කාර්යක්ෂමතාවය මත රඳා පවතී.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 62%

**4. ප්‍රකාශන.**

**පර්යේෂණ ලිපි** : නොයෙකුත් බාධක හා දුෂ්කරතා නිසා දත්ත එකතු කිරීම සම්පූර්ණ නොවුන බැවින් පර්යේෂණ ලිපි පිළියෙල වීම සිදු නොවුනි.

**පර්යේෂණ වාර්තා** : ග්‍රන්ථ / අත්පොත් පිළියෙල වෙමින් පවතී.

5. **පුහුණුවීම් / අවබෝධාත්මක වැඩ සටහන් ඉදිරියට.**

සහකාර අධ්‍යක්ෂවරු, ධීවර පරීක්ෂකවරු හා අදාල ප්‍රදේශවල ධීවරයන් සඳහා දැනුම හා පලපුරුදු බෙදා ගැනීම සඳහා රුස්වීම් සංවිධානය විය.

**සීමා කිරීම් :**

මුලතිව් හා යාපනය දිස්ත්‍රික්ක වලින් සපත්තු සිංගිත්ගේ එකතුවක් වාර්තා විය. ආරක්ෂක හේතූන් මත එම ප්‍රදේශවල ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීමට නොහැකි වූ අතර, දත්ත ලබා ගැනීම පෞද්ගලික ආයතන හා අපනයන සංඛ්‍යාලේඛණ මත පදනම් විය. උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන් හි තත්වය යහපත් වූ විට ව්‍යාපෘතිය දිගටම සිදු කිරීමේ වැදගත්කම තීරණය විය.

# ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය

## අංශ ප්‍රධානී : එම්.ජ්. ආරියවංශ මහතා

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

නාවික යාත්‍රික කටයුතු සුරක්ෂිතව සහ කාර්යක්ෂමව සිදු කිරීමට ආධාර වන සේවා සැපයීම ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය මගින් සිදු කෙරේ. එයින් සැපයෙන ප්‍රධාන සේවා වන්නේ නාවික සිතියම් ඇතුළු නාවුක තොරතුරු සැපයීම, වෙරළ කලාපීය කළමණාකරණය සහ පාරිසරික ආරක්ෂණය ආදී අවශ්‍යතා සඳහා දත්ත සැපයීම සහ ඒ සම්බන්ධ අනෙකුත් සම්පාදන සහ සේවා සැපයීමයි. නිවැරදි සහ කාලීන නාවික සිතියම් සම්පාදනය කිරීම මගින් නාවික වෙළඳ කටයුතු සහ අනෙකුත් සමුද්‍රය ආශ්‍රිත කටයුතු පහසු වන අතර, එමගින් සැළකිය යුතු ආර්ථික සහ වාණිජමය ප්‍රතිලාභ ජනනය වේ.

සුනාමි ව්‍යසනය නිසා "සයුරි" නෞකාවට හා එහි මිනුම් උපකරණවලට විශාල ලෙස අලාභහානි සිදුවිය. මෙනිසා ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලයේ 2005 වසරේ වැඩ සැලැස්ම ජාතික සිතියම් සැකසීමේ වැඩසටහන යටතේ සිදුවිය. ජාතික ජලශාස්ත්‍රීය කාර්යාලය පහත සඳහන් විශේෂ සුනාමි පසු විපරම් වැඩසටහන් සිදු කළේය.

1. විශේෂ සුනාමි පසු විපරම් වැඩසටහන
(පානදුර, බේරුවල, හික්කඩුව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, තංගල්ල)
2. හම්බන්තොට ධීවර වරාය ද ආවරණය කෙරිණි.
3. ගාල්ල වරායේ ප්‍රධාන ඇළ මාර්ගයේ මිනුම් කටයුතු (ජාතික සිතියම් සැකසීමේ වැඩසටහන යටතේ සිදුවිය.)
4. කල්පිටිය කලපුවේ ගැඹුරු මිතික දත්ත සමීක්ෂණය.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | භාර නිලධාරින් | කාලසීමාව | |
|---|---|---|---|---|
| 1. පශ්චාත් සුනාමි මුදා ගැනීම් ඉක්මන් වැඩ කටයුතු | 1.1 සයුරි යාත්‍රාව කොළඹ නැව් තටාකාංගනය වෙත රැගෙන ඒම. | එම්.ජ්.ආරියවංශ මහතා සහ ඩී.ජ්.කරුණාසේන මහතා | 2005 ජනවාරි | 2005 මාර්තු දක්වා |
| 2. පශ්චාත් සුනාමි සමීක්ෂණ වැඩසටහන | 2.1 දකුණු පළාතේ ධීවර වරායන් වලට සුනාමි ව්‍යසනයෙන් වූ හානි. පානදුර, බේරුවල, හික්කඩුව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, තංගල්ල හා හම්බන්තොට ධීවර වරායන් හි ගැඹුරු මිතික දත්ත සමීක්ෂණය. | එස්.එන්.එස්.අමරසිංහ මහතා සහ ජ්.එන්.ඩී.පෙරේරා මහතා | 2005 මාර්තු සිට | 2005 ජූලි දක්වා |
| 3. ජාතික සිතියම්කරණ වැඩසටහන | 3.1 ගාල්ල වරායේ ප්‍රධාන ඇළ මාර්ග සමීක්ෂණය. | එස්.එන්.එස්.අමරසිංහ මහතා සහ ජ්.එන්.ඩී.පෙරේරා මහතා | 2005 ජූලි සිට | 2005 අගෝස්තු දක්වා |
| | 3.2 කල්පිටිය කලපුවේ ගැඹුරු මිතික දත්ත සමීක්ෂණය. | එස්.එන්.එස්.අමරසිංහ මහතා සහ ජ්.එන්.ඩී.පෙරේරා මහතා | 2005 සැප්තැම්බර් සිට | 2005 දෙසැම්බර් දක්වා |
| | 3.3 අදාල සමීක්ෂණ කටයුතු වල දත්ත විශ්ලේෂණය හා සිතියම් සැකසීම | එස්.ඩබ්.එස්.වීරසිංහ මහතා සහ ඕ.වී.ප්‍රේමචන්ද්‍ර මහතා | 2005 මාර්තු සිට | 2005 දෙසැම්බර් දක්වා |
| 4. සේතු සමුද්‍රම් ව්‍යාපෘතියේ EIA අධ්‍යයන කටයුතු | 4.1 දත්ත එකතු කිරීමේ කටයුතු | එස්.ආර්.සී.රණවීර මහතා සහ ආර්.එච්.පී.වැලිගොඩපිටිය මහතා | 2005 ඔක්තෝබර් සිට | 2005 නොවැම්බර් දක්වා |

කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1.1 : සයුරි යාත්‍රාව කොළඹ නැව් තටාකාංගනය වෙත රැගෙන ඒම.**

ශ්‍රී ලංකා නාවික හමුදාව යටතේ සයුරි යාත්‍රාව කොළඹ නැව් තටාකාංගනය වෙත ගෙන ඒම සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 100

මූල්‍යය : රක්ෂණ ආයතනය මගින් මේ සඳහා අයවැය කටයුතු ආවරණය විය.

**ව්‍යාපෘතිය 2.1 :**

සුනාමි ව්‍යසනය නිසා හානියට පත්වූ දකුණු ප්‍රදේශයේ පානදුර, බේරුවල, හික්කඩුව, ගාල්ල, මිරිස්ස, පුරාණවැල්ල, තංගල්ල හා හම්බන්තොට ධීවර වරායන් හි ගැඹුරු මිතික දත්ත සමීක්ෂණ කටයුතු සිදු කෙරිණි.

ධීවර වරායන් 08 ක ගැඹුරු මිතික සමීක්ෂණ කටයුතු සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 100 මූල්‍යමය : 95%

**ව්‍යාපෘතිය 3.1 : ගාල්ල ධීවර වරායේ ප්‍රධාන ඇළ මාර්ග සමීක්ෂණය.**

ගාල්ල වරාය ආශ්‍රිත පශ්චාත් සුනාමි ජලශාස්ත්‍රීය දත්ත එකතු කිරීම් සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 100 මූල්‍යමය : 90%

**ව්‍යාපෘතිය 3.2 : කල්පිටිය කලපුවේ ගැඹුරු මිතික සමීක්ෂණයන්.**

කල්පිටිය කලපුවේ ගැඹුරු මිතික සමීක්ෂණ කටයුතු සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 20 මූල්‍යමය : ?

**ව්‍යාපෘතිය 3.3 : අදාල සමීක්ෂණ කටයුතු වල දත්ත විශ්ලේෂණය හා සිතියම් සැකසීම.**

අදාල සමීක්ෂණ කටයුතු වල දත්ත විශ්ලේෂණ හා සිතියම් සැකසීමේ කටයුතු සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 100 මූල්‍යමය : 95%

**ව්‍යාපෘතිය 4.1 : දත්ත එකතු කිරීමේ කටයුතු.**

සේතු සමුදුම් නාවික මාර්ග ප්‍රදේශයේ EIA හි ජලශාස්ත්‍රීය දත්ත එකතු කිරීම සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 100 මූල්‍යමය : විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ආවරණය විය.

**4. පුහුණුවීම් / අවබෝධාත්මක වැඩසටහන් ඉදිරියට.**

CARIS GIS පුහුණුව I - 2005 ජූනි
CARIS GIS පුහුණුව II - 2005 සැප්තැම්බර්

**5. ප්‍රකාශන :**

ධීවර වරායන් 08 ක පශ්චාත් සුනාමි ගැඹුරු මිතික සිතියම් පිළියෙල විය.

# අභ්‍යන්තර ජලජ සම්පත් සහ ජලජීවී වගා අංශය

## අංශ ප්‍රධානී : එම්.එච්.එස්.ආරියරත්න මෙනෙවිය

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

2005 වර්ෂය තුළ ව්‍යාපෘති 10 ක් ක්‍රියාත්මක විය. වර්ෂය මුලදී ප්‍රධාන කාර්යාලයේ පර්යේෂණ නිලධාරීන් 04 දෙනෙකුගෙන්ද, ප්‍රාදේශීය කාර්යාලවල නිලධාරීන් 05 දෙනෙකුගෙන්ද වැඩ සටහන් ක්‍රියාත්මක විය. වැඩ බලන අධ්‍යක්ෂ ජනරාල් ලෙස කටයුතු කළ ආචාර්ය සේපාලිකා ජයමාන්න මහත්මිය මැයි මසදී ආපසු අංශය වෙත අනුයුක්ත වූ අතර, ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ සිටි නිලධාරිණියක් අංශ ප්‍රධානී ලෙස වැඩ භාර ගත්තාය. අභ්‍යන්තර ජලජ සම්පත් හා ජලජීවී වගා අංශයේ ප්‍රධාන කාර්යාලයේ එක් නිලධාරියෙකු, රඹකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ එක් නිලධාරිණියක් හා කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ එක් නිලධාරිණියක් ආචාර්ය උපාධිය සඳහා සැප්තැම්බර් මස විදේශගත විය. එක් නිලධාරියෙකු ආචාර්ය උපාධිය නිමකර ජූනි මස ආපසු පැමිණීමට නියමිතව තිබූ නමුත් ආචාර්ය උපාධියේ වැඩ කටයුතු සම්පූර්ණ කර ගැනීම සඳහා දෙසැම්බර් 31 දක්වා අධ්‍යයන නිවාඩු ඉල්ලුම් කළ අතර, එය ලබාදෙන ලදී.

මෙම අවුරුද්ද තුළදී අංශයේ විශේෂ අවධානය යොමුවූ කරුණු වූයේ, ගොඩනැගිලි අලුත්වැඩියා කිරීම, ආවේණික මත්ස්‍ය පැටවී ගහණ / විසිතුරු මත්ස්‍ය පැළැටි එකතු කිරීම හා උපකරණ මිලදී ගැනීම් හා අලුත්වැඩියා කිරීම්ය.

අවුරුද්ද තුළදී අංශය විසින් ව්‍යාපෘති රාශියක් සතුටුදායක ලෙස සිදුකළ අතර, මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ වැඩ සටහන් කිහිපයක් අවසන් කිරීමට නොහැකි වූයේ රසායන ද්‍රව්‍ය හා උපකරණ නියමිත කාල වේලාවට නොලැබුණු නිසාවෙනි. ව්‍යාපෘති අංක 1.4 යටතේ පර්යේෂණ කොටසක් අවසන් කිරීමට නොහැකි විය. සුනාමි ව්‍යසනය නිසා උපකරණ හා රසායන ද්‍රව්‍ය වලට වූ හානිය මෙයට බලපෑවේය.

අභ්‍යන්තර ජලජීවී වගා සම්බන්ධව රජයේ විවිධ දෙපාර්තමේන්තු වලින් කරන ලද ඉල්ලීම් නිසා ජල තත්ව පරීක්ෂණ බිම් පරීක්ෂාව මත්ස්‍ය රෝග හඳුනාගැනීම් හා ඒවාට ප්‍රතිකාර කිරීම් හා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කෙරිණි.

රඹකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයට හා නාරා ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර ජලජීවී වගා අංශයට සම්බන්ධ පර්යේෂණ සහකාරවරුන්, සමාජ ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශයට සම්බන්ධ ව්‍යාපෘතීන් සඳහා අවුරුද්දේ දී මුදා හරින ලදී..

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. වෙරළ කලාපීය ජලජීවී වගාව. | 1. ඉස්සන් ගොවිපල වලට වෛරස ආසාදන පැමිණිය හැකි මාර්ග වසා දැමීම. | 660,000/- | පී.පී.එම්.හීනටිගල | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| | 2. ඉස්සන්ගේ සෞඛ්‍ය හා පරිසර කළමනාකරණ ව්‍යාපෘතිය. | 260,000/- | ඒ.එස්.එල්.ඊ. කොරයා | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| | 3. කොස්සා සහ වෙක්කයා යන මත්ස්‍යයන් ගේ අභිජනනය කීටයන්ගේ දිවි පැවැත්ම සහ වගාව කෙරෙහි බලපාන සාධක නිර්ණය කිරීම. | 535,000/- | පී.ඒ.ඩී.අජිත් කුමාර | 2005 ජනවාරි | 2005 දෙසැ: |

3. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1.1 : ඉස්සන් ගොවිපළ වලට වෛරස ආසාදන පැමිණිය හැකි මාර්ග වසා දැමීම.**

ආසාදිත නොවූ මව් ඉස්සන්ගෙන් ලබාගත් කීටයන්ගේද ආසාදිත තත්ව දක්නට ලැබීමෙන් පෙන්නුම් කලේ කීට වගා පියවර එකකදී හෝ ඊට වැඩි ගණනකදී කීටයන් ආසාදිත තත්වයනට භාජනය වන බවයි. මෙම අධ්‍යයනයේදී සිදු කරනුයේ, වෙනස් භූවිෂමතා සහිත ප්‍රදේශවලදී වෛරස් ආසාදන ඇතිවිය හැකි මාර්ග ක්‍රමවත්ව හඳුනා ගැනීමයි. මෙහිදී විබ්‍රියෝ විශේෂ ආශ්‍රිත සම්බන්ධතාවයන් සොයා ගැනීම් සිදුවිය. වර්තමානයේදී විබ්‍රියෝ විශේෂ වගා පද්ධති තුල පාරිසරිකව හා සුදු පුල්ලි රෝගය මත බලපාන ආකාරය සොයා බලනු ලබයි.

සුනාමි ව්‍යසනය නිසා PCR රසායනාගාරය හා බැක්ටීරියා පරීක්ෂණ රසායනාගාරයන්ට හා එහි උපකරණ වලට හානි සිදුවිය. එම නිසා අධ්‍යයනයන් සම්පූර්ණ කල නොහැකි විය. එම විද්‍යාගාර වල අළුත්වැඩියාවන් සිදු කල අතර, උඳුන් වැනි උපකරණ අළුත්වැඩියා කල අතර, අළුත් උපකරණ හා රසායන ද්‍රව්‍ය මිලදී ගැනීම් සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 55% මූල්‍යමය : 99.94%

**බාධකයන්.**

විද්‍යාගාර හා විද්‍යාගාර උපකරණ අළුත්වැඩියාව ප්‍රමාද විය. උපකරණ අළුත්වැඩියාව 2005 වසර අවසනදී සම්පූර්ණ කෙරිණි.

**ව්‍යාපෘතිය 1.2 :** ස්වාභාවික ජලාශවලට රෝගී ඉස්සන් මුදා හැරීම තහනම් වුවද, තවමත් සිදුවන බව වාර්තා විය. රෝගී තත්ව පවතින කාල තුලදී ගං මෝය වල ස්වාභාවික අස්වැන්න මෙම තත්වය තහවුරු කල අතර, සුදු පුල්ලි රෝගයට අමතරව වෙනත් රෝගද වාර්තා විය. ජල ප්‍රභවයෙහි බැක්ටීරියා වල තත්වය ද, රෝග වැළඳුනු ඉස්සන් සහිත පොකුණු වලට ඒවා වැළැක්වීමට යොදන රසායනික ද්‍රව්‍ය මගින් ඉස්සන් හා පරිසරය මත ඇති කරන බලපෑම අධ්‍යයනය කිරීම අවශ්‍ය බව හඳුනා ගන්නා ලදී.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 89.5%

**ව්‍යාපෘතිය 1.3 : මොදා සහ වෙක්කයා යන මත්ස්‍යයින්ගේ අභිජනනය, කීටයන්ගේ දිවි පැවැත්ම සහ වගාව කෙරෙහි බලපාන සාධක තීර්ණය කිරීම.**

වෙක්කයා (*Chanos chanos*) හා මොදා (*Lates Calcarifer*) සාමාන්‍යයෙන් ගැඹුරු මුහුදේදී පැටවුන් බිහි කරයි. වයඹදිග වෙරළ ප්‍රදේශයේදී වෙක්කයන්ගේ පැටවුන් උදම් රළ ඇතිවිට පැමිණේ. නමුත් පසුගිය අවුරුදු 20 ක කාලයක පටන් මිනිසුන්ගේ ක්‍රියාකාරකම් නිසා ඔවුන් එකතු කිරීමක් සිදු කිරීමට නොහැකි විය. නමුත් මෙම විශේෂ, රටේ අවශ්‍යතාවයන් මත කෘතිමව වගා කිරීම පිළිවෙලට කල හැක. වෙක්කයින් නිත්‍ය ජලාශවල රැස්කර තැබීම කල හැක්කේ, ලවණ හා මිරිදිය ජලයට ඔරොත්තු දීමේ හැකියාව ඇති නිසාවෙනි. මෙම මසුන් ධූනා ධීවර කර්මාන්තයේදී ඇමක් ලෙස විශාල වටිනාකමක් ඇත. කොස්සා දේශීය හා විදේශීය වෙළඳපොලේ ඉතා හොඳ ඉල්ලුමක් ඇති මසුන් වර්ගයකි.

ස්වභාවික ආහාර මත වගාව සතුටුදායකව සම්පූර්ණ කෙරිණි.

පාවෙන කුඩුවක ආසියාතු මොදා පැටවු ගහණ කලමනාකරණය පිලිබඳ සීඩා/සරෙක් අන්තර්ජාතික වැඩමුළුවේදි පෝස්ටරයක් ඉදිරිපත් කෙරිණි. මොදුන්ගේ හා වෙක්කයින්ගේ බෝ කිරීම් අවසන් නොවුනු නිසා වාර්තාවක් සකස් කිරීම සිදු නොවිය.

ප්‍රගතිය (%) භෞතික : 50 % මූල්‍යමය : 22.35%

**බාධකයන්.**

යටිතල පහසුකම් අඩාල වීම.
පැටවු ගහණ එකතු කිරීම් අපහසුතාවයන්.

**ව්‍යාපෘතිය 1.4 : ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශ ආශ්‍රිතව ජලජීවී, කෘෂි ඒකාබද්ධ වගා පද්ධතියක් වැඩි දියුණු කිරීම.**

ජාතික ධීවර සංවර්ධන ක්‍රියාවලියට මුල්තැන දෙමින් ග්‍රාමීය ජනතාව සම්බන්ධ කර අඩු වියදම් මිරිදිය ක්‍රියාකාරකම් තුලින් දේශීය ආහාර නිෂ්පාදනය ඉහල නැංවීම මෙයින් සිදු කෙරේ. මෙයින් මූලික කර්තව්‍ය වන්නේ ග්‍රාමීය ජලජීවී වගාව නැංවීමයි. මෙම ව්‍යාපෘතිය යටතේ පහත ලෙස පිළිවෙළින් පර්යේෂණ ක්‍රම 4 ක් නිර්මාණය වී ඇත.

(a) චෙරි බාර්බ් හෙවත් *Puntius titteya* ගේ ගහණයන් සඳහා විටමින් C වල බලපෑම, ප්‍රජනනය හා ඔවුන්ගේ පැවැත්ම.

(b) ප්‍රජාවගේ සහභාගිත්වය මත ග්‍රාමීය මිරිදිය කර්මාන්තය සංවර්ධනය.

(c) මුහුදු පැළැටි වගාව.

(d) මිරිදිය ඉස්සන්ගේ පසු කීටයින්ගේ නිෂ්පාදනය.

**(a) චෙරි බාර්බ් හෙවත් *Puntius titteya* ගේ ගහණයන් සඳහා විටමින් C වල බලපෑම, ප්‍රජනනය හා ඔවුන්ගේ පැවැත්ම.**

ශ්‍රී ලංකාවට ආවේණික විසිතුරු මත්ස්‍යයින් අතර එක් වැදගත් වර්ගයකි, චෙරි බාර්බ්. මොවුන් අපනයනය සඳහා පරිසරයෙන් විශාල වශයෙන් අල්ලා ගත් බැවින් දැන් වඳවී යන තත්වයකට පත්ව ඇත. පරිසරයෙන් මොවුන් අල්ලා ගැනීම වලක්වනු වස් ගොවීන් මෙම මසුන් බෝ කිරීම සඳහා යොමුවිය යුතුය.

විටමින් C හෙවත් ඇස්කොබික් අම්ලය මෙම මසුන්ගේ ආහාර සඳහා යෙදීම ප්‍රධාන සාධකයක් වේ. එමගින් මොවුන්ගේ ප්‍රජනන ක්‍රියාවලියත් වර්ධනය සඳහා විටමින් C ආහාරවලට යෙදීම වැදගත් වේ. මෙම අධ්‍යයනයේදී සිදු කළේ, චෙරි බාර්බ් මසුන්ගේ පෝෂණ තත්ව වැඩිකර ගහණයන්, ස්ථාවර වීම්, බිත්තර හා කීටයන්ගේ තත්වය වර්ධනය කිරීමයි.

විටමින් C ඉහළ අගයක් ඇති ආහාර මෙම මසුන්ට ලබාදීමෙන් මාථ පැටවු සහ බිත්තර වල අගයන් ඉහළ මට්ටමකට තබා ගැනීම සිදුවිය.

**බාධකයන්.**

කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වාහන පහසුකම්.

**(b) ප්‍රජාවගේ සහභාගිත්වය මත ග්‍රාමීය මිරිදිය කර්මාන්තය සංවර්ධනය.**

මෙම අංශය සඳහා මූල්‍යමය පහසුකම් සපයන ලද්දේ හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාපීය කළමනාකරණ ව්‍යාපෘතිය හා රූකව, උස්සන්ගොඩ හා කලමැටිය සඳහා වූ ලෝක පරිසර පහසුකම් සංවිධානය විසිනි. මෙමගින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමීය ජනතා සහභාගිත්වයෙන් මිරිදිය කර්මාන්තය සංවර්ධනය සිදුවේ. මෙහිදී කුඩා කොටස් අතර මිරිදිය කර්මාන්තයේදී ආහාර සඳහා විශාල වියදම් දැරීමට සිදුවන අතර, ජාතික ප්‍රතිපත්ති අනුව අඩු වියදම් මත්ස්‍ය ආහාර නිෂ්පාදනය මෙමගින් සිදු කෙරේ. මෙම අඩු වියදම් මත්ස්‍ය ආහාර නිෂ්පාදනය සඳහා ඉවත දමන මත්ස්‍ය කොටස් තංගල්ල ධීවර වරායෙන් ලබා ගැනුණි. මෙම ආහාර තිලාපියා මසුන්ගේ කුඩා පැටවු (ඇඟිත්තන්) සහ විශාලත්වයට පත්වූ පැටවුන් සඳහාද, ටැංකිවල අභිජනනය කළ මසුන් හා ග්‍රාමීය ජනතාව විසින් සෑදූ කුඩු මසුන් සඳහා ද ලබා දුනි. මිරිදිය ඉස්සන්ගේ පසු කීටයින් හා සිමෙන්ති ටැංකිවල හැදී වැඩුණු සත්වයින් සඳහා ද ලබා දුනි.

මෙම මත්ස්‍ය ආහාරවල සියයට 20 - 30 අතර ප්‍රෝටීන් ප්‍රතිශතයක් පැවතිය අතර, ඒවා රටේ මිරිදිය කර්මාන්තය සංවර්ධනය සඳහා ඉතා වැදගත් වේ.

සාමාන්‍ය ජනතාව සඳහා සිංහලයෙන් හා දෙමළ බසින් මෙහි අත් පත්‍රිකාවක් නිර්මාණය කළ අතර, ඒවා මුද්‍රණ තත්වයේ පවතී.

මූල්‍යමය ප්‍රගතිය :

මේ සඳහා හම්බන්තොට ඒකාබද්ධ වෙරළ කලාප කළමනාකරණ ව්‍යාපෘතිය (HICZMP) හා රැකව, උස්සන්ගොඩ හා කලමැටිය සඳහා ලෝක පරිසර පහසුකම් සංවිධානය (GEFRVK) පිළිවෙළින් රු. 169,000/00 හා රු. 95,000/00 ලබා ගැනුණි.

**බාධකයන්.**

(a) සුනාමිය නිසා මසුන් ආහාර සඳහා භාවිතය අඩු වූ බැවින් ඉවතලන මත්ස්‍ය කොටස් එකතු කර ගැනීම අපහසු වීම.

(b) මුහුදු පැළෑටි වගාව.

(c) මිරිදිය ඉස්සාගේ පසු කීට නිෂ්පාදනය.

ව්‍යාපෘතියන් හි අංග 2 ක් අවසන් කිරීමට නොහැකි වූයේ සුනාමියේ බලපෑම නිසාවෙනි.

ප්‍රගතිය (%) භෞතික : 75 % මූල්‍යමය : 26.72%

**ව්‍යාපෘතිය 1.5 : ඒක දේශික විසිතුරු මත්ස්‍ය විශේෂවල මත්ස්‍ය පැටවුන් ඇතිදැඩි කිරීම සඳහා යොදන අභිජනන ක්‍රම අධ්‍යයනය.**

මිරිදිය විසිතුරු මත්ස්‍ය කර්මාන්තය ප්‍රධාන වශයෙන් සමන්විත වනුයේ, ස්වභාවික පරිසරයෙන් අල්ලා ගත් මසුන් ටැංකි තුළ අභිජනනය කිරීමයි. ශ්‍රී ලංකාවේ ආවේණික මත්ස්‍ය විශේෂවලට ඉහළ ඉල්ලුමක් තිබේ. වඩා උසස් අගයන්ගෙන් යුත් ආවේණික මත්ස්‍ය වර්ගයන් අපනයනය සඳහා පරිසරයෙන් අල්ලා ගනී. මෙහි ප්‍රතිඵලයක් ලෙස ආවේණික මත්ස්‍ය සම්පතෙහි අඩුවීමක් දක්නට ලැබේ. මෙම අධ්‍යයනයේදී ආවේණික මත්ස්‍ය විශේෂ අභිජනනය, ඒ සඳහා බලපාන පාරිසරික තත්ව අධ්‍යයනය හා රෝග තත්ව හඳුනා ගැනීම සිදු කෙරේ.

ගල්පන්ඩි (*Garra ceylonensis*), අසෝක පෙතියා (*Puntius asoka*) හා ගිත මස්සා යන විශේෂයන්ගේ අභිජනන කටයුතු සතුටුදායක නොවුණි.

සුදුපුල්ලි වෛරසය මෙම මසුන් අතර වැඩි වශයෙන් තිබූ රෝග තත්වයක් ලෙස හඳුනා ගැනිණි.

ප්‍රගතිය (%) භෞතික : 5 % මූල්‍යමය : 38.6%

**බාධකයන්.**

ඉදිකිරීම් වැඩ ප්‍රමාදවීම හා වාහන නොමැතිවීම.

**ව්‍යාපෘතිය 1.6 : ශ්‍රී ලංකාවේ දක්නට ඇති නීති විරෝධී, වාර්තාගත නොවූ සහ පාලනය නොවන ධීවර කර්මාන්තයන් පිළිබඳ ගවේෂණය කිරීම.**

නීති විරෝධී ධීවර කර්මාන්තයන් පිළිබඳ වඩා වැදගත් වන්නේ වාර්තා කිරීම නොවන අතර, මත්ස්‍ය තොග අතරින් අපයෝජනය වන මට්ටම පිළිබඳ ඉතා නිවැරදි තක්සේරු කිරීමත් ය. ලෝක ආහාර හා කෘෂිකර්ම සංවිධානය, මෙම නීති විරෝධී ධීවර කර්මාන්තයන් අධ්‍යයනය කිරීම සඳහා සංවර්ධනය වෙමින් පවත්නා රටවල් කෙරෙහි මූලිකත්වය ගෙන කටයුතු කරන ආයතනයකි.

ශ්‍රී ලංකාවේ ජලාශවල භාවිතා කරන පන්න හා කරමල් දැල් පිළිබඳ නීති හා සීමා කිරීම් නිසා නීති විරෝධී පන්න කිරීම් පිළිබඳ ධීවරයින් එම දත්ත එකතු කරන්නන් හට ලබාදීම සිදු නොකරයි. ශ්‍රී ලංකාවේ ජලාශවල කුඩා කරමල් දැල් (සෙන්ටි මීටර් 6.9 ට අඩු ඇස් සහිත) හා අනවසර දැල් භාවිතා කරයි. එසේම මාදැල්, තහනම් කරන ලද දැල් හා මොනොෆිලමන්ට් කරමල් දැල් ජලාශ මධ්‍යයේ සිදු කරන අතර, මේවා ජාතික ධීවර සංගණනයන් හට වාර්තා වී නැත. නීති විරෝධී පන්න ක්‍රම ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම වැදගත් වන්නේ එයින් ජාතික මිරිදිය ධීවර නිෂ්පාදනයට සපයන දායකත්වය හා මත්ස්‍ය නිෂ්පාදනය වැඩි කිරීම කෙරෙහි විද්‍යාත්මක මිණුම් දඬු භාවිතා කිරීමයි.

- දත්ත විශ්ලේෂණය සිදුවෙමින් පවතී. මෙහි විද්‍යාත්මක වාර්තා දත්ත විශ්ලේෂණයෙන් පසු ලබා දීමට බලාපොරොත්තු වේ. පහත නිරීක්ෂණ සිදුවිය.

- මොනොෆිලමන්ට් කරමල් දැල්, බරුදැල්, මාදැල්, කුඩා ඇස් සහිත දැල් (කරමල් දැල් අභ්‍යන්තර ජලජ පද්ධති තුල තහනම් ආකාරයෙන් සිදු කරයි.)

- විල්ලු ධීවර කර්මාන්තය හඳුනාගත් අතර, එය වාර්තාගත නොවූ ධීවර කර්මාන්තයන් ය.

- තල්ලු දැල් (අඟල් 3½ ට වැඩි) තහනම් පන්න ක්‍රමය සිදුවෙමින් පවතී.

- රාජාංගනය වැවේ මාදැල් භාවිතය නිසා තිලාපියා නයිලෝටිකාගේ අඩුවීමක් දක්නට ඇත.

- 16mm ඇස් සහිත දැල් ජලාශවල කුඩා තිලාපියා සඳහා භාවිතය සුදුසුය.

ප්‍රගතිය (%) භෞතික : 80 % මූල්‍යමය : 51.5%

**බාධකයන්.**

2005 නොවැම්බර් සිට දත්ත ඇතුළු කිරීම සඳහා පරිගණක හිඟකම.

**ව්‍යාපෘතිය 1.7 : ඒක දේශික මිරිදිය හා විසිතුරු මත්ස්‍යයින්ගේ තත්වයන් උසස් කිරීම උසස් ගහණතාවයන් නැංවීම.**

ශ්‍රී ලංකාවේ අපනයන වෙළඳපොලේ එක් ජනප්‍රිය අංගයක් වන්නේ විසිතුරු මත්ස්‍ය අපනයනයයි. සමහර මිරිදිය විසිතුරු මත්ස්‍ය විශේෂ අපනයනයේදී ඉහළ වටිනාකමක් ඇති සේම, දේශීය වෙළඳපොලේද මේ සඳහා ඉහළ ඉල්ලුමක් ඇත. විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේ නියැලෙන්නන් ඉහළ තත්වයෙන් යුත් පැටවි හා අභිජනන විශේෂ බෝ කිරීම සිදු කරයි. ඔවුන් බිජු රැස් කිරීමේ ඉහළ අගය පැටවුන්ගේ වර්ධන වේගය සේම වඩා හොඳ පැටවි ලබා ගැනීමෙන් හොඳ ලාභයක් උපයා ගනී.

මෙනිසා මසුන්ගේ බිත්තර දැමීමේ වේගය වැඩිවීම පැටවුන්ගේ ප්‍රමාණයන් හා ඉහළ අගයන්ගෙන් යුත් කෘතිම ආහාර භාවිතය පිළිබඳ ඉක්මන් අධ්‍යයනයක් කිරීම වැදගත් වේ.

සුනාමි ව්‍යසනය නිසා එකතු කරගත් පැටවි ගහණයන් විනාශ විය. පැටවි ගහණයන් පාලනය කිරීම සඳහා තෝරාගත් අභිජනන අත්හදා බැලීම් සිදුවිය. අඩු වියදම් කෘතිම ආහාර සැකසීම සිදුවිය.

විශේෂ 15 කට වැඩි විසිතුරු මත්ස්‍ය පැටවි ගහණයන් සංවර්ධනය කිරීම සිදුවිය. මෙම විශේෂ නම්, ඔස්කා *(Astronotus ocellatus)*, ගෝල්ඩ් ෆිෂ් *(Carassius auratus)*, කාප් *(Cyprinces carpio)*, ටෙට්රා විශේෂ *(Paracheirodon spp.)*, බාර්බ් විශේෂ *(Barbus spp.)*, කැට් ෆිෂ් *(Phractocephalus sp.)*, ලෝච් විශේෂ *(Acanthocobitis spp.)*, ෆයිටර්ස් *(Betta splenders)*, ඒන්ජල්ස් *(Pterophyllum reticulata)*, මොලීස් *(Poecillia latpinna)*, ස්වෝඩ් ටේල් *(Xiphophorus helleri)*, ප්ලේටි *(Xiphophorus maculates)* සමහරකි. එසේම විවිධ වර්ග 20 කට වඩා එකතුවේ පවතී.

සිමෙන්ති ටැංකි 100 ක් සෑදීම සඳහා අයවැය ඉදිරිපත් විය තමුත් ටෙන්ඩර් පටිපාටියන්ගේ ප්‍රමාදය නිසා ඉදිකිරීම් සිදු නොවිණි

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 19.4%

**බාධකයන්.**

වාහන නොමැතිකම.
අවුරුද්දේ පළමු මාස 06 සුරතල් මත්ස්‍ය අංශයේ අලුත්වැඩියා කටයුතු සිදුවිය.
ටෙන්ඩර් පටිපාටියන්හි ප්‍රමාදයන්.

**ව්‍යාපෘතිය 1.8 : විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සඳහා වාණිජමය වටිනාකමකින් යුත් විසිතුරු ජලජ පැලෑටි බෝ කිරීම.**

විසිතුරු ජලජ පැලෑටි කර්මාන්තය ලෝකයේ ඉහල ඉල්ලුමක් ඇති කර්මාන්තයකි. මෙම කර්මාන්තය ස්වභාවික පරිසර එකතුවන් මත වඩා ප්‍රධාන වශයෙන් පවතී. එය රටේ ජලජ පැලෑටිවල ජෛව විවිධත්වය කෙරෙහි බලපෑම් ඇති කරයි. කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ බොහෝ විශේෂ ව්‍යාප්තව ඇත. කර්මාන්තයට ප්‍රධාන ප්‍රශ්නය වන්නේ ස්වභාවික ප්‍රජනන ක්‍රියාවලියයි.

මෙම කර්මාන්තයේ ව්‍යාප්තිය සඳහා ගහණයන්ගේ ප්‍රජනනයන් නැංවීම, වැදගත් විශේෂ හා දියුණු ක්‍රම වැඩි දියුණු කිරීම ආදිය වැදගත් වේ.

අඩු වියදම් වගා ක්‍රම, කුඩා නිවැසියන් සඳහා ජනප්‍රිය කරවීම මෙම කර්මාන්තයට වැදගත් වේ

පසුගිය 2004 වසරේ සිදුවූ සුනාමිය නිසා අංශයේ තිබූ පැලෑටි එකතුව විනාශ විය. අම්පාර හා පොලොන්නරුව දිස්ත්‍රික්කයන් හි පාරිසරික අධ්‍යයනයන් සිදුවිය. අවුරුද්ද තුලදී විශේෂ කිහිපයක් එකතු කර ගැනිණි. සුනාමියේ බලපෑම සිදුවූ ටැංකිවල වගා ක්‍රමයන්හිදී පැල ගහණ හා පැල මැරී ගිය අතර, ටැංකි නැවත නැවතත් පිරිසිදු කළද මෙම තත්වය මගහැර ගත නොහැකි විය.

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 19.4%

**බාධකයන්.**

මෙම පර්යේෂණය 2005 අගෝස්තු ආරම්භ විය. සුනාමි බලපෑම් වූ ප්‍රදේශ කෙරෙහි මූලිකත්වය දුනි.
වාහන නොමැතිකම.
අවශ්‍ය රසායනික ද්‍රව්‍ය ගැනීම ප්‍රමාදවීම.
සුනාමිය නිසා උපකරණ වලට වූ හානිය.

**ව්‍යාපෘතිය 1.9 : ස්වභාවික නිෂ්පාදන ලෙස දේශීය කර්මාන්තයේ භාවිතය සඳහා විසිතුරු මත්ස්‍යයින්ගේ වර්ණ වර්ධනය කිරීම පිළිබඳ පරීක්ෂණය.**

අපනයන වෙළඳපොලේදී, අපනයනය සඳහා මසුන් වර්ග කිරීමේදී තීරණායකයක් ලෙස යොදා ගන්නා එක් විශේෂ කාරණයක් වන්නේ මසුන්ගේ වර්ණකයන්ය. මෙම මසුන්ගේ ස්වභාවික වර්ණ වර්ධනය කිරීම සඳහා දේශීයව අඩු වියදම් නිෂ්පාදන භාවිතා කර සිදු කිරීමට පර්යේෂණය සිදු කරයි.

අපනයන තත්වයේ මත්ස්‍ය පැටවු මිලදීගෙන (ගෝල්ඩන්, මොලී) රැකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ පාලනය කිරීම සිදු කරයි. දේශීයව සපයා ගැනෙන කැරට්, පිපිඤ්ඤා ආදිය ආහාර වශයෙන් ලබාදී ඔවුන්ගේ වර්ණ වර්ධනය කෙරෙහි පර්යේෂණ සිදුවිය. මසුන්ට මෙම ආහාර ලබාදෙන අතර, මොවුන්ගේ වර්ණ වර්ධනය නිරීක්ෂණය සඳහා වර්ණ මීටරයක් ලබා ගැනීමට ඉල්ලීමක් කර ඇති අතර, එය සිදු නොවිණි.

ප්‍රගතිය (%) භෞතික : 80 % මූල්‍යමය : 10.2%

**බාධකයන්.**

රුකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයට වාහනයක් නොමැති විය.
වර්ණ මීටරයක් ලබා ගැනීමට නොහැකිවීම.

**ව්‍යාපෘතිය 1.10 : ඉන්දියානු සාගර සුනාමි ව්‍යසනය නිසා ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ තීරයේ වෙරළාසන්න පරිසර පද්ධතියට වූ බලපෑම් අධ්‍යයනය.**

ක්‍රියාකාරකම් පහත ලෙස සිදුවිය.

(i) ඉන්දියානු සාගර සුනාමි ව්‍යසනය නිසා මීගමුව සිට හම්බන්තොට දක්වා වූ දකුණු වෙරළ තීරයේ පාරිසරික පද්ධතියට වූ හානිය පිළිබඳ ඉක්මන් තක්සේරුවක් සිදුවිය.

(ii) සුනාමි ව්‍යසනය නිසා පරිසර පද්ධතියේ මුහුදු පැලෑටි හා ඒවායේ පාරිසරික දත්ත (මීගමුව, රුකව හා මාවැල්ල කලපුවේ) දීර්ඝ අධ්‍යයනයක් සම්පූර්ණ කෙරිණි.

(iii) ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ කඩොලාන ආශ්‍රිත පරිසර පරාමිතිකයන් පිළිබඳ දීර්ඝ අධ්‍යයනයක් සිදු කෙරිණ.

(iv) බේරුවල හා රුකව පරයන් හි පරිසර පද්ධතියේ මුහුදු පැලෑටි වල පාරිසරික පරාමිතිකයන් දීර්ඝ කාලයක් ලබා ගැනීම.

(v) එම පරිසර පද්ධති වල පතුලේ ශාක හා සතුන්ගේ අධ්‍යයනය සම්පූර්ණ කෙරිණි.
අවශ්‍යතාවයන් මත වාර්තා පිළියෙල විය.

**බාධකයන්.**

නැත.

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 73%

**4. ව්‍යාප්ති සේවා.**

(1) කඩොලාන පරිසරය පිළිබඳ පාසැල් ළමුන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් – සිසුන් 300 කට වඩා

(2) ධීවර සමිති හා ධීවරයින් සඳහා දැනුම ව්‍යාප්ත කිරීමේ වැඩසටහන් – පුද්ගලයන් 30 කට.

(3) ජයවර්ධනපුර, රුහුණු හා රජරට විශ්ව විද්‍යාලයන් හි ක්ෂේත්‍ර අධ්‍යයන වැඩසටහන් සිදු කිරීම.

(4) ආවේණික මසුන් බෝ කිරීම, අධීක්ෂණය හා කර්මාන්තයේ යෙදෙන්නන් හා ධීවර අමාත්‍යාංශයට වාර්තා සැපයීම.

(5) පුහුණු වැඩසටහන් තුළින් ආවේණික අභිජනන ක්‍රම පිළිබඳ දැනුවත් කිරීම් – පුද්ගලයන් 60 කට.

(6) වැඩබිම් අධීක්ෂණය හා ගොවිපල ඉදි කිරීම් සඳහා වාර්තා ලබාදීම.

(7) මත්ස්‍ය ගොවිපල සඳහා ජලයේ තත්ව වාර්තා ලබාදීම.

(8) මත්ස්‍ය වගාකරුවන්ගෙන් ලබාගත් නියැදි වලින් රෝග හඳුනා ගැනීම, ප්‍රතිකාර නිර්දේශ කිරීම හා වාර්තා ලබාදීම – පුද්ගලයින් 15 කට.

(9) පුහුණු වැඩසටහන් මගින් විසිතුරු මසුන් අභිජනනය හා කළමනාකරණය – පුද්ගලයින් 200 කට

(10) විසිතුරු මත්ස්‍ය ඇති කරන්නන් සඳහා දත්ත හා තොරතුරු ලබාදීම.

(11) කකුළු, මට්ටි ආශ්‍රිත ප්‍රජාවන් සඳහා දින 02 ක වැඩමුළුව - පුද්ගලයින් 50 කට.

(12) විසිතුරු මත්ස්‍ය පුහුණු වැඩ සටහන් - පුද්ගලයින් 60 කට.

**සම්ප්‍රජානනීය වැඩ සටහන්.**

(1) සේතු සමුදුම් ඇල ව්‍යාපෘතියට අයත් මන්නාරම් ප්‍රදේශයේ කඩොලාන හා මුහුදු පැලෑටි පිළිබඳ තක්සේරු කිරීම.

(2) වෙරළබඩ පරිසර පද්ධතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්.

(3) වෙරළ සම්පත් කළමනාකරණ වැඩසටහනේ ආධාර මත කඩොලාන උද්‍යානයක් සංවර්ධනය කිරීම.

(4) මාතර දිස්ත්‍රික්කයේ පැවති සුනාමි පසු තක්සේරු කමිටු රැස්වීමට සහභාගි විය.

(5) ධීවර අමාත්‍යාංශයේ සංවිධානය කළ මාතර දිස්ත්‍රික්කයේ ජංගම සේවා වැඩසටහනට සහභාගි විය.

(6) කඩොලාන සුරැකීම යන මාතෘකාව යටතේ ධීවර විශ්ව විද්‍යාලයේ සිසුන් සඳහා දේශන පැවැත්වීම.

**ප්‍රකාශන.**

නාරා - සීඩා ජාත්‍යන්තර වැඩමුළුව සඳහා සාරාංශ ඉදිරිපත් විය.

(1) ආසියානු කොස්සා Lates cakarifer ගේ පැටවු තොග කළමනාකරණය - අජිත් කුමාර, පී.ඒ.ඩී.,

(2) රඳවා තබාගත් සමහර ආවේණික මත්ස්‍ය විශේෂයන්ගේ බෝ කිරීමේ හැකියාව සඳහා බලපාන සුදුසු පාරිසරික පරාය හා ජලයේ ගුණාත්මක පරාමිතිකයන්.
පරාක්‍රම, එම්.ජී.අයි.එස්., කිත්සිරි,එච්.එම්.පී., හීනටිගල, පී.පී.එම්., ජයසේකර, එම්.එස්.එස්., රූපිකා, පී.ආර්.එච්.,

(3) විසිතුරු මත්ස්‍ය බෝ කිරීමේ ක්‍රියාවලියේදී බලපාන පොදු රෝග හා ඔවුන්ගේ එම මිනුම් පාලනය කිරීම.
හීනටිගල, පී.පී.එම්., පරාක්‍රම, එම්.ජී.අයි.එස්., ජයසේකර, එම්.එස්.එස්.,

(4) පසුගිය සංවර්ධන ක්‍රියාවලියන් වලදී මීගමුව කලපුවේ මුහුදු තෘණ පරිසර පද්ධතියන්ගේ වෙනස්වීම් පිළිබඳ විශේෂ තත්වයන්.
පහලවත්තආරච්චි, වී., අමරසිංහ, එම්.ඩී., ජයමාන්න, එස්.සී.,

(5) ඉස්සන් ගොවිපල සඳහා ජීව විද්‍යාත්මක ක්‍රම යෙදීම.
කොරයා, ඒ.එස්.එල්.ඊ., ජයසිංහ, ජේ.එම්.පී.කේ.,

(6) ඉස්සන් ඇති කිරීමේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අනාගත ක්‍රමෝපායන්.
කොරයා, ඒ.එස්.එල්.ඊ., ජයසිංහ, ජේ.එම්.පී.කේ.,

(7) විසිතුරු මත්ස්‍ය පැලෑටි කර්මාන්තයේ තත්වයන් හා අනාගත පර්යේෂණ අවශ්‍යතාවයන්.
කොරයා, ඒ.එස්.එල්.ඊ.,

(8) ශ්‍රී ලංකාවේ ග්‍රාමීය අභ්‍යන්තර ජලජීවී වගා පිළිබඳ හම්බන්තොට දිස්ත්‍රික්කය සඳහා විශේෂ සුදුසු සංවර්ධන වැඩ පිළිවෙල හා ජනයාගේ සහභාගිත්වයන්ගේ පෙලඹවීම.
ආරියරත්න, එම්.එච්.එස්.,

(9) පොලොවේ සෑදූ පොකුණු වල *Macrobrachium rossenbergi* හෙවත් යෝධ මිරිදිය ඉස්සා වගා කිරීම පිළිබඳ ජනතාවගේ සහභාගිත්වයෙන් මූලික අධ්‍යයනයක්.
රාජපක්ෂ, ඩබ්.ඩී.ඩබ්.ආර්., ජයමාන්න, එස්.සී.,

(10) *Oreochromis niloticus* හෙවත් නයිල් තිලාපියා පැටවු හා පැටවුන්ගේ නිෂ්පාදන ක්‍රම හඳුන්වාදීම.
ගම්මන්පිල, ජී., සහ සුමනදාස, ඩබ්.ජී.,

**අනෙකුත් අවස්ථා සඳහා සාරාංශ.**

(1) ශ්‍රී ලංකාවේ මුන්දලම ප්‍රදේශයේ ඕලන්ද ඇලේ ඉස්සන්ගේ රෝග පාලනය සඳහා ප්‍රති ජීවක භාවිතය.
කොරයා, ජ්.එස්.එල්.ජ්.,
ආසියානු අභ්‍යන්තර ජලජීවී වගාවේ රෝග පිළිබඳ 6 වැනි සම්මන්ත්‍රණය.
මත්ස්‍ය රෝග අංශය, ආසියානු ධීවර සංගමය, කොළඹ, ශ්‍රී ලංකාව.

(2) ශ්‍රී ලංකාවේ දකුණු වෙරළබඩ තීරයේ මුහුදු කවචයන්ගේ කාලානුරූපී වෙනස්වීම් සඳහා භෞත රසායනික පරාමිතිකයන්ගේ බලපෑම්.
ගම්මන්පිල, එම්., කුමාරණතුංග පී.ආර්.ටී.,

(3) ශ්‍රී ලංකා උසස් විද්‍යා සංවිධානය සඳහා ක්ෂේත්‍ර ක්‍රියාකාරකම් මත පාරිසරික අධ්‍යාපනය - ගුරු වෘත්තිකයන් සඳහා.
කරුණානායක, එස්., පල්ලෙවත්ත, එන්., ජයසූරිය, ටී., සහ ජයමාන්න, එස්.සී.,

**පර්යේෂණ පත්‍රිකා.**

(1) ශ්‍රී ලංකාවේ විශේෂයෙන් වියළි කලාපය සඳහා අඩු වියදම් සහිත කුඩා ප්‍රමාණයේ තිලාපියා ඇති කිරීමේ ස්ථාන වැසි ජලය යොදා ගනිමින් ග්‍රාමීය අභ්‍යන්තර ජලජීවී වගාව -
ආරියරත්න, එම්.එච්.එස්.,
ජාතික විද්‍යා පදනම සඳහා ඉදිරිපත් කෙරිණි
(2) ශ්‍රී ලංකාවේ ජන සහභාගිත්වය සමගින් ග්‍රාමීය අභ්‍යන්තර ජලජීවී වගාව දියුණු කිරීම
ආරියරත්න, එම්.එච්.එස්., හා සිල්වා, පී.කේ.ද. (2005)
ශ්‍රී ලංකා ජලජ විද්‍යා සගරාවට ඉදිරිපත් විය - II වෙළුම.

**පොත්.**

- සුරතල් මසුන් බෝ කිරීම. (මුද්‍රණ තත්වයේ)
- විසිතුරු මත්ස්‍ය කර්මාන්තයේදී ජලය කළමනාකරණය හා ටැංකි පිළියෙල කිරීම. (සිංහලෙන්)

**වාර්තා.**

(1) සුනාමි රළ නිසා වෙරළබඩ පරිසර පද්ධතිය සඳහා බලපෑම පිළිබඳ අතුරු වාර්තාව

(2) සේතු සමුදුම් ඇළ ව්‍යාපෘතිය සඳහා මන්නාරම් ප්‍රදේශයේ කඩොලාන හා මුහුදු තෘණ පිළිබඳ තක්සේරු වාර්තාව

(3) අත්තිඩිය වැවේ මසුන් මියයාම පිළිබඳ වාර්තාව

**වැඩමුළු සඳහා සහභාගිත්වය.**

(1) ඵලදායි පර්යේෂණ යෝජනා ලිවීම මෙහෙයවීම හා ඵලි දැක්වීම පිළිබඳ වැඩමුළුව
(SLAAS) (සහභාගිත්වය 07)

(2) "මත්ස්‍ය රෝග විනිශ්චය හා සෞඛ්‍ය කළමනාකරණ" වැඩමුළුව.
කැලණිය විශ්ව විද්‍යාලය. (සහභාගිත්වය 04)

(3) "ශ්‍රී ලංකාවේ බහු ජලජීවී වගා පද්ධතින් සඳහා කෘෂි රසායනික වල කළමනාකරණය" වැඩමුළුව.
පේරාදෙණිය විශ්ව විද්‍යාලය. (සහභාගිත්වය 01)

(4) ආක්‍රමණශීලී ශාක හා සත්ව සඳහා ජාතික ලැයිස්තුව නැවත සලකා බැලීමේ වැඩමුළුව.

(5) ශ්‍රී ලංකාවේ වාරිමාර්ග සංරක්ෂණය හා කළමනාකරණය පිළිබඳ කෙටි පාඨමාලාව.
පශ්චාත් උපාධි ආයතනය - පේරාදෙණිය.
(සහභාගිත්වය 02)

**පුහුණුවීම් (විදේශ)**

(1) උසස් මිරිදිය ජලජීවී වගාව අභ්‍යන්තර ජලජීවී වගා පර්යේෂණ ආයතනය, තායිලන්තය. (01)

(2) දේශීය මට්ටමේ නිලධාරින් සඳහා පුහුණුව, වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතිය. (01)

**ජාතික.**

(1) SLAAS (03)
(2) SLAFAR (05)

**ජාත්‍යන්තර සම්මේලන.**

ආසියානු අභ්‍යන්තර ජලජීවී වගාවේ රෝග පිළිබඳ 6 වැනි සමුළුව,
ශ්‍රී ලංකාව. (නිලධාරින් 02)

# තොරතුරු තාක්ෂණ අංශය.

## අංශ ප්‍රධානි : ජේ.බී.ජේ.කේ.ගුණරත්න මහතා

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :**

තොරතුරු තාක්ෂණ අංශයේ වගකීම් වන්නේ, ජලජ සම්පත් කළමනාකරණය, සංරක්ෂණය හා සංවර්ධනය පිළිබඳ උනන්දුවක් දක්වන්නන් සඳහා අවශ්‍ය දත්ත පදනමක් සකස් කිරීම හා දත්ත එකතු කිරීම, ක්‍රියාත්මක කිරීම, බෙදා ගැනීම හා ව්‍යාප්තිය කිරීමයි.

අංශය විසින් පරිගණක පද්ධති සංවර්ධනය, අන්තර්ජාල සේවා වැඩි දියුණු කිරීම, භූගෝලීය තොරතුරු පද්ධතිය (GIS), දුරස්ථ සංජානනය, පරිගණක ආශ්‍රිත ආකෘති හා පුහුණුවීම් සිදු කිරීම කෙරේ. ජලජ සම්පත් පර්යේෂණ හා සම්බන්ධ අනෙකුත් ආයතන සමග දේශීය හා ප්‍රාදේශීය වශයෙන් දත්ත පද්ධතින් සම්බන්ධතාවයන් හා වැඩි දියුණු කිරීමේ අංශය විසින් සිදු කරයි.

අවුරුද්දේ මුල් කාර්තුවේදී කාර්ය මණ්ඩලය යොමුවූයේ සුනාමිය නිසා හානි වූ පරිගණක ජාලය අළුත්වැඩියා කිරීම සඳහායි. පුහුණු උපාධි වැඩසටහන යටතේ අළුත් උපාධිධාරී නිලධාරීන් තිදෙනෙකු අංශය වෙත එකතු කෙරිණි.

එක් තොරතුරු නිලධාරියෙක්, ව්‍යාපෘති සහකාර (GIS/RS) 01, ව්‍යාපෘති සහකාර (දත්ත පද්ධති) 01, ව්‍යාපෘති සහකාර (කළමනාකරණ) 01, හා සහකාර ජාල පරිපාලන 01 ලෙස අංශය සමන්විත විය.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :**

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව |
|---|---|---|---|---|
| 1. යෙදවුම් වැඩි දියුණු කිරීම් හා උපකාරක කටයුතු. | 1.1 නාරා ආයතනයේ අන්තර්ජාල කටයුතු සංවර්ධනය හා ඉහළ නැංවීමේ සේවා. | 2.4 | ජේ.බී.ජේ.කේ.ගුණරත්න<br>ජාතක ලොකුගමගේ | අඛණ්ඩව |
| 2. දුරස්ථ පරිලෝකනය හා භූගෝලීය තොරතුරු පද්ධතිය. | 2.1 මීගමුව කලපුව ආශ්‍රිත සංවේදී ප්‍රදේශ කළමනාකරණය කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය සහ දුරස්ථ පරිලෝකනය වැඩි දියුණු කිරීම. | 0.15 | ජේ.බී.ජේ.කේ.ගුණරත්න | 2003 සිට 2007 දක්වා |

**3. කාර්ය සාධනය :**

**ව්‍යාපෘතිය 1.1 : නාරා ආයතනයේ අන්තර්ජාල කටයුතු සංවර්ධනය හා ඉහළ නැංවීමේ සේවා.**

ව්‍යාපෘතිය අඛණ්ඩව තොරතුරු තාක්ෂණය යටිතල සැපයීම නාරා අන්තර්ජාලය හරහා ආයතනයේ තොරතුරු බෙදා හැරීම සිදුවිය. අවුරුද්දේ මුල් කාර්තුව තුළදී සුනාමි බලපෑම නිසා වූ පරිගණක ජාලය කොටස් අනෙකුත් අංගෝපාංග නිරීක්ෂණය හා අළුත්වැඩියා කර යථා තත්වයට පත් කිරීම සිදු කරන ලදී. සුනාමි බලපෑම් වූ ධීවරයන් පිළිබඳ දත්ත පද්ධතියක් ගොඩනගා කෙරිණි.

අන්තර්ජාලය සම්බන්ධ ඊමේල් පද්ධතිය වැඩි දියුණු කෙරිණි. වෙබ් අඩවිය ඉතා උසස් ආකෘතියක් හඳුන්වා දෙමින් නිපදවුනි.

අවුරුද්ද තුළදී අංශය පරිගණක අළුත්වැඩියාව හා ඉහළ තලයට ගෙන ඒමේ වැඩ කටයුතුවල නියැලුනි. CARP ආයතනය හා එක්ව එහි ජාලය සමගින් ආයතනයේ පර්යේෂණ වියදම් පිළිබඳ ඇගයීමක් සිදුකල අතර, එය සම්පූර්ණ කිරීමෙන් අනතුරුව CARP ආයතනය වෙත ඉදිරිපත් කරන ලදී. පරිපාලන අංශය සඳහා වූ පුද්ගල දත්ත පද්ධතිගත කරන ලදී.

අංශය විසින් නාරා ආයතනයේ විවිධ වැඩමුළු සඳහා අවශ්‍ය මුද්‍රණ කටයුතු සඳහා ද සම්බන්ධ වී ක්‍රියා කරන ලදී.

අදාල සැපයුම්කරුවන් සඳහා සැලසුම් පද්ධති ඇතුලත් මෘදුකාංග ලබාදෙන ලදී.

ප්‍රගතිය (%)  භෞතික : 100 %  මූල්‍යමය : 100%

**ව්‍යාපෘතිය 2.1 : මීගමුව කලපුව ආශ්‍රිත සංවේදී ප්‍රදේශ කළමනාකරණය කිරීම සඳහා භූගෝලීය තොරතුරු පද්ධති තාක්ෂණය සහ දුරස්ථ සංජානනය වැඩි දියුණු කිරීම.**

සුනාමිය සම්බන්ධ අමතර වැඩ කටයුතු සඳහා සහභාගී වූ බැවින් අවුරුද්දේ මුල් කාර්තුවේදී ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් ප්‍රමාද විය. මීගමුව කලපුව හා එම වටපිටාව ප්‍රදේශයේ වෙරළබඩ ක්‍රියාකාරකම් හඳුනා ගැනීම සඳහා Landsat ETM හා ප්‍රතිරූප යන ක්‍රම භාවිතා කෙරිණි. කඩොලාන සමූහයන් ඉතා පහසුවෙන් හඳුනාගත හැකි විය. 2002 වසරේ අගෝස්තු මාසයේදී ලබාගත් ප්‍රතිරූපවල උප ජලජ වාසස්ථාන ඉතා පැහැදිළිව දක්නට ලැබුණි.

කොළඹ සිට මීගමුව දක්වා වූ කොරල්පර වල මීටර් 10 ක ගැඹුරට හඳුනාගැනීම් සිදුවිය. අවුරුද්දේ අනෙක් මාසවලට වඩා අගෝස්තු මාසයේදී මුහුදු මට්ටම් අඩු තත්වයක තිබීම නිරීක්ෂණය පහසු කරවිය. මෙනිසා උප ජලජ පරිසර පද්ධති හා කොරල්පර වල දිවි පැවැත්ම හා සීමා වෙන් කිරීම සඳහා අවශ්‍ය චන්ද්‍රිකා රූප අගෝස්තු මාසයේදී ලබා ගැනීම සුදුසුය. වාර්තා පිළියෙල වෙමින් පවතී.

ප්‍රගතිය (%)  භෞතික : 100 %  මූල්‍යමය : 100%

**බාහිර මුදල් සපයන ව්‍යාපෘති.**

ඍතු අනුව ධීවර වගාවන් සිදු කරන ජලාශ හඳුනා ගැනීම. (ඔස්ට්‍රේලියානු මධ්‍යස්ථාන ජාත්‍යන්තර කෘෂිකර්ම පර්යේෂණ ආයතනය මුදල් මත)

තෝරාගත් ජලාශවල වැසි ජල එකතුව ඉහළ අගයක් ගත් නිසා සීමා වෙන් කිරීමේදී ප්‍රශ්ණයකට මුහුණ පාන්නට සිදුවිය. වැසි ජලය එකතුවේ පැවැත්ම හා මත්ස්‍ය නිෂ්පාදනය අතර සැලකිය යුතු සම්බන්ධතාවයක් බලාපොරොත්තු වූ ලෙස සොයා ගැනීමට නොහැකිවිය.

මෙහි ප්‍රතිඵල භූගෝලීය තොරතුරු පද්ධතියට ධීවර හා ජලජ විද්‍යා අවකාශ විශ්ලේෂණ වැඩමුළුවේ දී ඉදිරිපත් වූ අතර, එය වෙළුම 2 හි ප්‍රකාශයට පත්විය.

**සේතු සමුදුම් නාවික ඇළ ව්‍යාපෘතිය.**

අගෝස්තු මස අවසානයේදී සිතියම් නිරීක්ෂණය සඳහා යාපනයේ ක්ෂේත්‍ර චාරිකාවක් සිදුවිය. මේ සඳහා අවශ්‍ය චන්ද්‍රිකා රූප ලබාගැනීම සඳහා විදේශ කටයුතු අමාත්‍යාංශයෙන් ආධාර නොලැබුණි. කෙසේ වුවත්, ලැන්ඩ්සැට් රූප ආධාරයෙන් කොරල්පර වල සිතියම්ගත කිරීම් සිදුවිය. වර්ග කිලෝමීටර් 4.68 ක ප්‍රමාණයක කොරල්පර ප්‍රදේශයක් ආවරණය කෙරිණි.

**4. ප්‍රකාශන.**
**පර්යේෂණ පත්‍රිකා - ජාත්‍යන්තර**

1. ද සිල්වා, එස්.එස්., විජේනායක, ඩබ්.එම්.එච්.කේ., ගුණරත්න, ඒ.බී.ඒ.කේ., සහ අමරසිංහ, යූ.එස්., 2005

තෝරාගත් නිත්‍ය නොවන ජලාශවල වගාවන් පදනම් කොටගත් ධීවර ක්‍රියාකාරකම් සඳහා භූගෝලීය තොරතුරු පද්ධතිය ආශ්‍රයෙන් ඒවායේ අගයන් වැඩි දියුණු කිරීම. ධීවර හා ජලජ විද්‍යාවේ භූගෝලීය තොරතුරු පද්ධතියේ අවකාශ විශ්ලේෂණය. (වෙළුම 2)
ටී. නිෂීඩා, පී. ජේ. කයිලෝලා සහ සී. ඒ. හොලිංග්බර්ග්.
GIS ධීවර හා ජලජ පර්යේෂණ කණ්ඩායම, ජපානය.

**කලාපීය / දේශීය.**

1. ගුණරත්න, ඒ.බී.ඒ.කේ., 2005 ජලජ සම්පත් කළමනාකරණය සඳහා දත්ත හා තොරතුරු, භූගෝලීය තොරතුරු පද්ධතිය හා දුරස්ථ සංජානන ප්‍රවේශය. ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ සම්පත් පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළුවන් සඳහා ඉදිරිපත් කිරීම් පිළිබඳ වැඩමුළුව.
2005 මාර්තු 29 - 31 නාරා, කොළඹ.

2. විජේනායක, ඩබ්.එච්.එම්.කේ., ජයසිංහ, යූ.ඒ.ඩී., අමරසිංහ, යූ.එස්., ගුණරත්න, ඒ.බී.ඒ.කේ., සහ සේන ද සිල්වා (2005)

නිත්‍ය නොවන ජලාශවල ඒ ආශ්‍රිත සංඛ්‍යා හා දුරස්ථ සංජානනීය තාක්‍ෂණය භාවිතයෙන් සොයා බැලීම. ශ්‍රී ලංකාවේ ධීවර හා ජලජ පර්යේෂණ පිළිබඳ ජාත්‍යන්තර වැඩමුළු සඳහා ඉදිරිපත් කිරීම් පිළිබඳ වැඩමුළුව.
2005 මාර්තු 20-31 නාරා, කොළඹ.

**5. පුහුණුවීම් / සම්ප්‍රජානන වැඩසටහන් අඛණ්ඩව.**

1. පේරාදෙණියේ පශ්චාත් උපාධි ආයතනයේදී 2005 දෙසැම්බර් 12 හා 13 දින පැවැත්වූ INFORM වාර්ෂික පුහුණු වැඩසටහන සඳහා ජයරත්න මහත්මිය සහභාගී වූවාය.

**6. අනෙකුත් ක්‍රියාකාරකම්.**

1. INFORM දත්ත පද්ධතිය CARP ව්‍යාපෘතිය වෙත ඉදිරිපත් කෙරිණි.

**සීමා කිරීම්.**

i. මෑතකදී අනුගත කළ කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ක්ෂේත්‍ර අධ්‍යයනය පුහුණුව ලබාදිය යුතුය.

ii. එක් පුද්ගලයෙක් පරිගණක නඩත්තුව සඳහා යෙදෙන බැවින් අනෙක් වැඩ කටයුතු සඳහා බාධා ඇතිවේ.

iii. අවශ්‍ය ඉඩ පහසුකම් හිඟය.

# පුස්තකාල සහ තොරතුරු අංශය.

## අංශ ප්‍රධානී : වී.රූපසිංහ මිය.

. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

ජලජ සම්පත් ක්ෂේත්‍රය ආශ්‍රිත පර්යේෂණ සහ සංවර්ධන කටයුතු සඳහා ප්‍රයෝජනවත් වන තොරතුරු හා දැනුම රැස් කිරීම, බෙදා හැරීම සහ ප්‍රකාශයට පත් කිරීම යන කරුණු සම්බන්ධයෙන් පුස්තකාල සහ තොරතුරු අංශය ප්‍රධාන අංශය වන අතර, ප්‍රධාන වශයෙන් පර්යේෂණ අධ්‍යයනයන් සම්බන්ධ තොරතුරු එකතු කිරීම සංවිධානය හා බෙදා හැරීම සිදුවේ. විද්‍යාඥයන්ගේ විද්‍යාත්මක දැනුම නවීකරණය හා දිරි ගැන්වීම මත විවිධ තොරතුරු සම්පත් හරහා දැනුම බෙදා හැරීම සිදුවේ.

. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරියා | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| . පුස්තකාල සහ තොරතුරු අංශය. | 1.1 ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ තොරතුරු ජාලයක් පුස්තකාලය සම්බන්ධ ගොඩ නැගීම. | 0.34 | වී.රූපසිංහ<br>ඕ.කේ.පී.නන්දන<br>එස්.ලියනාරච්චි | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| | 1.2 පුස්තකාලයට සම්පත් රැස් කිරීම. | 1.93 | වී.රූපසිංහ<br>ඕ.කේ.පී.නන්දන<br>එස්.ලියනාරච්චි | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| | 1.3 සම්පත් බෙදා ගැනීම. | 0.70 | වී.රූපසිංහ<br>ඕ.කේ.පී.නන්දන<br>එස්.ලියනාරච්චි | 2005 ජනවාරි | 2005 දෙසැ: |
| . පුස්තකාල සහ තොරතුරු අංශය. | 2.1 ධීවර හා ජලජ සම්පත් සම්බන්ධ නාරා ප්‍රකාශණය විද්‍යාත්මක ප්‍රකාශණ එළි දැක්වීම. | 0.4 | එස්.සී.ජයමාන්න<br>එන්.සුරේෂ් කුමාර්<br>ඕ.කේ.පී.නන්දන | අඛණ්ඩව | |

. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1.1 : ශ්‍රී ලංකාවේ ජලජ සම්පත් ක්ෂේත්‍රයට සම්බන්ධ තොරතුරු ජාලයක් පුස්තකාලය සම්බන්ධ ගොඩ නැගීම.**

ව්‍යාපෘතියේ අරමුණු මෙසේය.

a) ජාතික ජලජ සම්පත් පිළිබඳ උනන්දුවන අයෙකු හට නාරා ආයතනයේ පුස්තකාලයට නොපැමිණ ඒ පිළිබඳ තොරතුරු දැන ගැනීම සඳහා මං සැලසීම.

b) ඔවුන්ගේ අවශ්‍යතාවයන් සඳහා තොරතුරු ලබා ගැනීමට මල්ටි මීඩියා පහසුකම් ලබාදීම හා පුස්තකාල තොරතුරු සපයාදීමට ක්‍රියා කිරීම.

පරිගණක ගත කොට ඇති ග්‍රන්ථ නාමාවලි පද්ධතිය නාරා වෙබ් අඩවියට ගොස් දැන ගැනීම
වෙබ් අඩවිය : WWW.nara.ac.lk

විවිධ ආයතනයන් හට සම්බන්ධ උපාධි අපේක්ෂකයන් හා විද්‍යාඥයින් 1013 දෙනෙකු හට පුස්තකාල පහසුකම් ලබා දී ඇත.

ප්‍රගතිය (%) භෞතික : 60 % මූල්‍යමය : 70%

**ව්‍යාපෘතිය 1.2 : පුස්තකාලයට සම්පත් රැස් කිරීම.**

ප්‍රකාශන හා පොත් මිලදී ගැනීම් සඳහා දායක විය.
මිලදී ගත් ප්‍රකාශන හා මුදල්වල විස්තර පහත වේ.

**පොත්.**

1. Tam, N.F.Y. හොංකොං හි කඩොලාන පිලිබඳ ක්ෂේත්‍ර මගපෙන්වීම ACC 4514
2. Tam, N.F.Y. හොංකොං කඩොලාන ACC 4514
3. Valavanis, vasisd . ධීවර හා සාගර විද්‍යාවේ භූගෝලීය තොරතුරු පද්ධතිය. ACC 4531

**ප්‍රකාශන.**

1. මිරිදිය ජීව විද්‍යාව වෙළුම 5.0 (1-12)
2. ධීවර සාගර විද්‍යාව වෙළුම 14 (1-3)
3. මිරිදිය වගා පෝෂණය වෙළුම 11 (1-6)
4. ධීවර කළමනාකරණය සහ පරිසර විද්‍යාව - වෙළුම 12 (1-6)
5. රිවර්ස් ඩයිජෙන්ට් (පෙබරවාරි - දෙසැම්බර්)
6. මත්ස්‍ය වගාව වෙළුම 241 වෙළුම 250
7. ටයිට්ස් වෙළුම 165 (1-25) වෙළුම 166 (1-22)
8. ෆෝවුන් වෙළුම 151 (1-11) වෙළුම 152 (1-10)

ප්‍රගතිය (%) භෞතික : 50 % මූල්‍යමය : 50%

**ව්‍යාපෘතිය 1.3 : සම්පත් බෙදා ගැනීම.**

ජලජ සම්පත් ආශ්‍රිත පර්යේෂණ ලිපි පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි ආයතනයෙන් එකතු කර ගන්නා ලදී.

01. තාමරත්න, එස්.වයි., - අපවිත්‍රවීම් තක්සේරු කිරීම.

02. සිල්වා, ඊ.අයි.එල්., - අපවිත්‍රවීම් සහ ජීව විද්‍යාත්මක විවිධත්වය.

03. රාමසාමි, එම්.එස්., - අපවිත්‍රවීම් වසංගත රෝග හා අධ්‍යයනය.

04. වීරසූරිය, එස්.වී.ආර්., සහ දිසානායක, සී.වී., - ශ්‍රී ලංකාවේ පානීය ජලයේ රසායනික තත්වයන්.

05. මුණවීර, පී.කේ., - කෘෂි රසායන හා අහිතකර පාරිසරික බලපෑම්.

06. මුණවීර, එල්., - ගෝලීය උණුසුම් වීමේදී ශ්‍රී ලංකාවේ තත්වය.

07. ෆොන්සේකා, පී.එන්., පරිසරයට හිතකර ශක්ති ප්‍රභවයන්.

08. විත්‍රවදිවේළු, කේ., - යාපනය කලපුවේ යෝග්‍ය කකුළුවන් හා ඔවුන්ගේ විශේෂ විවිධත්වයන් ධීවර කර්මාන්ත අංශයන්.

09. රවීන්ද්‍රන් අන්තරායකර ඖෂධ සොයා ගැනීම සඳහා අඨ මුගටියන් යොදා ගැනීම.

10. විත්‍රවදිවේදි, කේ., - යාපනය කලපුවේ ඉස්සන් කර්මාන්තය සඳහා භාවිතා කරන ප්‍රධාන ධීවර පන්නවල කාර්යක්ෂමතාවය.

11. වික්‍රමසිංහ, යූ., සහ ඩයස්, ආර්.කේ.එස්., බේරේ වැවේ තිරිතදිග ප්‍රදේශයේ Chironomid කීටයන්ගේ විවිධත්වයන් හා පාරිසරික බලපෑම්. (සාරාංශය පමණි.)

12. දිසානායක, සී.බී., සම්පූර්ණ පාරිසරික විද්‍යාව.

ප්‍රගතිය (%) භෞතික : 60 % මූල්‍යමය : 60%

**4. විද්‍යා සඟරා එළි දැක්වීම.**

නාරා සංස්කාරක මණ්ඩලය පත්කර නොතිබුණු අතර, ආචාර්ය එස්.සී.ජයමාන්න හා එන්.සුරේෂ් කුමාර් සංස්කාරක කමිටුව ලෙස පත් කෙරුණි. මැයි සිට සැප්තැම්බර් දක්වා පමණක් ක්‍රියාත්මක වූ මෙම කමිටුව කලමනාකාරිත්වය අහෝසි කරන ලද අතර, විද්‍යා සඟරාව එළි දැක්වීම සිදුකළ නොහැකි විය.

මැයි සිට සැප්තැම්බර් දක්වා කමිටුව විසින් ඉටු කරන ලද කාර්යයන් පහත දැක්වේ.

නාරා වාර්ෂික සඟරාව 37 වෙළුම සඳහා පර්යේෂණ පත්‍රිකා කැඳවන ලදී. ලැබුණු පත්‍රිකා 08 ක් තක්සේරු කර නැවත කතෘ වරුන් වෙත බාර දෙන ලදී.

(i) විසිතුරු මසුන් අභිජනනය.
(ii) ආවේණික විසිතුරු මසුන් අභිජනනය.
(iii) මඩ පොකුණු සැකසීම.
(iv) විසිතුරු මත්ස්‍ය වගාවේදී ඇතිවන ගැටළු.

යන පත්‍රිකා සංස්කරණය කරන ලදී.

ප්‍රගතිය (%) භෞතික : 80 % මූල්‍යමය – භාවිතා නොකරන ලදී.

**ව්‍යාපෘතිය 1.4 : ඉස්සන්ගේ සෞඛ්‍ය හා කලමනාකරණය.**

රෝග ගතවූ ඉස්සන් පරිසරයට මුදා හැරීම ගොවීන් විසින් නොකළයුතු වුවද, තවමත් ඔවුන් එය නැවතීම බලාපොරොත්තු වුවද සිදුවී නැත. රෝග කාලය තුළදී පරිසරයේ හා ගංමෝය වල ඉස්සන්ගේ එම ප්‍රමාණයන් ඉහළ යාමක් දක්නට ඇත. වගා කරන ලද ඉස්සන්ගේ සුදු පුල්ලි රෝගයට අමතරව වර්ෂය පුරාවට වෙනත් රෝග වාර්තා වී ඇත.

වගා කරන ලද පොකුණු තුල බැක්ටීරියා තත්වයන් හඳුනා ගැනීම සඳහා රෝග පවතින කාලය තුල දීර්ඝ වශයෙන් අධ්‍යයනයක් කළ යුතුය. පරිසරයේ ඇති පොකුණු වලට පරීක්ෂාව සඳහා යෙදූ රසායනික ද්‍රව්‍යයන් නිසා පරිසරයේ හා අනෙකුත් කවච සතුන්ට වන බලපෑම දීර්ඝ ලෙස අධ්‍යයනය කළ යුතුය.

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 89.5%

# සමුද්‍ර ජීව සම්පත් අංශය.

## අංශ ප්‍රධානි : ආචාර්ය චම්පා අමරසිරි.

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

සජීවී සමුද්‍රික සම්පත් හා පරිසර පද්ධති ආශ්‍රිත කළමනාකරණය, සංවර්ධනය සහ සංරක්ෂණය කරා යොමු වූ පර්යේෂණ දියත් කිරීමේ වගකීම සමුද්‍ර ජීව සම්පත් අංශයට පැවරී ඇත.

ප්‍රධාන අංශ 2 කට පර්යේෂණ දියත් කෙරිණි.

(1) ධීවර සම්පත් තිරසාර ලෙස භාවිතා කිරීම.
(2) පාරිසරික වශයෙන් වැදගත් සමුද්‍ර වාසස්ථාන හා සම්පත් සංරක්ෂණය හා කළමනාකරණය.

පර්යේෂණ වැඩසටහන් 3 ක් ලෙස සංවිධානය කෙරිණි. ධීවර සම්පත් තක්සේරු කිරීම සහ කළමනාකරණය, කොරල්පර සංරක්ෂණය සහ කළමනාකරණය කිරීම, කැස්බෑ සම්පත් කළමනාකරණය සහ සංරක්ෂණය කිරීමයි. 2005 වසරේදී පර්යේෂණ ව්‍යාපෘති 09 ක් දියත් වූ අතර, ඒවා සම්පූර්ණ කරන ලදී. අංශයේ කාර්ය මණ්ඩලය පර්යේෂණ නිලධාරීන් 09 දෙනෙකු, පර්යේෂණ සහකාරවරුන් 11 දෙනෙකු, නියැදිකරුවන් 12 දෙනෙකු, කිමිදුම් සහකරුවන් දෙදෙනෙකු, එක් පර්යේෂණාගාර සහායකයකු, දත්ත නිවේශක ශිල්පීන් දෙදෙනෙකු, එක් යතුරු ලේඛිකාවක සහ කම්කරුවන් දෙදෙනෙකුගෙන් සමන්විත වේ. පර්යේෂණ ව්‍යාපෘති සකස් කිරීම, ක්‍රියාත්මක කිරීම හා වාර්තා සැකසීමේ වගකීම පර්යේෂණ නිලධාරීන් වෙත පැවරී ඇති අතර, ක්ෂේත්‍රීය දත්ත රැස් කිරීමෙන් පර්යේෂණ කටයුතු වලට සහාය දීම, දත්ත රැස්කර තබා ගැනීම, මත්ස්‍ය නියැදි විශ්ලේෂණය කිරීම යනාදිය සිදු කිරීමේ වගකීම පර්යේෂණ සහකාරවරුන් සහ කිමිදුම් සහායකයන් වෙත පැවරී ඇත. දත්ත පදනම් යාවත්කාලීන කිරීම සඳහා අක්වෙරළ ධීවර කර්මාන්තය ආශ්‍රිත දත්ත සහ තෝරාගත් වෙරළාසන්න ධීවර පත්න ආශ්‍රිත දත්ත රැස් කිරීම සඳහා නියැදිකරුවන් අනුයුක්ත කොට ඇත. අංශය සතු දත්ත පදනම් පවත්වා ගැනීම දත්ත නිවේශක ශිල්පීන් වෙත පැවරී ඇත.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරීන් | කාලසීමාව |
|---|---|---|---|---|
| 1. ධීවර සම්පත් තක්සේරු කිරීම සහ කළමනාකරණය. | 1.1 විශාල ප්‍රමාණයේ උපතිතල මත්ස්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයනය. | 1,566,000 | සී.අමරසිරි | අඛණ්ඩ ව්‍යාපෘතියකි. |
| | 1.2 වෙරළාසන්න මුහුද ආශ්‍රිත කුඩා මත්ස්‍ය සම්පත තක්සේරු කිරීම සහ කළමනාකරණය. | 1,100,000 | පී.ඒ.ටී.ප්‍රනාන්දු | අඛණ්ඩ ව්‍යාපෘතියකි. |
| | 1.3 කාලානුරූපීව සිදු කරන ධීවර කර්මාන්ත හා ඒ ආශ්‍රිත පාරිසරික පරාමිතිකයන් විමර්ශනය කිරීම. | 180,000 | වී.සමරවීර | 2005 |
| | 1.4 පොකිරිස්සන් කර්මාන්තයේදී අතුරු එකතුවක් මත්ස්‍ය ආහාරයක් ලෙස යොදා ගැනීම හා එය සංවර්ධනය කිරීම. | 750,000 | පී.ඒ.ඒ.ටී.ජයවර්ධන | 2004 ජනවාරි සිට 2005 දෙසැම්බර් |
| | 1.5 සපත්තු සිංගිත්ගේ මූලික ගහණ ඇස්තමේන්තු කිරීම හා බිත්තර මුදා හැරීමේ අවස්ථා අධ්‍යයනය. | 192,000 | යූ.එස්.පී.කේ.ලියනගේ | 2004 ජනවාරි සිට 2005 |

**ව්‍යාපෘතිය 1.3 : කාලානුරූපීව සිදු කරන ධීවර කර්මාන්ත හා ඒ ආශ්‍රිත පාරිසරික පරාමිතිකයන් විමර්ශනය කිරීම.**

ශ්‍රී ලංකාවේ කාලානුරූපීව සිදු කරන බොහෝ ධීවර කර්මාන්ත වේ. මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ එසේ කාලානුරූපීව සිදු කරන ධීවර පන්න ක්‍රමවල පාරිසරික හා ජීව විද්‍යාත්මක පරාමිතිකයන් විමර්ශනය කිරීමයි. පුත්තලම, ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර දිස්ත්‍රික්කයන් හි හා මීගමුව හා දකුණු ප්‍රදේශයේ (මොරල්ලා, පියාමැස්සා, සාවාලයා හා හබරලියා) මසුන්ගේ අස්වැන්න හා පරිශ්‍රමයන්ගේ දත්ත තොරතුරු එකතු කිරීම සිදුවිය. මොරල්ලන්ගේ ආහාර ගන්නා පරිසරය පිළිබඳවද, සාවාලයන්ගේ ප්‍රජනනයන් පිළිබඳවද අධ්‍යයනයන් සිදුවිය. දත්ත එකතු කර ඒවා පරිසනක ගත කොට විශ්ලේෂණය සිදුකර වාර්තා පිළියෙල වෙමින් පවතී.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 103.47%

**ව්‍යාපෘතිය 1.4 : ඉස්සන් කර්මාන්තයේදී අතුරු එකතුවන් මත්ස්‍ය ආහාරයක් ලෙස යොදා ගැනීම හා එය සංවර්ධනය කිරීම.**

කල්පිටිය, මන්නාරම හා යාපනය ප්‍රදේශයන්හි ඉස්සන් සඳහා ට්‍රෝලිං කර්මාන්තයේදී වාර්ෂික අතුරු එකතුවන් පිළිබඳව අධ්‍යයනය සිදුවිය. මන්නාරම හා පෘතුගාල බොක්ක ප්‍රදේශයේ ඉස්සන්ගේ වාර්ෂික අතුරු එකතුවන් මෙට්‍රික් ටොන් 360 ක් වශයෙන් පිළිවෙළින් ඇස්තමේන්තුගත විය. මෙම ඉස්සන් සැකසීමේ කර්මාන්තයේදී අපතේ යන ප්‍රමාණය වර්ෂයකට ටොන් 600 ක් පමණ වේ.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 42.62%

**ව්‍යාපෘතිය 1.5 : සපත්තු සිංගින්ගේ මූලික ගහණ ඇස්තමේන්තු කිරීම හා බිත්තර මුදා හැරීමේ අවස්ථා අධ්‍යයනය.**

ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ පොකිරිස්සන් අස්වැන්නෙන් 82% ක ප්‍රමාණයක් ඇන්කර සපත්තු සිංගි හෙවත් *P.homorus* වේ. බිජු ලෑ ගැහැණු පොකිරිස්සන්ගේ (කටුවේ දිග 6cm ට වඩා අඩු හා මුළු දිග 6cm ට වඩා අඩු) අල්ලනු ලැබූ අස්වැන්න අධ්‍යයනයේදී ලක්ෂණයක් වී තිබුණත් වැඩි ප්‍රමාණයක් එම දිග තත්වයන්ගේ අසුවී තිබීමයි. අධ්‍යයනයේදී අරමුණු ලෙස සොයා ගත්තේ බිජු ලෑ ගැහැණු කුඩා පොකිරිස්සන් ගහණ ඇල්ලීම අහිතකර තත්වයක් ලෙස පෙනී යාමයි.

මෙහි මූලික අත්හදා බැලීමක් ලෙස කුඩා ප්‍රමාණයේ පොකිරිස්සන් රුකව ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ සිමෙන්ති ටැංකිවල දැමූ අතර, කුඩා ප්‍රමාණයේ පොකිරිස්සන් 4 දෙනෙකු ඔවුන් ගේ ගහණයන් අධ්‍යයනය සඳහා තංගල්ලට නුදුරු මුහුදේ කූඩු තුල රැඳවීමයි.

ඔවුන්ගේ ආහාර සඳහා දිනකට දෙවරක් බැගින් මට්ටින් දෙන ලදී. (10% ක ශරීර ප්‍රමාණයේ බර) සිමෙන්ති ටැංකිවල DO සහ ලවණතාවය පිළිවෙළින් 7.8- 9 ppt හා 3.3 - 3. 5 ppt විය. ශරීරයන්ගේ දිග හා බර සෑම දිනකම වෙන වෙනම මනින ලදී.

ගැහැණු සතුන් විසින් බිජු ලන ලද නොමේරූ බිත්තර ඒවායේ පැටවුන් එළියට පැමිණීමට ගතවන කාලය තීරණය කිරීම සඳහා ගබඩා කොට තබන ලදී. බිත්තර මේරීම ඒවායේ වර්ණය වෙනස්වීමත් සමගම ගන්නා ලද කාලයන් හා එළියට පැමිණෙන කාලයන් තීරණය කරන ලදී.

මාස 08 ක පමණ කාලයක් අධ්‍යයනයේදී සිමෙන්ති ටැංකිවල සිටි කුඩා පොකිරිස්සන්ගේ සැලකිය යුතු වැඩීමක් දක්නට නොලැබුනි. ගැහැණු සතුන් විසින් බිජු ලන ලද බිත්තර මෝරා දින 24 සිට 30 දක්වා කාල පරාසයකදී පැටවුන් පැමිණෙන බව පරීක්ෂණයේදී පෙනී ගියේය. මෙම කාලසීමාවේදී බිත්තර ලා තැඹිලි පැහැයේ සිට තද තැඹිලි පැහැය දක්වාද, පසුව දුඹුරු වර්ණයද ගන්නා බව පෙනිනි.

ප්‍රගතිය (%) භෞතික : 80 % මූල්‍යමය : 51.8%

| | | | |
|---|---|---|---|
| 1.6 පත්ලේ සරණ මත්ස්‍ය සම්පත් කලමනාකරණය හා සංවර්ධනය | 1,274, 000 | ආර්.මල්දෙණිය | 2004 ජනවාරි සිට 2007 දෙසැම්බර් |
| 1.7 විද්‍යාත්මක පදනමක් මත මුහුදු කැස්බෑවුන් සංරක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙලක් ගොඩ නැගීම. | 662, 000 | ආර්.මල්දෙණිය ඩී.හේරත් | 2003 සිට 2006 |
| 1.8 කොරල් පර හා ඒ ආශ්‍රිත ජීවීන් පිළිබඳ අධ්‍යයනය | 500, 000 | ඒ.රාජසූරිය | අඛණ්ඩ ව්‍යාපෘතියකි. |
| 1.9 අපනයනය මත පදනම් වූ ධීවර කර්මාන්ත අධ්‍යයනය (හක් බෙල්ලන්, පොකිරිස්සන් හා විශාල ප්‍රමාණයේ පත්ලේ සරණ මසුන්) | 1,225, 000 | ආර්.මල්දෙණිය | 2004 සිට 2006 |
| 1.10 | 690, 000 | | |

### 3. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1.1 : විශාල ප්‍රමාණයේ උපනිතල මත්ස්‍ය සම්පත් පිළිබඳ අධ්‍යයනය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, අක්වෙරළ ධීවර කර්මාන්තයේ විශාල ප්‍රමාණයේ උපනිතල මසුන්ගේ දත්ත එක්රැස් කිරීම, තොග තක්සේරු කිරීම හා උපයෝජන මට්ටම් තක්සේරු කිරීම් මත දත්ත පදනමක් කලමනාකරණය කිරීමයි. බස්නාහිර, දකුණ හා නැගෙනහිර වෙරළ තීරයේ කල්පිටිය සිට ත්‍රිකුණාමලය දක්වා වූ ප්‍රධාන මත්ස්‍ය ගොඩබෑම් 6 කදී ස්ථිර නියැදිකරුවන් 12 දෙනෙකු යොදවා දත්ත එකතු කිරීම ක්‍රියාත්මක විය. විවිධ යාත්‍රා වර්ග ආශ්‍රිත තෙලු අස්වැන්නේ ප්‍රගතිය, දිග හා සංඛ්‍යානයන් විශේෂ විවිධත්වය හා ඒ ආශ්‍රිත ජීව විද්‍යාත්මක තොරතුරු එකතු කිරීම හා (Pela gos) 'පෙල ගොස්' යන දත්ත පද්ධතියට ඒවා ඇතුල් කිරීම සිදුවිය. 2005 වසරේදී විශාල මත්ස්‍ය සම්පත් පිළිබඳ දත්ත පද්ධතිය සැකසීමේදී විවිධ වෙනස්කම් සිදුකල අතර, එහි දත්ත විශ්ලේෂණය හා නිෂ්පාදන තක්සේරු කිරීම ක්‍රමානුකූලව සිදුවිය. 2005 වසරේදී සියලුම දත්ත ඇතුල් කිරීම සිදුවූ අතර, නිෂ්පාදන අගයයන් තක්සේරු කිරීම සිදු කරන ලදී.

නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේදී පෙනීගිය කරුණක් වූයේ, අවුරුද්දේ අවසාන භාගයේදී ඉහල ප්‍රවනතාවයක් දක්නට ලැබීමයි. මීට හේතු වූයේ ප්‍රධාන වශයෙන් සෑම ප්‍රදේශයකින්ම ටූනා මසුන් අසුවීමයි. දත්ත පද්ධතිය වර්ධනය කළ අතර, වාර්ෂික දත්ත සාරාංශය ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට හා IOTC ආයතනයට ඉදිරිපත් කරන ලදී. මෙම ව්‍යාපාතිය එනම් දත්ත පද්ධතිය කලමනාකරණය හා නිෂ්පාදන ඇස්තමේන්තුගත කිරීම අඛණ්ඩ ව්‍යාපෘතියක් වන අතර, ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය හා අනුබද්ධ අධිකාරීන් වගකීම දරයි.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 64%

**ව්‍යාපෘතිය 1.2 : වෙරළාසන්න මුහුද ආශ්‍රිත කුඩා මත්ස්‍ය සම්පත තක්සේරු කිරීම සහ කලමනාකරණය.**

කල්පිටිය සිට ත්‍රිකුණාමලය දක්වා වූ වෙරළාසන්න මුහුදේ තෝරාගත් මත්ස්‍ය ගොඩබෑම් ස්ථානවලදී දත්ත එකතු කිරීමේ වැඩසටහන සිදු කෙරිණි. සමුද්‍ර ජීව විද්‍යා අංශයේ පර්යේෂණ නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ පර්යේෂණ සහකාරවරුන් හා ආදර්ශකරුවන් විසින් දත්ත එකතු කරන ලදී. අවශ්‍ය තොරතුරු මත යාත්‍රා විශේෂයෙන් ධීවර ක්‍රමයන්හි දත්ත අස්වැන්න හා විශේෂ මිශ්‍රණයන් හි දත්ත වාර්තාගත කෙරුණි. ඊට අමතරව, මසුන් අල්ලන ප්‍රදේශයේ ගැඹුර භාවිතා කරන පන්න සිදුකරන පන්න වාර ගණන හා භාවිතා වන උපකරණ වල ප්‍රමාණයන් (දැල් ප්‍රමාණය හා දැල් ඇස්වල විශාලත්වය ආදිය) සහ යාත්‍රාවල පන්න සිදු කරන කාලය ආදිය වාර්තාගත කෙරුණි. එහි කොටසක් ලෙස අධ්‍යයනය සිදු කරන ප්‍රදේශයේ එම කාලය සිදු කරන ධීවර පන්න පරිශ්‍රමයන් යාත්‍රා හා භාවිතා කරන ආම්පන්න ආදිය අධීක්ෂණය කෙරිණි. වාණිජමය අතින් වැදගත් විශේෂිත මසුන්ගේ දිග මනින ලදී.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 58.68%

**ව්‍යාපෘතිය 1.6 : පත්ලේ සරණ මත්ස්‍ය සම්පත් කළමනාකරණය හා සංවර්ධනය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, ධීවර කර්මාන්තයේ නිෂ්පාදනය සඳහා පත්ලේ සරණ මත්ස්‍ය සම්පතේ අස්වැන්න නෙලීම, යෙදීම, විශේෂ හා ප්‍රමාණයන්හි විවිධත්වයන් වල දත්ත රැස්කිරීම වාගේම එහි සමාජ, ආර්ථික දත්ත රැස් කිරීම මගින් ධීවර තක්සේරු කිරීම් හා කළමනාකරණය සිදු කිරීමයි. රටේ වයඹ, බස්නාහිර හා දකුණු වෙරළ තීරයේ ප්‍රධාන ධීවර ගොඩබෑම් වන කන්දකුලිය, හලාවත, මීගමුව, බේරුවල, හම්බන්තොට සහ කිරින්ද ප්‍රදේශ ආවරණය වන පරිදි දත්ත රැස්කිරීම සිදුවිය. නිෂ්පාදනය ඇස්තමේන්තු කිරීමේදී 2005 වසරේදී පෙනීගිය කරුණක් වූයේ 2004 වඩා සැලකිය යුතු ලෙස අඩුවීමක් වී තිබීමයි. මෙයට හේතු වූයේ සුනාමි ව්‍යසනය හේතුවෙන් ධීවර පන්න හා යාත්‍රා විනාශවීම නිසා රැකියාවේ යෙදුණු ප්‍රමාණය අඩුවීමයි. සුනාමිය නිසා වාසස්ථානවලට වූ හානියද මෙම පහත වැටීමට බැලපෑවේය.

මෙම ව්‍යාපෘතිය යටතේම, ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ කිරින්දට තුදුරුව කෘතිම පරයක් නිර්මාණය කර සුළු ධීවර කාර්මිකයන් සඳහා සුලභ මත්ස්‍ය බිමක් ඇති කිරීම අරමුණු කොට සිදුවිය. මෙම කෘතිම පරය තැවත වැඩිදියුණු කර විනෝදය සඳහා මසුන් මැරීමේ අවස්ථාවන් සඳහාද භාවිතයට ගත හැක. මෙම පරය සැදීම සඳහා භාවිතා කරන ලද ටයර් වලට කොන්ක්‍රීට් සිමෙන්ති පිරවීම සිදු කරන ලදී. මුහුද වලාල කාලය පැමිණි විට මෙම ටයර් ඇතිරීම සිදු කිරීමට බලාපොරොත්තු වේ.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 54.15%

**ව්‍යාපෘතිය 1.7 a. : විද්‍යාත්මක පදනමක් මත මුහුදු කැස්බෑවුන් සංරක්ෂණය කිරීම සඳහා වැඩපිළිවෙල ගොඩ නැගීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණු වන්නේ, වර්තමානයේදී මුහුදු කැස්බෑවුන්ගේ පැවැත්ම සඳහා බලපාන තර්ජනයන් හඳුනා ගැනීම, කැස්බෑ සංරක්ෂණාගාරවල වඩා ඵලදායි හා වගකීම් සහිත කැස්බෑවුන් ඇති කිරීමේ ක්‍රමවේදයන් සකස් කිරීම, සංරක්ෂණය හා කළමනාකරණය සඳහා උපදේශ ඉදිරිපත් කිරීමයි. කන්දකුලිය සිට හම්බන්තොට දක්වා වූ කැස්බෑ කැදලිවල දත්ත එකතු කිරීමට සිදුවිය. අධ්‍යයනයට ලක් කළ ප්‍රදේශයේ පළමු මාස 3 – 4 කාලයේදී කැස්බෑ කැදලිවල සීඝ්‍ර අඩුවීමක් දක්නට ලැබුනි. මෙසේ වී ඇත්තේ සුනාමි ව්‍යසනය නිසා වෙරළයන්ට වූ හානි නිසාය. කෙසේ වුවත් ඊට පසු වැල්ලවත්ත, මොරටුව, ලුනාව වැනි ප්‍රදේශවල වෙරළ සඳහා කැස්බෑවා පැමිණීම වාර්තා විය. ප්‍රධාන වශයෙන් කැස්බෑ කැදලි ඇත්තේ ඉඳුරුව, කහදාමෝදර, ගොඩවාය, වලවමෝදර හා උස්සන්ගොඩ ප්‍රදේශ වුවත් අවුරුදු කිහිපයකටවත් පෙර කී ප්‍රදේශවල කැස්බෑ කැදලි පිළිබඳ වාර්තා නොවුනි.

සංරක්ෂණාගාර සඳහා ක්‍රමවේදයන් සකස් කර වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට නීතිගත කිරීම හා ක්‍රියාත්මක කිරීම සඳහා ඉදිරිපත් කෙරුණි.

**ව්‍යාපෘතිය 1.7 b. : ශ්‍රී ලංකාවේ සමුද්‍ර පිවින්ගේ ජානමය සංයුතිය අධ්‍යයනය.**

මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වූයේ අණුක ක්‍රමයක් සකස් කර එමගින් ශ්‍රී ලංකාවේදී හමුවන කැස්බෑ විශේෂ හඳුනාගැනීම සඳහා භාවිතා කිරීමයි. මේ සඳහා ගාල්ල දිස්ත්‍රික්කය, මීගමුව දිස්ත්‍රික්කය, හලාවත, කල්පිටිය, කන්දකුලිය ප්‍රදේශවල අධ්‍යයනයන් සිදුවිය.

RAPD විශ්ලේෂණයේදී RAPD 15 ක් භාජනය කළ අතර, OPA-4 හා OPG-2 හි පැහැදිලි වෙනස්කම් නිදර්ශන සෑම විශේෂයන් සඳහාම විය. එම නිසා මෙම විශේෂ නිදර්ශන සෑම විශේෂයන් සඳහාම හඳුනාගැනීම සඳහා භාවිතා කිරීමට හැකි වේ. විශේෂ 4 ක මයිටකොන්ඩ්‍රියම පාලන ප්‍රදේශයේ විශාලකොට නිරීක්ෂණය කෙරුණි.

------- අධ්‍යයනය සඳහා අනුක්‍රමණයන් 5 ක් (GT3, LH1, HB3, OR3 හා දෙමුහුන්) එකිනෙක අතර සිදුවිය. 77% ක් --------- අනුක්‍රමණයන් 5 අතර සිදු කෙරුණි. අනුක්‍රමණයන් 5 හි පෙන්වන පරිදි ජානවංශ ගස සැකසූ විට ඔලිව් රෙඩ්ලි විශේෂයේ කොළ කැස්බෑවන්ට ආසන්නවද. ඔළුගෙඩි හා පොතු කැස්බෑවුන් අනෙක්වාට ආසන්නවද දක්නට හැකිවිය. මෙම ගස් අනුව දෙමුහුම ආසන්න වන්නේ ඔලිව් රෙඩ්ලි විශේෂයටයි. ජාන බැංකුවෙන් ලබාගත් ශ්‍රී ලංකාවේ ඔලිව් රෙඩ්ලි හා පැසිපික් කලාපයේ කොළ

කැස්බෑවා හා පොතු කැස්බෑවන්ගේ දෙමුහුන් ලබා ජානවංශ ගස සැකසූ විට එක සමාන ප්‍රතිඵල ලැබුණි. මෙහි පර්යේෂණ වාර්තාව සම්පූර්ණ කොට පුස්තකාලයේ තබා ඇත.

ප්‍රගතිය (%) භෞතික : 100 % මූල්‍යමය : 96.14%

**ව්‍යාපෘතිය 1.8 : කොරල්පර හා ඒ ආශ්‍රිත ජීවීන් පිළිබඳ අධ්‍යයනය.**

2005 වසරේදී කොරල්පර අධ්‍යයනයේ මුල් ඉලක්කය වූයේ 2004 දෙසැම්බර් වලදී සිදුවූ සුනාමිය නිසා වූ බලපෑම් නිශ්චය කිරීමයි. වයඹ, බස්නාහිර දකුණු හා නැගෙනහිර වෙරළ තීරයේ කොල්පරයන් හි පරීක්ෂණ සිදුවිය. සුනාමි ව්‍යසනයෙන් වැලිපර හා ගල්පර වලට පෙනෙන තරමට හානියක් සිදුවී නැත. හානි සිදුවී ඇති ආකාර විවිධ විය. නිරිතදිග ප්‍රදේශයන්හි කොරල්පරයන් සඳහා හානි සිදුවී නැති අතර, එහි සාමාන්‍ය මුහුදු මට්ටමට වඩා මීටරයක් පමණ ඉහලින් මුහුදු මට්ටම පැවතී තිබුණි. බස්නාහිර වෙරළ තීරයේ නොගැඹුරු ජලයේ කොරල්පර භූමි නැති අතර, වැලිපර භූමි සඳහා සුනාමි ව්‍යසනයෙන් හානි සිදුවී ඇත.

දකුණු හා නැගෙනහිර ප්‍රදේශයේ කොටස් සඳහා පහත් හා මධ්‍යම මට්ටමේ හානි පමණක් සිදුවී ඇත. මඩකලපුවේ කිරන්කුලම් දකුණු ප්‍රදේශය හා ත්‍රිකුණාමලයේ ලන්දේසි බොක්ක ප්‍රදේශයන්හි කොරල්පර අතිශයින් හානි වී තිබුණි.

ඉන්දියාවේ සේතු සමුදුම් නාවික මාර්ගයට සම්බන්ධ යාපන අර්ධද්වීපයේ කොරල්පරයන්හි මූලික දත්ත එකතු කිරීම ක්ෂේත්‍ර චාරිකාවලදී සිදුවිය. මෙම නිරීක්ෂණ ප්‍රදේශයේදී කොරල් භූමි සඳහා සුනාමියෙන් තදබල ලෙස හානි සිදුවී නොතිබුනි.

ශ්‍රී ලංකාවේ ඝන කොරල් විශේෂවල පැතිරීම පිළිබඳ නාරා ආයතනයේ දත්ත පද්ධතිය වැඩිදියුණු කල අතර, අමතර නියැදි සමග සංසන්දනාත්මක ලෙස මෙම දත්ත පද්ධතිය ඉදිරියට සිදුවිය. පර්යේෂණ වාර්තා අවසන් කල අතර, ඒවා පුස්තකාලයේ තබා ඇත.

ප්‍රගතිය (%) භෞතික : 100 % මූල්‍යමය : 93.71%

**ව්‍යාපෘතිය 1.9 : අපනයනය මත පදනම් වූ ධීවර කර්මාන්ත අධ්‍යයනය (හක්බෙල්ලන්, පොකිරිස්සන් හා විශාල ප්‍රමාණයේ පත්ලේ සරණ මසුන්)**

රටේ තවත් එක් ප්‍රධාන අපනයන ධීවර කාණ්ඩ වර්ගයක් වන්නේ හක්බෙල්ලන් හා මුහුදු කුඩැල්ලන් ය. මෙම විශේෂයන් පැතිරී ඇත්තේ මුහුදු පරිසරයේය. මෙම විශේෂයන් පරිසරයෙන් සීමිත ලෙස වාසි ගෙන දේ. මෙම සත්ව විශේෂ එකතැන් වී ඇති, එසේම පහසුවෙන් පලුදු විය හැකි ලෙස පැතිරී ඇති ඒවා වේ. හක් බෙල්ලන් සඳහා පමණක් නීති පනවා ඇත. මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ හක් බෙල්ලන් හා මුහුදු කුඩැල්ලන්ගේ උපයෝජන මට්ටම්වල තොග තක්සේරු කිරීම හා නිර්ණය කිරීමයි. මෙම දෙවර්ගයේම ජලය අභ්‍යන්තරයේදීම එකතුවන් හා ප්‍රමාණයන් පිළිබඳ ගණනයන් එකතු කිරීම සිදුවිය.

මෙම විශේෂයන් ප්‍රධාන වශයෙන් උතුරු හා නැගෙනහිර ප්‍රදේශයන් එනම්; මන්නාරම, ෆෝක් සමුද්‍ර සන්ධිය, ත්‍රිකුණාමලයට ඉදිරියෙන්, මඩකලපුව, කල්මුණේ හා කිරින්ද ප්‍රදේශයන් හි වෙරළ තීරයේ ජලයේදී සොයා ගැනිණි.

මුදා නොගත් ප්‍රදේශවල අස්වැන්නේ හා යෙදුනු වාර ගණන්වල දත්ත ලබා ගැනීමට බොහෝ අවස්ථාවල දුෂ්කර කාර්යයක් විය. කිමිදෙන්නන්ද ඒ සඳහා වූ විශාල ප්‍රශ්ණයක් නිසා කාර්යයන්හි නිරතවූයේ නැත. සුනාමිය නිසා ඔවුන්ගේ කිමිදුම් උපකරණ නැතිවී තිබූ බැවින් කිරින්ද ප්‍රදේශයේ හක් බෙල්ලන් හා මුහුදු කුඩැල්ලන් සඳහා කාර්යයන්හි නිරත වූයේ නැත. මෙනිසා මධ්‍යස්ථානවලින් තොරතුරු ලබා ගැනීම ඉතා සීමා සහිත විය.

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 9.38%

ව්‍යාපෘතිය 1.10 : උපකරණ ලබා ගැනීම.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 93%

4. ප්‍රකාශන.

වාර්තා.

(1) සුනාමිය නිසා වෙරළබඩ මත්ස්‍ය සම්පතට වූ බලපෑම් - පී.ඒ.ටී.ප්‍රනාන්දු

(2) සුනාමිය නිසා වෙරළබඩ ධීවර කර්මාන්තයට වූ බලපෑම් හා අනාගත සංවර්ධනය.

ශ්‍රී ලංකා මහ බැංකුවේ ආර්ථික සමාලෝචන ප්‍රකාශනය සඳහා ඉදිරිපත් කෙරිණි.
පී.ඒ.ටී.ප්‍රනාන්දු

(3) ශ්‍රී ලංකාවේ දියඹ මුහුදේ ධීවර කර්මාන්තය අධීක්ෂණය හා තක්සේරු කිරීම - සී.දිසානායක

(4) ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළ කලාපයේ කටුමෝරු කර්මාන්තය පිළිබඳ සමාලෝචනය
සී.දිසානායක

(5) රාජසූරිය, ඒ., පෙරේරා, එන්., සහ ප්‍රනාන්දු, එම්., (2005). ත්‍රිකුණාමලය කොරල්පරයේ තත්වය. සෝටර්, ඩී., ලින්ඩන්, ඕ., (ඒ.ඩී.එස්.). ඉන්දියානු සාගරයේ කොරල් පරයන්ගේ අවක්‍රමණය, 2005 තත්ව වාර්තාව. කෝඩියෝ, පාරිසරික විද්‍යා හා ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, කල්මාර් විශ්ව විද්‍යාලය.
ස්වීඩනය. 97 - 103

(6) රාජසූරිය, ඒ., (2005) 1998 කොරල්පර වල තත්වය හා 2004 සුනාමිය නිසා ශ්‍රී ලංකාවේ කොරල්පරයන් සඳහා සිදු වූ නරක ප්‍රතිඵලයන්. සෝටර්, ඩී., ලින්ඩන්, ඕ., (ඒ.ඩී.එස්.). ඉන්දියානු සාගරයේ කොරල් පරයන්ගේ අවක්‍රමණය, 2005 තත්ව වාර්තාව. කෝඩියෝ, පාරිසරික විද්‍යා හා ජීව විද්‍යා දෙපාර්තමේන්තුව, කල්මාර් විශ්ව විද්‍යාලය.
ස්වීඩනය. 83 - 96

(7) හපුතන්ත්‍රි, එස්.එස්.කේ.,
කිරින්ද ප්‍රදේශයේ ධීවර සම්පතේ වර්තමාන තත්වය. කිරින්ද ධීවර වරාය ප්‍රතිසංස්කරණය සඳහා ජපන් කණ්ඩායම සඳහා වාර්තාව ඉදිරිපත් කෙරිණි.

(8) සුනාමි උදම් ජලතරංග නිසා විනාශ වූ ධීවර කර්මාන්තයේ යටිතලයන් නැවත ඇති කිරීම.

(9) ගැඹුරු මුහුදේ වැලි ඇද ගැනීම නිසා පාරිසරික බලපෑම් තක්සේරු කිරීම -
සී.අමරසිරි, එස්.සී.ජයමාන්න, ආර්.මල්දෙණිය.

(10) ශ්‍රී ලංකාවේ සුරැකිය යුතු මුහුදු ජීවීන් -
ඩී.එන්.ඒ.රත්මදුගල

(11) ශ්‍රී ලංකාවේ ටූනා යොත් පන්න ධීවර කර්මාන්තයේ ඇමක් ලෙස වෙක්කයන් භාවිතා කළ හැකිද?
ඒ.කේ.වී.සමරවීර

පත්‍රිකා.

(1) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., සහ ජයවර්ධන, පී.ඒ.ඒ.ටී., 2006
මීගමුව හා හැඳල ප්‍රදේශයේ ඉස්සන්ගේ බහුලත්වය සඳහා ආකෘතියක් සෑදීම.
ශ්‍රී ලංකා ධීවර පර්යේෂණ 77 : 34-44

(2) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., ජේ.මොරේ, සහ එස්.ලෙක් (2005).
ශ්‍රී ලංකාවේ වෙරළබඩ ජල තීරයේ වෙසෙන හුරුල්ලන් අස්වැන්න හා තෙලා ගන්නා වාර ගණනයන්ගේ දත්ත අනුව අනුගත බහුලතාවය. සමුද්‍ර විද්‍යාව පිළිබඳ ICEC වාර සඟරාව.

(3) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., ජේ.මොරේ, සහ එස්.ලෙක් (2005).
ශ්‍රී ලංකාවේ වෙරළබඩ ධීවර කර්මාන්තයේ හුරුල්ලන්ගේ බහුලතාවය පිළිබඳ ප්‍රමිතියන් - ධීවර පර්යේෂණ.

(4) හපුතන්ත්‍රි, එස්.එස්.කේ., එම්.සී.එස්.විලනුවා සහ ජේ.මොරේ (2005)
ශ්‍රී ලංකාවේ වෙරළබඩ පරිසර පද්ධතියේ නිවර්තනයන්ගේ අන්තර් ක්‍රියාකාරීත්වය.
ECOPATH සාමාන්‍ය කෘතිකරණය.
සමුද්‍රජීව විද්‍යා හා පරිසර විශ්ලේෂණ වාර සඟරාව.

(5) ලියනගේ, යූ.එස්.පී.කේ., සහ වන්නිනායක, ඩබ්.එම්.ටී.බී., (2005)
ශ්‍රී ලංකවේ රැකව කළපුවේ වෙසෙන Metctricasts බෙල්ලාගේ සිහිඳු පටකවල වියළි බර කාලානුරූපීව වෙනස්වීම.

(6) පැටන්සන් එඩ්වඩ්, ජේ.කේ., තුල්කර්නි, එස්., ජෙයබාස්කරන්, ආර්., ලාසාරුස්, එස්., මේරි, ඒ., වෙන්කටරාමන්, කේ., ප්‍රභාදාස්, එස්., තමලේන්ද්‍ර, ජේ., රාජසූරිය, ඒ., ජයකුමාර්, කේ., කුමාරගුරු, ඒ., මාරිමුත්තු, එන්., ස්ලූකා, ආර්., සහ විල්සන්, ජේ., (2005).
2004 සුනාමිය නිසා ඉන්දියාවේ ප්‍රධාන භූමියට, අන්දමන් හා නිකෝබාර් දූපත් වලට වූ බලපෑම්.

විල්කින්සන්, සී., සෝටර්, ඩී., ගෝල්බර්ග්, ජේ., සුනාමිය බලපෑ රටවල්වල කොරල්පරයන්ගේ තත්වයන් : 2005 ඔස්ට්‍රේලියානු සමුද්‍ර විද්‍යා ආයතනය. පිපි 85-97

(7) රාජසූරිය, ඒ., පෙරේරා, එන්., කරුණාරත්න, සී., ප්‍රනාන්දු, එම්., තමලේන්ද්‍ර, ජේ., (2005)
සුනාමියෙන් පසු ශ්‍රී ලංකාවේ කොරල්පරයන්ගේ තත්වයන්. විල්කින්සන්, සී., සෝටර්, ඩී., ගෝල්බර්ග්, ජේ., සුනාමිය බලපෑ රටවල්වල කොරල්පරයන්ගේ තත්වයන් : 2005 ඔස්ට්‍රේලියානු සමුද්‍ර විද්‍යා ආයතනය. පිපි 97-110

(8) සමරවීර, ඒ.කේ.වී., සහ සී.අමරසිරි (2005). ශ්‍රී ලංකාවේ බිල් ෆිෂ් ධීවර කර්මාන්තයේ වර්තමාන තත්වය.

(9) විල්හෙල්මන්සන්, ඩී., පැටර්සන් එඩ්වර්ඩ්, ජේ.කේ., රාජසූරිය, ඒ., තමලේන්ද්‍ර, ජේ., සහ පෙරේරා,එන්., (2005)
කොරල්පර සම්පත තක්සේරු කිරීම හා කළමනාකරණ වැඩි දියුණු කිරීම : දකුණු ආසියාවේ අත්දැකීම් හා ක්‍රියාවන් සෝටර්, ඩී., ලින්ඩන්, ඕ.,
ඉන්දියානු සාගර කොරල් පරයන්ගේ අවක්‍රමණය තත්ව වාර්තාව. 2005
ජීව විද්‍යා හා පරිසර විද්‍යා දෙපාර්තමේන්තුව, කල්මාර් විශ්ව විද්‍යාලය, පිපි 66-82

(10) සාහිර්, එච්., තාම්, ජේ., තොමසන්, ඒ., සහ වේක්ෆෝඩ්, එම්., (2005)
මාලදිවයින් දූපත්වල කොරල්පර වල පූර්ව සුනාමි තත්වයන්.

විල්කින්සන්, සී., සෝටර්, ඩී., ගෝල්බර්ග්, ජේ.,
සුනාමිය බලපෑ රටවල කොරල් පරයන්හි තත්වයන් - 2005.
ඔස්ට්‍රේලියානු සමුද්‍ර විද්‍යා ආයතනය.
පිපි 111-123

# සමාජ, ආර්ථික හා අලෙවි පර්යේෂණ අංශය.

## අංශ ප්‍රධානි : ආචාර්ය රේබා මල්දෙණිය.

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

ධීවර අංශය සහ ධීවර ප්‍රජාව ආශ්‍රිත සමාජ, ආර්ථික හා අලෙවිකරණ අංශයන් ආශ්‍රිත පර්යේෂණ දියත් කිරීම පිළිබඳ වගකීම මෙන්ම ධීවර ප්‍රජාවගේ සුභසාධන, ඔවුන්ගේ එකමුතුව මත පදනම් වූ සේවා සහ වෙළඳපොල ප්‍රගතියේදී විෂමතාවයන් අඩුකර සංවර්ධන කටයුතු සිදු කිරීම මෙම අංශය මගින් සිදුවේ.

යෝජිත ව්‍යාපෘති දියත් කිරීමේදී කාර්ය මණ්ඩල ශ්‍රමයේ අඩුවක් තිබූ අතර ආර්ථික විද්‍යාඥ සමාජ විද්‍යාඥ හා සංඛ්‍යා නිලධාරි පුරප්පාඩු පිරවීම බලාපොරොත්තු විය එක් පර්යේෂණ සහකාරවරයෙකු (පර්යේෂණ කණ්ඩායමට සහායට) ඉතා ඉක්මණින් අවශ්‍ය විය පර්යේෂණ සහකාරවරුන් තිදෙනෙකු අංශය සතු වූ අතර ඔවුන් සියලු වැඩ කටයුතු හා ක්ෂේත්‍ර දත්ත රැස් කිරීම් වල නියැලීනි

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරීන් | කාලසීමාව |
|---|---|---|---|---|
| සුනාමි බලපෑම් පිළිබඳ ඉක්මන් තක්සේරුගත කිරීම. | සුනාමි ව්‍යසනය නිසා ධීවර කර්මාන්තයේ යටිතග අංග වූ අයිස් නිෂ්පාදනාගාර ශීතාගාර හා අධිශීතකරණ වලට වූ හානි පිළිබඳ තක්සේරුගත කිරීම. | ඒකාබද්ධ අරමුදල් | ආර්.මල්දෙණිය | 2005 ජනවාරි සිට අප්‍රේල් දක්වා |
| ධීවර කාන්තාවන්ගේ බලවත්වීම මත ධීවර ප්‍රජාවගේ සමාජ හා ආර්ථික තත්වය ඉහළ නැංවීම. | ධීවර කාන්තාව සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා කාන්තා ශ්‍රමය යෝග්‍ය ලෙස ප්‍රයෝජනයට ගෙන ධීවර ප්‍රජාවගේ සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීම. | 584,000 | ආර්.මල්දෙණිය<br>වයි. ද සිල්වා | 2005/2006 |
| සමාජ ආර්ථික සැලකිල්ලට ගෙන ඒ හරහා ධීවර කළමනාකරණය කිරීම. | සංක්‍රමණික ධීවර කර්මාන්තයේ හා අන්‍යෝන්‍ය ක්‍රියාකාරීත්වයන්ගේ සමාජ ආර්ථික තක්සේරු කිරීම. | 334,000 | එච්.ඩී.විමලසේන | 2005 |
| ධීවර වෙළඳපොල | ශ්‍රී ලංකාවේ කරදිය මත්ස්‍ය පරිභෝජනයේ බාධාවන් නිරීක්ෂණය | 314,000 | එල්.අමරලාල් | 2005/2006 |
| දැනුම හා සම්ප්‍රජානනය ව්‍යාප්ත කිරීම. | වාර්ෂික ධීවර ග්‍රන්ථය | 430,000 | කර්තෘ මණ්ඩලය | 2005 |

### 3. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 3.1 : සුනාමි ව්‍යසනයේ අධ්‍යයනය හා තක්සේරු කිරීම.**

සුනාමි ව්‍යසනය නිසා ධීවර කර්මාන්තයේ යටිතල එනම් අයිස් නිෂ්පාදනාගාර ශීත ගබඩා හා අධිශීතාගාර කෙරෙහි බලපෑම් පිළිබඳ ඉලක්ක කොටගත් අධ්‍යයනය සිදු කරන ලදී. කළුතර, ගාල්ල, මාතර හා හම්බන්තොට දිස්ත්‍රික්ක හතර සඳහා මෙය සීමා විය.

මෙහි වාර්තාව අමාත්‍යාංශයට යොමු කරන ලදී

සුනාමි ව්‍යසනය නිසා මත්ස්‍ය පරිභෝජනය ප්‍රබල ලෙස අඩු වූ ප්‍රධාන ප්‍රදේශ 7 ක් වන කොළඹ, කොටුව, නුගේගොඩ, මොරටුව, ගම්පහ, මරදාන, මහරගම හා පිළියන්දල ප්‍රදේශයන් හි ජනතාව මත්ස්‍ය වෙළඳපොල සඳහා උනන්දු කිරීමේ වැඩ සටහනක් දියත් කෙරිණි. මෙහිදී පත්‍රිකා 25000 කට වඩා බෙදා හරින ලදී.

**ව්‍යාපෘතිය 3.2 : ධීවර කාන්තාව – සමාජ හා ආර්ථික සංවර්ධනය සඳහා කාන්තා ශ්‍රමය යෝග්‍ය ලෙස ප්‍රයෝජනයට ගෙන ධීවර ප්‍රජාවගේ සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීම.**

සුනාමි ව්‍යසනය නිසා හානි වූ ධීවර ක්ෂේත්‍රයේ යටිතල හා වෙළඳපොල වැඩිදියුණු කිරීමේ ක්‍රියාවන් සඳහා නිලධාරීන් යොමු වූ බැවින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීම ප්‍රමාද විය. ක්ෂේත්‍ර කටයුතු සහ දත්ත එකතු කිරීමේ ක්‍රියාවන් සඳහා සේවක අඩුකම නිසා මෙහි ප්‍රගතිය අඩු වූ අතර, උපාධිධාරීන් බඳවා ගැනීමේ වැඩසටහන මගින් 2005 ඔක්තෝබර් මසදී නිලධාරියකු අංශයට අනුයුක්ත කරන ලදී.

අළුතින් අනුයුක්ත කල නිලධාරි ක්ෂේත්‍ර කටයුතු හා දැනුවත් කිරීමේ වැඩසටහන් සඳහා පුහුණුවීම් සඳහා යොමු කරන ලදී. නාරා ආයතනයේ මාස 03 ක සේවයෙන් පසු වැඩසටහන සඳහා බාධාවන් ඇතිවිය.

පහත සඳහන් දිස්ත්‍රික්කයන්හි සමාජ ආර්ථික දත්ත එකතු කිරීම් අධ්‍යයන කාලය තුල ඉටු කරන ලදී. එනම්; පුත්තලම, ගම්පහ, ගාල්ල, මාතර, හම්බන්තොට හා ඊට සමගාමීව අනුරාධපුරය හා පොලොන්නරුවයි. මෙම අධ්‍යයනය මගින් අනාවරණය කරගන්නා ලද්දේ අඩු ආදායම්ලාභී කුඩා ප්‍රමාණයේ ධීවර කර්මාන්තවල නියැලෙන්නන්ගේ ආදායම් මට්ටම් පිළිබඳවයි. මෙහිදී ඔවුන්ගේ ජීවත්වීමේ මූලික කාර්යයන් සඳහා ප්‍රධාන ගෘහමූලිකයාගේ ආදායම් ඉපැයීම් මට්ටම් ප්‍රමාණවත් නොවන බව හෙළි කර ගන්නා ලදී. එනිසා කුඩා ප්‍රමාණයේ ධීවර කර්මාන්තයේ නියැලෙන ධීවර කාන්තාවගේ ආදායම් ඉපයීමේ සහභාගිත්වය ඉතා වැදගත් බව හෙළිවිය. කෙසේ නමුත් ඔවුන්ගේ අධ්‍යාපන මට්ටම පහත් අතර, 50% ක වැඩි පිරිසක් ද්විතීයික අධ්‍යාපනය ලබා නැති අතර, තාක්ෂණික අධ්‍යාපනයක් හෝ පුහුණුවක් ලබා නොමැත.

ප්‍රජාවන් අතර තරුණ ධීවර කාන්තාවන් වඩා වැඩි උනන්දුවක් දක්වන්නේ සම්ප්‍රදායික ධීවර ක්‍රියාකාරකම්වලට වඩා ධීවර කර්මාන්තයට අයත් නොවූ ආර්ථික ක්‍රියාකාරකම් වලටයි. යන්ත්‍ර සූත්‍ර, දැනුම හා වෙළඳපොල බාධාවන් ඔවුන්ගේ වෘත්තීය සහභාගිත්වය සඳහා බාධාවන් වේ. අනාගතයේදී මෙම ධීවර ප්‍රජාවන්ගේ දැනුම වර්ධනය, කළමනාකරණය, දියුණුව සඳහා එම ප්‍රජාවන් හා ග්‍රාමීය මට්ටම් කාන්තා සංවිධාන සමුපකාර සහභාගිත්ව හරහා සංවර්ධන වැඩසටහන් සකස් කළ යුතුය. එසේම ඒ සඳහා අවශ්‍ය මූල්‍යමය පහසුකම් යෙදවිය යුතු අතර, ඔවුන්ගේ වෙළඳපොල හා නිෂ්පාදන ක්‍රමවත්ව සිදුවිය යුතුය.

අනුරාධපුරයේ උල්හිටිය හා කලාඔය ප්‍රදේශයේ දිවි පැවැත්ම සංවර්ධනය කිරීමේ වැඩසටහන් 2 ක් ක්‍රියාත්මක කල අතර, තරුණ කාන්තාවන් 80 ක් සහභාගි වී පුහුණු වූ අතර, නාගරික වෙළඳපොල සඳහා “ජාඩි” පිළියෙල කිරීම හා විසිතුරු භාණ්ඩ සෑදීම මෙහිදී සිදුවිය.

ප්‍රගතිය (%) භෞතික : 80 % මූල්‍යමය : 66%

**ව්‍යාපෘතිය 3.3 : සංක්‍රමණික ධීවර කර්මාන්තයේ හා අන්‍යෝන්‍ය ක්‍රියාකාරිත්වයන්ගේ සමාජ ආර්ථික තක්සේරු කිරීම.**

මෙම අධ්‍යයනය අනෙක් ධීවර ක්ෂේත්‍ර සමග නිරන්තර ගැටෙන ධීවර ක්ෂේත්‍ර 3 ක්ම අළලා සිදුවිය.

(1) කල්පිටිය තුඩුවේ සිදු කරන ගැඹුරු මුහුදේ මරුවැල් පන්නය හා කුඩා ප්‍රමාණයේ හැඹිලි දැල් (ලයිලා) පන්නය අතර අන්තර් ක්‍රියාකාරිත්වය.

(2) ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ගැඹුරු මුහුදේ පන්න කරන සංක්‍රමණික ධීවරයින්ගේ සමාජ, ආර්ථික අධ්‍යයනය.

(3) දකුණු වෙරළ තීරයේ සිදු කරන හැඹිලි දැල් හා කුඩා ප්‍රමාණයේ ධීවර පන්න අතර අන්තර් ක්‍රියාකාරිත්වය.

**අංක 1 හා 2 අතර කරුණු අධ්‍යයනය.**

කල්පිටිය තුඩුවේ සිදුකරන ගැඹුරු මුහුදේ මරුවැල් පන්නය හා කුඩා ප්‍රමාණයේ හැඹිලි දැල් පන්නය අතර අන්තර් ක්‍රියාවන්ගේ හා ත්‍රිකුණාමලය ප්‍රදේශයේ ගැඹුරු මුහුදේ පන්න කරන සංක්‍රමණික ධීවරයින්ගේ සමාජ, ආර්ථික අධ්‍යයනයන් සාර්ථකව සිදු කළ අතර, අංක 3 හි කරුණු අධ්‍යයනය සඳහා බාධා ඇතිවිය.

මෙහිදී දකුණු ප්‍රදේශයේ වෙරළබඩ කලාපයේ සිදු වූ සුනාමි අනතුර නිසා බොහෝ ධීවර යාත්‍රා විනාශ වී අලාභහානි වූ අතර, වර්ෂය අවසාන වනතුරු ඒ සඳහා යෙදී නොතිබුණි.

අංක 1 කරුණු අධ්‍යයනය එනම්; කුඩා ප්‍රමාණයේ හැඹිලි දැල් (ලයිලා) කර්මාන්තය සම්පත සඳහා දැඩි බලපෑමක් ඇති කරයි. ඔවුන් ඉලක්ක ලෙස විශාල ප්‍රමාණයේ මාළු පැටවුන් සිටින ගහණයන් හා පත්ලේ සරණ මසුන් ඇල්ලීම සිදු කිරීමයි. එසේම ඔවුන් විශාල මසුන් ඇල්ලීමේදී ඩයිනමයිට් භාවිතය සිදු කරයි. සම්ප්‍රදායික ධීවර කර්මාන්තයේදී එනම්; කුඩා ප්‍රමාණයෙන් සිදු කරන පත්ලේ සරණ මසුන් ඇල්ලීම එනම්; ගැඹුරු ජලයේ මරුවැල් පන්නය හා අත්යොත් පන්නයන් සිදු කරන මෙම මසුන් ලයිලා මගින් ඇල්ලීමේදී සම්පත කෙරෙහි දැඩි බලපෑමක් ඇති කරයි. ලයිලා ක්‍රමයේදී ගැඹුරු ජලයේ මරුවැල් පන්නවලට වඩා ඉතා වැඩි ඇල්ලීමේ අගයන් 45 සිට 1000 ක වාර ගණනක් දක්වා සිදුවේ. මෙහි ප්‍රතිඵලයක් ලෙස මරුවැල් පන්න ක්‍රමය ඉතා පහත් මට්ටමකට බැස ඇති අතර, ආදායම් තත්වයන් ද පහත වැටී ඇති තත්වයන් වේ.

දෙවැනි කරුණු අධ්‍යයනයේදී ත්‍රිකුණාමලයට සංක්‍රමණය වී ගැඹුරු මුහුදේ පන්න කරන ධීවරයින්ගේ ප්‍රධාන සීමාවන් අධ්‍යයනය සිදුවිය. ඔවුන් අප්‍රේල් සිට අගෝස්තු දක්වා මසුන් ඇල්ලීම හා අලෙවිය සිදුකරන අතර, වරායන්ගේ පහසුකම් හා ආරක්ෂාව ඉතා පහත් මට්ටමේ විය. මෙම කාලය තුළදී ගැඹුරු මුහුදේ බෝට්ටු 400 – 450 අතර ප්‍රමාණයක් හා කුඩා ඇන්ජින් සවිකල FRP බෝට්ටු 300 ක් පමණ ත්‍රිකුණාමලයට සංක්‍රමණික ධීවරයින් විසින් මරුවැල් පන්නය සඳහා යොදා ගන්නා අතර, ඔවුන්ගේ ඉලක්ක මසුන් වූයේ කහ වරල් කෙලවල්ලන්ය. මෙහිදී මසුන් මිළදී ගන්නන් කිහිප දෙනෙක් සිටි අතර, අපනයන වෙළඳපොල සඳහා කහවරල් කෙලවල්ලන්ගේ තරගය පහත් මට්ටමක පැවතිණි. කොළඹ දක්වා මසුන් ප්‍රවාහනය සඳහා අධික ගාස්තුවක් දැරීමට සිදුවන නිසා සීමාසහිත ප්‍රමාණයක් ප්‍රවාහනය සිදු කරයි. කොඩ්ඩෙ වරායේ පහසුකම් සීමාසහිත වූ අතර, ඔවුන්ගේ අවශ්‍යතා හා සේවා වැඩි දියුණු කිරීමක් සිදු නොවිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස ප්‍රදේශයේ ධීවරයින් හා සංක්‍රමණික ධීවරයන් අතර ප්‍රශ්ණ ඇතිවිය.

ප්‍රගතිය (%) භෞතික : 85 % මූල්‍යමය : 65%

**ව්‍යාපෘතිය 3.4 : ශ්‍රී ලංකාවේ කරදිය මත්ස්‍ය පරිභෝජනය බාධාවන් නිරීක්ෂණය.**

මෙම අධ්‍යයනයේ අරමුණ වූයේ කරදිය මත්ස්‍ය පරිභෝජනය වෙළඳපොල තගා සිටුවීමයි. මෙහිදී කොළඹ, කළුතර, ගාල්ල, හම්බන්තොට හා මාතර දිස්ත්‍රික්ක පහේ කරදිය මත්ස්‍ය පරිභෝජනය පිළිබඳ දත්ත එකතු කළ අතර, එය 2006 වසර දක්වා අඛණ්ඩව සිදු කෙරේ. 2006 වසර දක්වා ව්‍යාපෘතිය සම්පූර්ණ වනතුරු නිර්දේශ ලබාදීම සිදු නොවුනි.

ප්‍රගතිය (%) භෞතික : 85 % මූල්‍යමය : 5%

**ව්‍යාපෘතිය 3.5 : ධීවර වාර්ෂික සඟරාව.**

දත්ත එක් කිරීම, විශ්ලේෂණය හා සගරාව සැකසීම සිදු කෙරිණි. සමහර ආයතන වලින් අවසාන සංඛ්‍යාන දත්ත ලබා ගැනීම ප්‍රමාදවීම නිසා සගරාවේ කටයුතු ප්‍රමාද විය.

4. ප්‍රකාශන.

**සුනාමි බලපෑම්.**

(1) මල්දෙණිය, ආර්., - 2005 සුනාමි ව්‍යසනය නිසා ධීවර කර්මාන්තයේ යටිතල සඳහා වූ බලපෑම් තක්සේරු කිරීම. මෙහි වාර්තාව ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශයට ඉදිරිපත් කෙරිණි

(2) මල්දෙණිය, ආර්., - 2005 සුනාමි ව්‍යසනය නිසා ධීවර කර්මාන්තය සඳහා විශාල වශයෙන් බලපෑම්. මෙහි වාර්තාව ධීවර හා ජලජ පර්යේෂණ සඳහා වූ සීඩා / නාරා වැඩමුළුවට ඉදිරිපත් කෙරිණි.

**සමාජ, ආර්ථික අධ්‍යයන සමාලෝචනය.**

(1) මල්දෙණිය, ආර්., - 2005 ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ ආර්ථිකය. ශ්‍රී ලංකා වෘත්තිකයන්ගේ සංගමය සංවිධානය කළ 18 වැනි වාර්ෂික සැසිය සඳහා ඉදිරිපත් කෙරිණි.

(2) විමලසේන, එච්.ඩී., - 2005 ශ්‍රී ලංකාවේ ධීවර සමුපකාරයන් හි වර්තමාන තත්වය සමාලෝචනය. ධීවර හා ජලජ පර්යේෂණ සඳහා වූ සීඩා / නාරා ජාත්‍යන්තර වැඩමුළුව සඳහා ඉදිරිපත් කෙරිණි.

(3) විමලසේන, එච්.ඩී., - 2005 ශ්‍රී ලංකාවේ දකුණු වෙරළ තීරයේ සිදු කෙරෙන වටකරන දැල් හා පාවෙන කරමල් දැල් කර්මාන්තයේ ආර්ථික තත්වය. SLAFAR හි II වැනි විද්‍යාත්මක සැසිය සඳහා ඉදිරිපත් කෙරිණි.

**ධීවර කාන්තාව.**

(1) මල්දෙණිය, ආර්., - 2005
ශ්‍රී ලංකාවේ ධීවර කර්මාන්තයේ නිෂ්පාදන හා කරදිය මත්ස්‍ය වෙළඳපොල.

(2) JBIC හි කොටසක් වූ ආසියා පැසිපික් සම්පත් මධ්‍යස්ථානයේ ඉල්ලීමක් අනුව, ආර්.මල්දෙණියගේ මග පෙන්වීම හා දැනුම සහයෝගයෙන් මෙම අධ්‍යයනය සිදුවිය. ඊසානදිග පළාතේ ධීවර සමුපකාර සමිති හා ඒවායේ ධීවර ක්‍රියාකාරකම් සඳහා සහයෝගිතාවය දැක්වීම හා වෙළඳපොල ඉහළ නැංවීමට මෙම සහයෝගය දැක්වීම් වස් මෙම ව්‍යාපාතිය සිදු කෙරිණි.

(3) මල්දෙණිය, ආර්., - 2005
කොටුව මධ්‍යම මාළු වෙළඳපොල ක්‍රමවත්ව සැකසීම සඳහා වාර්තාව. ධීවර හා ජලජ සම්පත් අමාත්‍යාංශය වෙත ලබාදුනි.

(4) මල්දෙණිය, ආර්., - 2005
සුනාමිය නිසා අවුරුද්දක් ඇතුලතදී අළුත් කරදිය මාළු වෙළඳපොලක් නැංවීම. මෙහි වාර්තාව FAO වෙත ලබාදුනි.

# පසු අස්වනු තාක්ෂණ අංශය.

## අංශ ප්‍රධානි : ආචාර්ය රංජිත් එදිරිසිංහ.

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

ධීවර හා ජලජ සම්පත් හා සම්බන්ධ පසු අස්වනු තාක්ෂණයේ විවිධ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලි සඳහා දායකවීම අංශය මගින් සිදු කරයි. එසේම ධීවර නිෂ්පාදන, මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදන, ජලජීවී වගාව හා සම්බන්ධ ක්ෂුද්‍ර ජීවාත්මක සහ රසායනික විශ්ලේෂණ පරීක්ෂණ සේවා තත්ව පාලන පර්යේෂණාගාරය මගින් ලබාදෙයි. ප්‍රධාන කණ්ඩායම් 3 ක් මගින් අංශයේ පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලි සිදු කරයි. 2005 වසර තුළදී ප්‍රධාන ව්‍යාපෘති 4 ක් සහ පරීක්ෂණ සේවා ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක විය. ඊට අමතරව, විශේෂ ව්‍යාපෘති 2 ක් මගින් ධීවර කර්මාන්තයට සුනාමිය මගින් සිදුවූ බලපෑම අධ්‍යයනය කෙරිණි.

තත්ව පාලන විද්‍යාගාරයේ ඇති ක්ෂුද්‍ර ජීව විද්‍යා හා රසායන විද්‍යා කොටස් මගින් කර්මාන්ත අංශයන් සඳහා පරීක්ෂණ සේවා ලබාදුනි. ISO 17025 තත්ව සහතිකය යටතේ මෙම තත්ව සහතික ලබාදුනි. පසු අස්වනු තාක්ෂණ අංශයේ කාර්ය මණ්ඩලය විසින් පසු අස්වනු තාක්ෂණයට සම්බන්ධ පොදු හා කර්මාන්ත අංශයට අවශ්‍ය සේවාවන් ලබාදුනි. මෙම වැඩ සටහන් ප්‍රධාන වශයෙන් සුනාමිය නිසා විනාශවූ ධීවර නිෂ්පාදන නගා සිටුවීම සඳහා ඉලක්ක කොට සිදුවිය. ඊට අමතරව, අංශය මගින් කර්මාන්තයට සම්බන්ධ පුද්ගලයන්ගේ කාර්මික පුහුණුව ද ලබාදුනි. එහිදී ධීවර නිෂ්පාදනාගාර වල සනීපාරක්ෂක ප්‍රශ්ණ හා වැරදි ක්‍රියාකාරකම් ආදිය පිළිබඳ දැනුම ලබාදුනි.

වර්තමානයේදී අංශයේ පර්යේෂණ නිලධාරීන් 05 ක්, පර්යේෂණ සහකාරවරුන් 07 ක්, දත්ත සැකසුම් ක්‍රියා කරන්නියක්, සේවා සැපයුම් ලෙස විද්‍යාගාර සහායකයින් 02 ක් හා කම්කරුවන් 07 දෙනෙකුත් සේවය කරයි. එක් පර්යේෂණ නිලධාරිණියක් ආචාර්ය උපාධිය සඳහා විදේශගතවී ඇත. වර්තමානයේදී අංශයේ පුරප්පාඩු කිහිපයක් පවතී.

එක් පර්යේෂණ නිලධාරියෙක් සිංගප්පූරුවේ පැවැත්වෙන මුහුදු ආහාර ආරක්ෂණ කළමනාකරණය පිළිබඳ පුහුණුවක් ලබන අතර, පර්යේෂණ සහකාරවරුන් දෙදෙනෙකු තායිලන්තයේදී ප්‍රතිජීවක විශ්ලේෂණය පිළිබඳ කෙටිකාලීන පුහුණුවක් ලැබීය. ඊට අමතරව, එක් පර්යේෂණ සහකාරවරයෙක් විද්‍යාගාර කළමනාකරණ පාඨමාලාව සම්පූර්ණ කරන ලදී. ISO තත්ව පාලන වැඩ සටහනේ අවශ්‍යතා අනුව ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේදී (SLSI) පැවැත්වූ පුහුණු පාඨමාලා කිහිපයක් සඳහා අංශයේ කාර්ය මණ්ඩලය සහභාගි වූහ.

2004 දෙසැම්බර් 26 දින පැමිණි සුනාමිය නිසා අංශයට බරපතල හානි සිදුවිය. රසායන විද්‍යා, ක්ෂුද්‍ර ජීව විද්‍යා හා කාබනික රසායනාගාරය හා නිෂ්පාදන අංශ තදබල ලෙස විනාශයට පත්විය. සමහර විද්‍යාගාර උපකරණ හා කාර්යාලීය අංශ විනාශ වී ගිය අතර, අනෙක් ඒවා තදබල ලෙස හානියට පත්විය. මෙනිසා අංශය මගින් අවුරුද්දේ සිදු කිරීමට සැලසුම් කළ වැඩ සටහන් සඳහා බාධා ඇතිවිය. කෙසේ වුවද, තත්ව පාලන විද්‍යාගාරයේ ක්‍රියාකාරකම් සති 02 කට පසු ආරම්භ විය. නමුත් ක්ෂුද්‍ර ජීව විද්‍යා හා රසායන විද්‍යාගාරවල වැඩ කටයුතු ඇරඹීමට මාස කිහිපයක් ගතවිය. මත්ස්‍ය සැකසුම් කර්මාන්තශාලාව සඳහා උපකරණ සවි කිරීම සිදුවෙමින් පවතී.

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරීන් | කාලසීමාව |
|---|---|---|---|
| 1. පරීක්ෂණ සේවා හා පරීක්ෂණ පරාමිතිකයන් ලබාදීම. | 2.5 m | ආචාර්ය ආර්.එදිරිසිංහ<br>අයි.කාරියවසම් | 2005 ජනවාරි සිට දෙසැම්බර් |

| | | | |
|---|---|---|---|
| 2. ධීවර කර්මාන්ත ආශ්‍රිත ගුණාත්මක තත්ව පාදක පසු අස්වනු හානි අඩුකර ගැනීම සඳහා පිළියම් සොයා බැලීම. | 0.6 m | පී.ජේ.ගනේගමආරච්චි | 2005 ජනවාරි සිට දෙසැම්බර් |
| 3. ජලජීවි වගා ධීවර කර්මාන්තයේදී යොදා ගන්නා ප්‍රතිජීවක හා සත්ව ඖෂධ ද්‍රව්‍ය වල පාවිච්චිය හා අවශේෂ ප්‍රමාණ අධීක්ෂණය. | 1.0 m | ආචාර්ය ආර්.එදිරිසිංහ | 2005 ජනවාරි සිට දෙසැම්බර් |
| 4. ධීවර කර්මාන්තයේ තත්ව සහතික | 0.8 m | අයි.කාරියවසම් | 2005 ජනවාරි සිට දෙසැම්බර් |
| 5. අඩු මිල මත්ස්‍ය සම්පත් යොදා මත්ස්‍ය නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ලුණු දමා කල් තබාගත හැකි මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව පාලනය. | 0.5 m | පී.එස්.ජයසිංහ | 2005 ජනවාරි සිට දෙසැම්බර් |
| 6. උපකරණ මිලදී ගැනීම. | 3.7 m | | 2005 ජනවාරි සිට දෙසැම්බර් |

## 3. කාර්ය සාධනය :

**ව්‍යාපෘතිය 1 : පරීක්ෂණ සේවා හා පරීක්ෂණ පරාමිතිකයන් ලබාදීම.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, මත්ස්‍ය හා ඒ ආශ්‍රිත ආහාරවල තත්ව සහතික උසස් පරීක්ෂණ මගින් ලබාදීමයි. තත්ව පාලන විද්‍යාගාරය මගින් ISO/IEC 17025 ප්‍රමිතියට අනුකූල ගුණාත්මක තත්ව පාලන වැඩ සටහනක් ක්‍රියාත්මක වේ. ASTEL යටතේ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයෙන් පෙර වර්ෂයේදී මෙය ලැබුණි. ස්වායු බැක්ටීරියා ප්‍රමාණ, ආන්ත්‍රික බැක්ටීරියා මලපහ සමග පිටවන ආන්ත්‍රික බැක්ටීරියා ඊ-කෝලි මෙම ලබාදෙන පරාමිතික වේ.

අභ්‍යන්තර විගණනය හා කළමනාකරණ තක්සේරු කිරීම්ද ධීවර දෙපාර්තමේන්තුව මගින් සිදුවිය. ඊට අමතරව කර්මාන්ත අංශයේ නියැදි 1023 සිදුකල අතර, වාර්තා 190 ක් ලබාදුනි.

ටෙන්ඩර් පටිපාටියට අනුව, රසායන ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීම් සිදුවන බැවින් ව්‍යාපෘතියේ කාර්යයන් ප්‍රමාද විය.

ප්‍රගතිය (%) භෞතික : 85% මූල්‍යමය : 57.4%

**ව්‍යාපෘතිය 2 : ධීවර කර්මාන්තය ආශ්‍රිත ගුණාත්මක තත්ව පාදක පසු අස්වනු හානි අඩුකර ගැනීම සඳහා පිළියම් සොයා බැලීම.**

සැලසුම් කල වැඩ සටහනට අනුව, අක්වෙරළ ධීවර කර්මාන්තයේ යෙදෙන බෝට්ටු වල ටූනා මසුන්ගේ පසු අස්වනු තාක්ෂණ හා පවතින තත්වයන් පිළිබඳ සුනාමියේ බලපෑම නිසා එම ක්‍රියාවන් නියමිත ලෙස සිදුවූයේ නැත. ව්‍යාපෘතියේ 2005 වසර සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග සිදුවිය.

**සිදුකරන ලද ක්‍රියාකාරකම් :**

අක්වෙරළ බෝට්ටුවල මත්ස්‍ය හා මත්ස්‍ය නිෂ්පාදනයන්හි ක්ෂුද්‍ර ජීවී රසායනික හා භෞතික තත්වයන් තක්සේරු කිරීම.

Listeria විශේෂයේ (කහවරල් හා බල ටූනා) මසුන්ගේ නියැදින් 26 ක් විශ්ලේෂණය කරන ලදි. සංඛ්‍යා 14 ක් heamolytie හඳුනා ගැනීම් වැඩ සටහනට අනුව සිදුවිය.

*Katsuwonus pelamis* (බලයා) අයිස් වල දින 22 ක් ගබඩා කර තබා භෞතික තත්වය වෙනස්වීම (මතුපිට පෙනුම වර්ණය හා තෙතමනය) තක්සේරු කෙරිණි.

අධ්‍යයනයේ අරමුණ වූයේ, උපකරණ පදනම් කරගෙන සරල හා සුදුසු ක්‍රමයක් මගින් Skipjack Tuna ගේ ස්වයං ජීවිත කාලය පිළිබඳ අනාවැකි පළ කරන ක්‍රමයන් අධ්‍යයනයයි. මසුන්ගේ මතුපිට ස්වභාවය (Stanle Micro Systems) මගින්, එනම්; Texture Analyzer මගින් නිර්ණය කෙරිණි. තද ගතිය මැනීම සඳහා Cylindrical probe ( 25mm diamerer) යොදාගෙන දින 04 කට වරක් ගෙන ග්‍රෑම් 90.18 (දෙවන දින) සිට අඩුවන ප්‍රමාණය 22 දිනට අයිස්වල ගබඩා කර ග්‍රෑම් 1.779 දක්වා අඩුවන බව නිර්ණය කෙරිණි.

කප්පාදු තෙරපුම නිර්ණය කිරීම සඳහා කැපුම් කළ (3mm ඝනකම ඇති 70mm පළල) යොදා ගැනිනි. මෙහිදී අයිස්වල ගබඩා කිරීමේ කාලයේදී දෙවන දිනයේ 92.137 ග්‍රෑම් සිට දින 22 දක්වා ගත්විට 22 දිනදී 3.28 ග්‍රෑම් ප්‍රමාණයට අඩුවිය. මෙම මතුපිට ස්වභාවයේ පරාමිතීන් 2 බලයාගේ මතුපිට ස්වභාවයේ තත්වය නිර්ණය සඳහා යොදාගත හැක.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 88%

**ව්‍යාපෘතිය 3 : ජලජීවී වගා ධීවර කර්මාන්තයේදී යොදා ගන්නා ප්‍රතිජීවක හා සත්ව ඖෂධ ද්‍රව්‍ය වල පාවිච්චියට හා අවශේෂ ප්‍රමාණ අධීක්ෂණය.**

මෙම ව්‍යාපෘතියේ අරමුණ වූයේ, ශ්‍රී ලංකාවේ ජලජීවී වගා ධීවර කර්මාන්තයේදී සත්ව බෙහෙත් ද්‍රව්‍යයන්හි භාවිතය සොයා බැලීමයි.

මෙහි ප්‍රතිඵලයක් ලෙස පෙනී ගියේ, ජලජීවී වගා කර්මාන්තයේදී පොදු සෞඛ්‍යයට අන්තරායකර හා පරිසරයට හානිදායි බෙහෙත් ද්‍රව්‍ය පාවිච්චියට ගැනීම ව්‍යාප්ත වී ඇති බවයි. ගොවිපළ කර්මාන්තශාලා හා අභිජනනාගාර වලින් ඉස්සන් නියැදි 31 ක් එකතු කර ඒවායේ ක්ලෝරොෆෙනිකෝල් මට්ටම ELISA ක්‍රමය පාවිච්චි කර සොයා බැලිනි. ඊට අමතරව, ඉස්සන් කෑම නියැදි 6 කද ක්ලෝරොෆෙනිකෝල් මට්ටම සොයා බැලිනි. ඉස්සන් නියැදි විශ්ලේෂණයට අනුව නියැදි 24 ක් මිතිය හැකි ප්‍රමාණය වන (0.2ppm) වලට වඩා අඩුවෙන් පැවතිය අතර, 7 ක් (0.2ppm) ට වඩා වැඩියෙන් තිබුනි. ඉස්සන් ආහාර වල ක්ලෝරොෆෙනිකෝල් මට්ටම ඉහළ අගයක් ගෙන තිබුනි. පෙනී ගියේ තහනම් ප්‍රතිජීවක භාවිතා කර ඇති බවයි. කෙසේ වුවත් මෙම ELISA ක්‍රමය බෙහෙත් වල සංවේදිතා මට්ටම විශ්ලේෂණය සඳහා ප්‍රමාණවත් නොවේ.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 88%

**ව්‍යාපෘතිය 4 : ධීවර කර්මාන්තයේ තත්ව සහතික.**

මෙහි අධ්‍යයනයන් සඳහා වාණිජමය ලෙස අභ්‍යන්තර ධීවර කර්මාන්තයේ සිදු කරන හම්බන්තොට, පුත්තලම, අනුරාධපුර, පොළොන්නරුව, මාතලේ දිස්ත්‍රික්කයන් හි මිරිදිය ජලාශ තෝරා ගැනිනි. සෑම ස්ථානයකින්ම තත්ව භාවිතය පිළිබඳ තොරතුරු ලබා ගැනිනි. නියැදි ලෙස නැවුම් මසුන් බෝට්ටුවලින්, වෙළඳපොලින්, අධිශීතාගාර වලින් හා මත්ස්‍ය ආහාර වලින් ලබා ගැනිනි.

2005 පෙබරවාරි සිට දෙසැම්බර් දක්වා නියැදි ලබා ගැනිනි. වාණිජමය වටිනාකමින් යුත් ප්‍රධාන මසුන් වර්ග දෙක වන්නේ තිලාපියා විශේෂ හා කාප් විශේෂයි. කලාවැව, නාච්චදූව ජලාශය, මහවිලච්චිය, තබ්බෝව වැව, ලුණුගම්වෙහෙර ජලාශය, වීරවිල වැව, පරාක්‍රම සමුද්‍රය, මින්නේරිය ජලාශය, කවුඩුල්ල ජලාශය, කණ්ඩලම ජලාශය හා දේවහුව ජලාශය පර්යේෂණය සඳහා යොදා ගැනිනි. මසුන් පරිහරණය විශ්ලේෂණය සඳහා එම ජලාශවල ජල නියැදි ද එකතු කරන ලදි. නියැදි වල ක්ෂුද්‍ර ජීවී පරාමිතිකයන් ලෙස APC Coliforms Faecal Coliforms හා E.coli Salmonella පරීක්ෂා කරන ලදි. පානීය ජලයේ තත්වයන් ද පරීක්ෂා කෙරිණි.

මත්ස්‍ය නියැදි 77 ක් හා ජලය නියැදි 16 ක තත්ව පරීක්ෂා සිදු කෙරිණි. ලුණුගම්වෙහෙර මත්ස්‍ය සාම්පල් 09 ක්ද, පරාක්‍රම සමුද්‍රයේ මත්ස්‍ය සාම්පල් 6 ක්ද, විලච්චිය මත්ස්‍ය සාම්පල් 06 ක් හා ලුණුගම්වෙහෙර, පරාක්‍රම සමුද්‍රය, කලාවැව හා දේවහුව වැව නියැදින්හි සැල්මොනෙල්ලා අඩංගු වී තිබුනි.

මෙහි සියළු දත්ත හා තොරතුරු එකතු කර වාර්තාවක් පිළියෙල වෙමින් පවතී. අනෙක් දිස්ත්‍රික්කයන් හි 2006 වසරේදී ද මෙම ව්‍යාපෘතිය අඛණ්ඩව සිදුවේ.

ක්ෂෙත්‍ර චාරිකාවලදී නවාතැන් පහසුකම් පිළිබඳ දුෂ්කරතා පැන නැගුණු බැවින් සමහර ක්ෂේත්‍ර චාරිකා අවලංගු කෙරිණි.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 91%

**ව්‍යාපෘතිය 5 : අඩු මිල මත්ස්‍ය සම්පත් යොදා මත්ස්‍ය නිෂ්පාදන වැඩි දියුණු කිරීම හා ලුණු දමා කල් තබාගත හැකි මත්ස්‍ය නිෂ්පාදන වල තත්ව පාලනය.**

ට්‍රෝලිං කර්මාන්තයේදී අතුරු නිෂ්පාදනයක් ලෙස ආර්ථික වශයෙන් වටිනාකමක් නැති මසුන් ලෙස අනිවාර්යයෙන්ම අසුවන Silver bellies, While ribbon fish, Cat fish, Elasmobranchs soles perches, Cephalopods හා Crustaceans වේ

මෙම මසුන් වාණිජමය අතින් වටිනාකමක් නැත. ජලජීවි වගා කර්මාන්තයේදී මෙම වටිනාකමක් නැති මසුන් ප්‍රෝටීන ප්‍රභවයක් හා වෙනත් ක්ෂුද්‍ර පෝෂක ලබාදීම සඳහා යොදා සාදා ගැනීමෙන් මත්ස්‍ය ආහාර වලට වැඩිවන මිළ අඩුකර ගත හැක.

මන්නාරම හා කල්පිටිය ප්‍රදේශයන්හිදී මෙම මත්ස්‍ය සාම්පල එකතු කරන ලදී. කල්පිටිය හා මන්නාරමේ ට්‍රෝලිං කර්මාන්තයේ අතුරු නිෂ්පාදනයක් ලෙස Silver belly විශේෂයන් යොදා මත්ස්‍ය ආහාර පිළියෙල කරන ලදී.

මෙම මත්ස්‍ය ආහාර නිෂ්පාදන ක්‍රියාවලියේදී තෙරපුම් මගින් හුමාලනය, වෙන් කිරීම හා අද්‍රාව්‍ය සාන්ද්‍රණය සොයා බැලිණි. යාන්ත්‍රික වියළි උඳුනක් භාවිතා කර අද්‍රාව්‍යයන්හි ජලය ඉවත් කිරීම සිදු කෙරිණි. මාළු ආහාරවල් හුමාලනය, තෙරපුම, වියළීම හා ඇඹරීම සිදුවිය. මාළු ආහාර පිළියෙල කර වියළි පොලිතීන් වල අසුරා ශීතකරණයේ ගබඩා කෙරිණි. අනෙක් කොටස ලෙස තෙරපුමක් නොමැතිව එම ක්‍රියාවලිය සිදුවිනි. යාන්ත්‍රික නොමැති බ්‍රමණ තෙරපුම පිළිබඳ පරීක්ෂා කෙරිණි. විද්‍යාගාරය තුල පිළියෙල කළ මාළු ආහාරවල තත්ව SLSI තත්වයේ විය.

Silver belly යොදා සිදුකළ මාළු ආහාර වල SLSI ශ්‍රේණි 1 බවට නිර්දේශ විය. මත්ස්‍ය ආහාර නිෂ්පාදනය සඳහා තෙරපුම ක්‍රමයේ තත්වයන් ඉහල තත්වයේ තිබීම SLSI නිර්දේශයට වැදගත් විය.

ඉහත සොයා බැලීම් වලදී පෙනී ගියේ ඉවතලන මාළු කොටස් වලින් හම, ඔළුව, අන්තරාංග හා අස්ථි 50% පමණ ප්‍රමාණයන්ගෙන් සමන්විත බවයි. නිෂ්පාදනාගාර වලදී 40% සිට 60% ප්‍රමාණයක් සියලුම වර්ග වලින් ස්ථිර ලෙස ඉවතලයි. මෝරු හා ටූනා වලින් ඉවතලන කොටස් 22% ක ප්‍රමාණයක් ආවරණය කරයි. මෙම නිෂ්පාදන විශ්ලේෂණය සඳහා මාළු කිලෝ 1 ක් සඳහා රුපියල් 52.99 ක පමණ වැයවීමක් සිදුවේ.

කර්මාන්තශාලා TVN අගය 35mg/ 100g වේ. දිනකට කිලෝ 2000 ක පමණ ඉවතලන කොටස් එක් කර්මාන්ත ශාලාවක එකතු වේ.

ප්‍රගතිය (%) භෞතික : 90% මූල්‍යමය : 122%

**ව්‍යාපෘතිය 6 : උපකරණ මිලදී ගැනීම.**

නියමිත කාලය තුලදී අවශ්‍ය උපකරණ ලෙස ජීව විද්‍යාත්මක ආරක්ෂිත කබඩ්, ඔටෝක්ලේව් 2 ක්, ඉන්කියුබේටරයක් මිලදී ගන්නා ලදී. ඊට අමතරව මිලදී ගැනීම් සඳහා අනෙක් කොටස් කීපයක්ද ඇනවුම් කරන ලදී.

මේ සඳහා දීර්ඝ ක්‍රමයක් අනුගමනය කරන බැවින් මිලදී ගැනීම් පමාවිය.

ප්‍රගතිය (%) භෞතික : 80% මූල්‍යමය : 45%

4. **ප්‍රකාශණ.**

**පර්යේෂණ ලිපි.**

(1) (ද ක්‍රෑස්, එම්.ඩී.එස්.ටී., ජය සිංහ, ජේ.එම්.පී.කේ., එදිරිසිංහ, ඊ.එම්.ආර්.කේ.බී., ද සිල්වා, ඩී.එස්. (2005)
ශ්‍රී ලංකාවේ බිම් වලින් හා ඇති කරන ලද Black Tiger ඉස්සා *Penaeus monodon* ගේ ලිපිඩ මිශ්‍රණය හා මේද ප්‍රමාණ.
ශ්‍රී ලංකා ජලජ විද්‍යාව සගරාව 10, 35-43.

(2) එදිරිසිංහ, ඊ.එම්.ආර්.කේ.බී., ග්‍රහාම්, ඒ.ජේ. සහ ටේලර්, එස්.ජේ. (2005).
Volatile කුඩු ගැස් සංවේදන තාක්ෂණය භාවිතයෙන් කහවරල් ටූනා මසුන්ගේ නැවුම් බව විවක්ෂණය කිරීම.

(3) (2005 ජුනි 09 නාරා සගරාවේ පල කිරීම සඳහා වාර්තාව සම්මත විය.)

(4) එදිරිසිංහ, ඊ.එම්.ආර්.කේ.බී., (2005) ජලජ නිෂ්පාදනවලදී Chemo therapeutic ඖෂධ මගින් සිදුවන දූෂණය.
ධීවර හා ජලජ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර වැඩමුළුව සඳහා ඉදිරිපත් කෙරිණි.
කොළඹ, ශ්‍රී ලංකාව. 29-31 මාර්තු.

(5) ගනේගමආරච්චි, ජී.ජේ., සුමනසිරි, ආර්.ඩී.කේ., සිරිල්, එච්.ඩබ්., අමරසිරි,සී., සහ පෙරේරා, එම්.ඩී.සී.ඒ., (2005).
ශ්‍රී ලංකාවේ අක්වෙරළ ධීවර කර්මාන්තයෙන් අපනයනය කරන *Thunnus albacares* ගේ වර්තමාන පසු අස්වනු තාක්ෂණ තත්වයන්.
ධීවර හා ජලජ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර වැඩමුළුව සඳහා ඉදිරිපත් කෙරිණි.
කොළඹ, ශ්‍රී ලංකාව. 29-31 මාර්තු.

(6) ජයසිංහ, පී.එස්., සහ ගලප්පත්ති, සී., (2005).
භාවිතයට ගත් හා භාවිතයට ගනිමින් සිටින ධීවර සම්පත් වලින් වැඩි අගයන්ගෙන් යුත් ධීවර නිෂ්පාදන සිදු කිරීම.
ධීවර හා ජලජ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර වැඩමුළුව සඳහා ඉදිරිපත් කෙරිණි.
කොළඹ, ශ්‍රී ලංකාව. 29-31 මාර්තු.

(7) ජයසිංහ, පී.එස්., සහ රාජකරුණා, ආර්.එම්.ඒ.පී.පී., (2005).
ශ්‍රී ලංකාවේ මත්ස්‍ය වෙළඳසැල් වල සිදුවන බැක්ටීරියා දූෂණයන්.
ශ්‍රී ලංකා ජාතික විද්‍යා කවුන්සිලයේ සගරාවට. 33(3) : 219-221

(8) ජයසිංහ, පී.එස්., සහ රාජකරුණා, ආර්.එම්.ඒ.පී.පී., (2005).
ශ්‍රී ලංකාවේ මධ්‍යම පළාතේ ධීවර වෙළඳසැල්හි බැක්ටීරියා රෝග කාරක වල බලපෑම්.
ආසියානු ධීවර සංගමය. (මුද්‍රණයට අනුමත විය.)

(9) කාරියවසම්, අයි. (2005).
කරදිය හා මිරිදිය ධීවර කර්මාන්තයේ තත්ව මතුවීම්.
ධීවර හා ජලජ පර්යේෂණ සඳහා වූ ජාත්‍යන්තර වැඩමුළුව.
කොළඹ, ශ්‍රී ලංකාව. 29-31 මාර්තු.

**පර්යේෂණ වාර්තා.**

(1) සුනාමියෙන් පසු මත්ස්‍ය පරිභෝජනය - ක්ෂුද්‍ර ජීවී මතුවීම්.

(2) හම්බන්තොට කරගංලේවායේ ජලයේ තත්වය.

(3) ලංකා ධීවර සංස්ථාවේ (CFC) බෙදාහැරීම් මාර්ගයේ මත්ස්‍ය පරිහරණය පිළිබඳ තත්වයන් ඇස්තමේන්තු කිරීම.

(4) අයිස්වල ගබඩා කර ඇති *Katsuwonus pelamis* (Skipjack ටූනා) ගේ භෞතික, ක්ෂුද්‍රජීවී, රසායනික හා සංවේදන තත්වයන් තක්සේරු කිරීම.

(5) බේරුවල ධීවර වරායේ බහලුම් කරන අක්වෙරළ ධීවර කර්මාන්තයේ යෙදෙන බෝට්ටුවල ලුණු දැමූ *Katsuwonus pelamis* (Skipjack ටූනා) ගේ තත්වයන් ඇස්තමේන්තු කිරීම.

**පත්‍රිකා.**

(1) අක්වෙරළ ධීවර යාත්‍රා වල සුදුසු මත්ස්‍ය පරිහරණයන්.

(2) මසුන් ගබඩා කිරීම සඳහා අයිස් යොදා ගැනීම.

(3) විකිණීම සිදුවන තුරු සුදුසු මත්ස්‍ය පරිහරණ ක්‍රමය.

(4) සංවේදන ක්‍රම මගින් නැවුම් මසුන් හඳුනා ගැනීම.

(5) නිවසේදි මත්ස්‍ය පරිහරණය.

(6) සුදුසු තත්වයේ මසුන් මිළදී ගැනීමේ සාමාන්‍ය තොරතුරු – "නිතරම අයිස් දැමූ මසුන් මිළදී ගන්න."

පත්‍රිකා දෙමළ භාෂා මාධ්‍යයටද පරිවර්තනය කෙරිණි.

4. **පුහුණුවීම් / සමුප්‍රජාතනීය වැඩ සටහන් ඉදිරියට.**

1. තේමාව – බෙදා හැරීම් මාර්ගයන්හි මත්ස්‍ය පරිහරණය (මූලික පරිහරණයන්).

   ඉලක්ක සමූහයන් : මසුන් විකුණන්නන්ය/මීගමුව ප්‍රදේශයේ සිල්ලර මාළු විකුණන කාන්තාවන් (මැයි 13, 2005)

2. තේමාව – අක්වෙරළ ධීවර යාත්‍රාවල කහවරල් ටූනා හා Skipjack ටූනා මසුන්ගේ සුදුසු පරිහරණයන්.

   ඉලක්ක සමූහයන් : අක්වෙරළ ධජීවර යාත්‍රිකයන් (10/8/2005)

3. තේමාව – මීගමුවේ ධීවර වෙළඳපොළෙහි සුදුසු මූලික මත්ස්‍ය පරිහරණයන්.

   ඉලක්ක සමූහයන් : මීගමුවේ දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ ධීවර පරීක්ෂකයන්. (2005 සැප්: 06)

4. තේමාව – අක්වෙරළ ධීවර යාත්‍රාවල කහවරල් ටූනා හා Skipjack ටූනා මසුන්ගේ සුදුසු පරිහරණයන්.

   ඉලක්ක සමූහයන් : මීගමුවේ දිස්ත්‍රික් ධීවර කාර්යාලයේ ධීවර පරීක්ෂකයන්. (2005 සැප්: 06)

5. වර්ල්ඩ් විෂන් ලංකා ආයතනය, නිකවැරටිය ප්‍රදේශයේ සංවර්ධන වැඩසටහන යටතේ මිරිදිය ධීවර කර්මාන්තය සඳහා උපදේශක සේවය.

6. ජාඩි පිළියෙල කිරීම.
   පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිඹුරත්තැව හා කවුඩුල්ල (SED/NARA එකතු වී)

7. ධීවර සමුපාකාර සමිති සඳහා පුහුණු කිරීම්.
   ශ්‍රී ලංකාවේ දකුණු පලාතේ සුනාමිය බලපෑ ප්‍රදේශවල ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය සඳහා JICA මගින් සංවිධානය කරන ලදී.

8. කරවල හා මාලදිවයින් මත්ස්‍ය සැකසුම් තාක්ෂණය : තංගල්ල සර්වෝදය කාන්තා සංවිධානය හා එක්ව.

9. සුනාමියෙන් පසු මත්ස්‍ය ආරක්ෂණය පිළිබඳ යටිතල වැඩසටහන් – ඉලක්ක සමූහයන් වූයේ මහජනයා, මත්ස්‍ය සැකසුම්කරුවන් හා පාරිභෝජකයන්.

## 6. **පුහුණුවීම් / වැඩමුළු සඳහා සහභාගිත්වයන්.**

1. සුනාමි බලපෑම් ඇති වූ ආසියානු රටවල වෙරළබඩ ධීවර හා ජලජ ප්‍රජාවගේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා වූ කලාපීය වැඩමුළුව.
   FAO කලාපීය කාර්යාලය, බැංකොක්, තායිලන්තය. 2005 පෙබරවාරි 28 සිට මාර්තු 01

2. මුහුදු ආහාර ආරක්ෂක කළමනාකරණය.
   SEAFDEC, සිංගප්පූරුව. 2005 සැප්: 20 සිට ඔක්තෝබර් 14

3. සුනාමිය බලපෑම කර්මාන්තවල ප්‍රතිසංස්කරණය සඳහා වූ සම්මන්ත්‍රණය.
   2005 මාර්තු 25, කොළඹ, IDB, ශ්‍රී ලංකාව.

4. MAMAS වැඩමුළුව. 2005 අගෝස්තු 16. මහනුවර, ශ්‍රී ලංකාව.

5. සංඛ්‍යාත්මක ලෙස නියැදි ලබා ගන්නා තාක්ෂණය : ග්‍රාමීය අංශයේ සංවර්ධන සඳහා තාක්ෂණික වැඩසටහන - පසු අස්වනු තාක්ෂණය ජාතික විද්‍යා පදනම.

# සාගර විද්‍යා අංශය.

## අංශ ප්‍රධානි : ආචාර්ය කේ. අරුලානන්තන්.

**1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :**

සාගර විද්‍යා අංශයේ උත්සාහය වන්නේ, අප රටේ සමුද්‍ර කලාපයේ සම්පත් වලින් කර්මාන්ත හා යටිතල සඳහා කළමනාකරණ හා වෙරළබඩ මුහුදු සම්පත් රටේ ආර්ථික, සමාජීය හා පරිසර අවශ්‍යතා සඳහා වටිනා ලෙස සම්පත් යොදා ගැනීමට ක්‍රියා කිරීමයි.

සාගර විද්‍යා අංශයේ ක්‍රියාකාරකම් ප්‍රධාන ප්‍රදේශ 3 ක් මූලික කොට සිදුවිය.

(1) **වෙරළාසන්න සාගර විද්‍යාව.**
වෙරළාසන්න ජල පද්ධතිවල ද්‍රව ගති විද්‍යා පිළිබඳ අවබෝධාත්මකව අභිප්‍රායන්වල යෙදීම. වෙරළාසන්න සම්පත පාරිසරික තත්වයන් අවක්‍රමණය වීම වැඩිදියුණු කිරීම.

(2) **අක්වෙරළ ආශ්‍රිත සාගර විද්‍යාව.**
ඉදිකිරීම් කර්මාන්තයන් විකල්පයක් ලෙස අක්වෙරළේ තැන්පත්ව ඇති වැලි යොදා ගැනීම හා ශ්‍රී ලංකාවේ මුහුදු මට්ටම් වල විචලනයන් හා එයින් වෙරළබඩ පද්ධති සම්පත් හා භූවිද්‍යාත්මක බලපෑම්.

- **සාගරික දත්ත කළමනාකරණය.**
  නොයෙක් අවස්ථාවන් සඳහා යොදා ගන්නා දත්ත හා තොරතුරු එකතු කර ගැනීම :
  පර්යේෂකයන්, පශ්චාත් උපාධි සිසුන්, රජයේ හා පෞද්ගලික සංවිධාන.

මීට අමතරව, පර්යේෂණ හා සංවර්ධන ක්‍රියාවලි හා පහත සඳහන් ජාතික අවශ්‍යතා සඳහා අංශය යෙදුණි.

- සේතු සමුද්‍රම් නැව් මාර්ග ව්‍යාපෘතියේ බලපෑම් අධීක්ෂණය
- මුහුදු මට්ටම් පදනම් කොට පූර්ව සුනාමි අනතුරු ඇඟවුම් පද්ධතිය ස්ථාපිත කිරීම.

මෙම ප්‍රධාන කොටස් 3 වටා සාගර විද්‍යා අංශය පර්යේෂණ ව්‍යාපෘති 6 ක් සම්පූර්ණ කරන ලදී.

අංශයේ කාර්ය මණ්ඩලය, පර්යේෂණ නිලධාරීන් 07 ක්, පර්යේෂණ සහකාරවරුන් 03 ක් හා කාර්යාල කාර්ය සහායක 01 ගෙන් සමන්විත විය.

පර්යේෂණ නිලධාරීන්ගේ වගකීම වූයේ, සියලුම පර්යේෂණ ක්‍රියාකාරීත්වයන්ගේ ව්‍යාපෘති සැලසුම් කිරීම හා වාර්තා පිළියෙල කිරීමයි. පර්යේෂණ සහකාරවරුන්ගේ වගකීම වූයේ, පර්යේෂණ සඳහා ක්ෂේත්‍රයේ දත්ත රැස් කිරීම, දත්ත සම්පාදනය හා නියැදි විශ්ලේෂණයයි.

**2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :**

| ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරීන් | කාලසීමාව |
|---|---|---|---|
| 1. වෙරළාසන්න ජලස්කන්ධයන්හි හා ඒ ආශ්‍රිත ජලාශවල සාගර විද්‍යා අධ්‍යයනය. | 655,000 | කේ.අරුලානන්තන්<br>එච්.බී.ජයසිරි<br>එස්.යූ.පී.ජිනදාස | 2004 ජනවාරි<br>සිට<br>2005 දෙසැම්බර් |
| 2. ශ්‍රී ලංකා ජාතික සාගර විද්‍යාත්මක දත්ත මධ්‍යස්ථානය. | 140,000 | කේ.නෙන්තකෝන් | 2004 ජනවාරි<br>සිට<br>2005 දෙසැම්බර් |

| | | | |
|---|---|---|---|
| 3. ජාතික සාගර විද්‍යා මධ්‍යස්ථානය. | 150,000 | කේ.තෙන්නකෝන් | 2004 ජනවාරි සිට 2005 දෙසැම්බර් |
| 4. ශ්‍රී ලංකාව අවට මුහුදේ කෙටිකාලීන හා දිගුකාලීන මුහුදු මට්ටමේ විචලනයන් අධ්‍යයනය කිරීම හා ආකෘතිගත කිරීම. | 430,000 | ජී.එම්.එස්.විජේරත්න | 2004 ජනවාරි සිට 2005 දෙසැම්බර් |
| 5. චන්ද්‍රිකා සාගර විද්‍යාව | 350,000 | ජේ.කේ.රාජපක්ෂ | 2004 ජනවාරි සිට 2005 දෙසැම්බර් |
| 6. භූ සාගර විද්‍යාව | 590,000 | එස්.යූ.පී.ජිනදාස | 2004 ජනවාරි සිට 2005 දෙසැම්බර් |
| එකතුව | 2,315,000 | | |

**3. කාර්ය සාධනය :**

**ව්‍යාපෘතිය 1 : වෙරළාසන්න ජල ස්කන්ධයන්හි හා ඒ ආශ්‍රිත ජලාශවල සාගර විද්‍යා අධ්‍යයනය.**

අධ්‍යයනය සඳහා දකුණු වෙරළ තීරයේ කොග්ගල කලපුව තෝරා ගන්නා ලදී. මෙම කලපුවට සම්බන්ධ බෙදී ඇති වාරිමාර්ග වල ජලය විවිධ කාර්යයන් සඳහා භාවිතා කරන අතර, සංසට්ටන ද වේ.

මෙම අධ්‍යයනය මගින් සංවර්ධන කටයුතු සඳහා ධීවර ප්‍රශ්ණ වල සමතුලිතතාව හා උපයෝජනය මෙම ජීවී සම්පත්වලින් ලබා ගැනීමට ජලමිතික විද්‍යාව යොදා ගනිමින් වඩා සුදුසු ක්‍රියා මාර්ග සොයා ගැනීම සිදුවිය. ජලමිතික විද්‍යාව මගින් කලපුවේ ජල හුවමාරු ක්‍රියාවලිය ස්ථාපිත කිරීමට සිදුවිය. කලපුවේ අවසාධිතයන් හා ජෛව විවිධත්වයන්ගේ භෞතික ජීව විද්‍යාත්මක හා රසායනික පරාමිතිකයන් තීරණය කෙරිණි. කලපුවේ මූලික නිෂ්පාදන හා ප්ලාවංගයන්ගේ තහවුරු කර ගැනීම් සිදුවිය.

කලපු පැත්තේ හා වැව් පැත්තේ (වරාබොක්ක ඇල) අතර ලවණ ජලය පැමිණීම, ජල මට්ටම් වෙනස්කම් නිරීක්ෂණය කිරීමේදී පෙනී ගියේ මාර්ග වැසී තිබුණද ලවණ ජලය පැමිණීම සිදුවී ඇති බවයි. ඉහළ ලවණතාවයක් ඇති කාල (පෙබරවාරි සහ මාර්තු), ඉහළ ප්‍රදේශවල (මත්තේගොඩ පාලම) මතුපිට හා ගැඹුරේ ලවණතාවය පිළිවෙලින් 16 සහ 22 PSU විය. ------- ඇළ ප්‍රදේශයේ මතුපිට හා ගැඹුරේ ලවණතාවය 34 PSU විය. කලපුවේ මාසික ලවණතා මධ්‍ය අගය 20 සිට 34.5 PSU විය. ලවණතාවය නිරීක්ෂණය කළ විට 2005 නොවැම්බර් හා මාර්තු මාස වලදී පිළිවෙලින් පහළ හා ඉහළ අගයන් ගෙන තිබුණි. මෙහි වාර්තාව වෙරළ සම්පත් කළමනාකරණ ව්‍යාපෘතියට (CRMP) ඉදිරිපත් කළ අතර, එමගින් කොග්ගල ගංමෝය පද්ධතියේ ප්‍රතිසංස්කරණ කටයුතු සඳහා යොදාගත හැකි විය.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 69.33%

**ව්‍යාපෘතිය 2 : ශ්‍රී ලංකා ජාතික සාගර විද්‍යාත්මක දත්ත මධ්‍යස්ථානය (NODCSL)**

ශ්‍රී ලංකා ජාතික සාගර විද්‍යාත්මක දත්ත මධ්‍යස්ථානයේ (NODC-SL) අභිප්‍රාය වන්නේ ජල තීරයේ සාගර විද්‍යාත්මක දත්ත ලබා ගැනීම, උසස් කිරීම ලේඛණගත කිරීම, ව්‍යාප්ත කිරීම සහ ජාත්‍යන්තර මට්ටමේ සාගර විද්‍යා දත්ත හා තොරතුරු අතර හුවමාරු කර ගැනීම වේ.

පහත සඳහන් කටයුතු සම්පූර්ණ කරන ලදී.

සමුද්‍රමාරු වාර්තා 3 ක් සම්පූර්ණයෙන් පරිගණක ගත කරන ලදී.

ශ්‍රී ලංකාව වටා ඉන්දියන් සාගරයේ සාගර විද්‍යා දත්ත ඇතුල් කිරීම හා ලේඛණගත කිරීම කරන ලදී. (උදාහරණ ලෙස, මුහුදු මට්ටමේ උෂ්ණත්වය, රළ හා තරංග)

මෙම දත්ත රැස් කිරීම පහත වෙබ් අඩවි මගින් සිදුවිය. NOAA (ජාතික සාගර විද්‍යා සහ වායුගෝලීය සංගමය), අන්තර් රාජ්‍ය සාගර විද්‍යා කොමිසම (IOC), සාගර තොරතුරු සේවා සඳහා වූ ඉන්දියානු මධ්‍යස්ථානය (INCOIS) ලබාගත් දත්ත (NODC) ෆෝල්ඩරය මත ලේඛණගත කරන ලදී.

උසස් ලේඛණගත කිරීම සඳහා නියැදි මාර්ග 2 ක් සම්පූර්ණයෙන් ස්ථාපිත කෙරිණි.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 100%

**ව්‍යාපෘතිය 3 : ජාතික සාගර විද්‍යා මධ්‍යස්ථානය (CNOC)**

මෙම මධ්‍යස්ථානය ස්ථාපිත වී ඇත්තේ ජාත්‍යන්තර සහයෝගිතාව පදනම් කොටගත් ජාතික කලාපීය හා විශ්ව ක්‍රියාකාරකම් හා සාගරයේ අනෙකුත් අංග මූලික කොට ගෙනය. යුනෙස්කෝවේ අන්තර් රාජ්‍ය සාගර විද්‍යා කොමිසමේ සාමාජිකයෙක් ලෙස අරමුණු කොටගෙන සාගර විද්‍යා මධ්‍යස්ථානයට වගකීම් දරණ ආයතනයක් ලෙස නාරා ආයතනය ස්ථාපනය කරන ලදී

ඉන්දියානු සාගර මධ්‍යස්ථානයේ අයි. ඕ. සී. හි කලාපීය කමිටුවේ හතරවැනි සැසිය 2005 දෙසැම්බර් 8 සිට 10 දක්වා පැවැත්විනි. සමාරම්භක උළෙලට බංග්ලාදේශය, පකිස්ථානය, ඉන්දියාව, මාලදිවයින, ශ්‍රී ලංකාව, තායිලන්තය හා සවුදි අරාබියාව සහභාගි විය.

ප්‍රගතිය (%) භෞතික : 95 % මූල්‍යමය : 100%

**ව්‍යාපෘතිය 4 : ශ්‍රී ලංකාව අවට මුහුදේ කෙටිකාලීන හා දිගුකාලීන මුහුදු මට්ටම් විචලනය අධ්‍යයනය කිරීම හා ආකෘතිගත කිරීම.**

මෙම ව්‍යාපෘතිය යොමුවූයේ, භෞතික ක්‍රියාවලි සඳහා සමෝධානික බලපෑම් ස්ථාපිත කිරීමයි. මුහුදු මට්ටම් වල රළයන්ගේ සැකැස්ම සඳහා බලපාන වායුපීඩනය, ලවණතාවය, උෂ්ණත්වය, සුළඟ ආදියයි. මෙහි දත්ත හා තොරතුරු මගින් ව්‍යාපෘතියේ අභිප්‍රාය වූයේ වෙරළ ඉදිකිරීම් සඳහා ඉංජිනේරුමය සැකසීම් හා ක්‍රියාවන් ශ්‍රී ලංකාව වටා මුහුදේ නාවික හා දීර්ඝකාලීන මුහුදු මට්ටම් අධ්‍යයනයයි. දීර්ඝකාලීන මුහුදු මට්ටම් දත්ත යොදා ගැනුනේ වෙරළ පරිසරයේ කළමනාකරණය සඳහා අවශ්‍ය මිනුම් සඳහාය.

පහත සඳහන් ක්‍රියාකාරකම් සපුරන ලදී.

- පෝක් බොක්ක, පෝක් සන්ධිය, මන්නාරම් හා කැළණි ගඟ ආශ්‍රිත ජලයේ චක්‍රීය රටාවන්ගේ සංඛ්‍යා ආකෘතියක්.
- දීර්ඝකාලීන හා කෙටිකාලීන මුහුදු මට්ටම් චලනයන් ඇස්තමේන්තු කිරීම.
- නව මුහුදු මට්ටම් ප්‍රවේශයක් ස්ථාපිත කිරීම.

ප්‍රගතිය (%) භෞතික : 98 % මූල්‍යමය : 42.83%

**ව්‍යාපෘතිය 5 : චන්ද්‍රිකා සාගර විද්‍යාව.**

මෙම අධ්‍යයනය යොමුවූයේ, චන්ද්‍රිකා මගින් ලබාගත් සාගරයේ වර්ණ ආශ්‍රිත බලපාන සත්ව ප්ලාවංග වල පැතිරීම, ප්‍රභාසංස්ලේෂණ ක්‍රියාවලිය හා සාගර මතුපිට උෂ්ණත්වය අධීක්ෂණයයි. මෙම ප්‍රතිබිම්බ මගින් වායුගෝලීය වෙනස්කම් එනම්; වලාකුළු විකිරණ ගලායාම් හා වායු විසිරීම් අධීක්ෂණය සඳහා භාවිතා වේ. අධ්‍යයනය සඳහා (Moderate Resolution Imaging Spectroradiometer තාක්ෂණය (MODIS) භාවිතා වේ. වලාකුළු අනාවරණ ගණනය කර ගැනීම සඳහා ගණනයන් නිවර්තන හා උපනිවර්තන රටවල් සඳහා යොදා ගැනේ. අරාබි මුහුදේ හා බෙංගාල බොක්කේ වර්ණ සිතියම් තිපැයිනි.

ප්‍රගතිය (%) භෞතික : 25 % මූල්‍යමය : 13.75%

2005 මැයි කාලය සිට මෙහි නිලධාරියා චන්ද්‍රිකා ප්‍රතිබිම්බ පිලිබඳ අධ්‍යයනය සඳහා තායිලන්තයේ ආසියානු තාක්ෂණික ආයතනයට සම්බන්ධ විය.

**ව්‍යාපෘතිය 6 : භූ සාගර විද්‍යාව.**
**අක්වෙරලේ වැලි තැන්පත්වීම.**

මෙම ව්‍යාපෘතිය යොමුවූයේ සාගරයේ ක්‍රියාකාරිත්වයටයි.

(උදා: ඉපිලීම්, තාප ප්‍රගමනය ආදිය) පිලිබඳ අවබෝධයක් ලබා ගැනීම, ජල ස්කන්ධයන් හා එහි නිෂ්පාදනයන් සහ ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකයේ පැතිරී ඇති අජීවී පාෂාණ සම්පත් හඳුනා ගැනීමයි. ඉදි කිරීම් කර්මාන්තය සඳහා හිග වැලි අක්වෙරලේ තැන්පත් වී ඇති පාෂාණ හඳුනාගෙන සුදුසු ස්ථානවලදී වෙන්කර (වැලි, ගල්, කොරල් අවසාධිත) ලෙස එම වැලි සිවිල් ඉංජිනේරු ඉදිකිරීම් සඳහා යොදා ගැනීම.

මෙම අක්වෙරලේ අවසාධිතයන් පැතිරීම පෝක් වේ, පෝක් සමුද්‍රය, මන්නාරම තීරයේ සිතියම්ගත කරන ලදී. එම අක්වෙරලේ බර පාෂාණ පැතිරීමේ සිතියම් අනුව ත්‍රිකුණාමලය සිට පුල්මුඩේ දක්වා පිලියෙල කොට ඉදිරිපත් කෙරිණි.

ප්‍රගතිය (%) භෞතික : 80 % මූල්‍යමය : 42.83%

**දුෂ්කරතා.**

ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතියක් ලබාගැනීමට අක්වෙරලේ පර්යේෂණ යාත්‍රාවක් නොමැති විය.

## 4. 2005 වසරේදී මුද්‍රණය කළ විද්‍යාත්මක ලිපි හා වාර්තා.

**වාර්තා.**

1. පෝක් වේ, ආදම්ගේ පාලම හා ගල්ෆ් මන්නාරම් මූලික කොට ගත් පදනම් තත්වයන් ස්ථාපිත කිරීම සඳහා ඉක්මන් තක්සේරුගත කිරීම - එස්.යූ.පී.ජිනදාස
2. සමුද්‍රමාරු නාවුක සිතියම් (SM 1, 2, 9) නැවත පිලියෙල කිරීම - කේ.තෙන්නකෝන්
3. කොග්ගල කලපුවේ අතුරු අධ්‍යයන වාර්තාව, 2005 - එච්.බී.ජයසිරි
4. පෝක් වේ, ආදම්ගේ පාලම හා ගල්ෆ් ඔෆ් මන්නාරම මූලික කොටගත් පදනම් තත්වයන් ස්ථාපිත කිරීම පිලිබඳ ඉක්මන් තක්සේරු ගත කිරීමේ මිනුම්, 2005.

**පත්‍රිකා.**

1. අරුලානන්තන්, කේ. 2005
   තොගැඹුරු නිවර්තන කලපුවලින් පිරිසිදු ජලය හුවමාරුව සඳහා නීතිමය බලපෑම්.
   පුත්තලම කලපුව, ශ්‍රී ලංකාව - ඉන්දියානු සාගර සමුද්‍ර පරිසර සමුළුව.
   2005 පෙබරවාරි 14-18, පර්ත්, ඔස්ට්‍රේලියාව.

2. ජයසිරි, එච්.බී., 2005
   ශ්‍රී ලංකාවේ කලපු 3 ක මූලික නිෂ්පාදනය හා එහි සම්බන්ධ අංගයන්.
   ධීවර හා ජලජ පර්යේෂණ පිලිබඳ ජාත්‍යන්තර වැඩමුළුව - ශ්‍රී ලංකාව.
   2005 මාර්තු 29-31.

3. ජයසිරි, එච්.බී., සහ ප්‍රියදර්ශනී, ඩබ්.එස්.සී., 2005
   ශ්‍රී ලංකාවේ පෝක් සමුද්‍රය සහ ගල්ෆ් ඔෆ් මන්නාරම් මුහුදු පතුලේ ජලවාංගයන්හි විවිධත්වයන්.
   SLAFAR 11 වැනි වාර්ෂික සැසිය.

4. ජිනදාස, එස්.යූ.පී., සහ විජේරත්න, ජ්.එම්.එස්. (2005)
යාල වෙරළ තීරයේ සුනාමි ව්‍යසනයන්ගෙන් ආරක්‍ෂා කරලීම සඳහා භූ රූපනවල බලපෑම.
ආසියා පැසිෆික් 3 වන ජාත්‍යන්තර සමුළුව - කොරියාව.

5. ජිනදාස, එස්.යූ.පී., සහ අරුළානන්තන්, කේ., (2005)
ශ්‍රී ලංකාවේ වෙරළ ආගාධයන් වෙනස්වීම මගින් සුනාමි තත්වයන් නිර්මාණය වීම.
ආසියානු හා පැසිෆික් වෙරළ - 3 වැනි ජාත්‍යන්තර සමුළුව - කොරියාව.

6. ජිනදාස, එස්.යූ.පී., (2005)
ශ්‍රී ලංකාවේ යාල වෙරළ තීරයේ සුනාමි ව්‍යසනයන්ගෙන් ආරක්‍ෂා කරලීම සඳහා භූ රූපවල බලපෑම (පෝස්ටර්)
වෙරළබඩ කලාපයේ සමුද්‍ර හා බිම් අන්තර් ක්‍රියා - 2 වැනි ආරම්භක විද්‍යා රැස්වීම, නෙදර්ලන්තය.

7. ජිනදාස, එස්.යූ.පී., (2005)
මුහුදේ ජලතරංග පද්ධතියේ පහළ අවසාධිතයන්ගේ බර ඛනිජ තැන්පත් බෙදී යාම.
ධීවර හා ජලජ විද්‍යා සගරාව - 10 වෙළුම.

8. ජිනදාස, එස්.යූ.පී., (2005)
2D ප්‍රතිබිම්බ මගින් වෙරළබඩ කලාපයේ ලවණ හා පිරිසිදු ජලය අතර අන්තර් සම්බන්ධතාව.
වැඩමුළුව සඳහා ධීවර හා ජලජ පර්යේෂණ ජාත්‍යන්තර වැඩමුළුව - නාරා, කොළඹ, ශ්‍රී ලංකාව.

9. රාජපක්‍ෂ, ජේ.කේ., ලාල් සමරකෝන් (2005)
බහු සංවේදක හා බහුකාලීන චන්ද්‍රිකා දත්ත භාවිතයෙන් මෙකොන් ඩෙල්මාවේ ගොඩබිම් ආවරණය හා ගොඩබිම් භාජනය වර්ගීකරණය.
දකුණු වියට්නාමයේ ස්වයංක්‍රිය සංවේදන සඳහා වූ 26 වැනි සමුළුව.

[illegible]
ගාලු නගරය, ශ්‍රී ලංකාව.
සුනාමි විද්‍යා වැඩසටහන, AIT

11. රාජපක්‍ෂ, ජේ.කේ., 2005
Terra/MODIS චන්ද්‍රිකා ඡායාරූප මගින් වලාකළු සොයා ගැනීමේ ක්‍රමවේදයන් කලාපීයව වෙනස්වන ආකාරය.
ධීවර හා ජලජ පර්යේෂණ - ශ්‍රී ලංකාව.
ජාත්‍යන්තර වැඩමුළුව සඳහා.

12. තෙන්නකෝන්, ටී.කේ.ඩී.,
"ශ්‍රී ලංකාවට සමුද්‍ර ශක්තීන්ගේ අවශ්‍යතා"
ධීවර හා ජලජ පර්යේෂණ ජාත්‍යන්තර සමුළුව සඳහා ඉදිරිපත් කිරීමට.
29-31 2005 මාර්තු, නාරා, කොළඹ, ශ්‍රී ලංකාව.

13. පට්ටියආරච්චි, සී., විජේරත්න, ජ්.එම්.එස්.,
ඉන්දියානු සාගර සුනාමිය නිසා වෙරළබඩ හා වරායන්ගේ දෝලනය.
5 වැනි ජාත්‍යන්තර සම්මන්ත්‍රණය, සමුද්‍ර තරංග නිර්ණය කිරීම හා විශ්ලේෂණය
WAWES 2005 මැඩ්රිඩ්, ස්පාඤ්ඤය.
3-7 2005 ජූලි.

14. එම්.ජ්.මෙරිෆීල්ඩ්, වයි.එල්.ෆිරින්ග්, පී.බ්‍රන්ඩ්රිට්, ආර්.ෆාරේ, බී.කිලොන්ස්කි, ඩබ්.නයිට්, එල්.කොන්ග්, සී.මගොරි, පී.මනුරංග්, සී.මැක්රි, ඩබ්.මිචෙල්, එෆ්.ෂිලිංග්ටස්, ජ්.එම්.එස්.විජේරත්න, පී.නාඩ්වෙල්, ජේ.ජාර්ඩින්, එස්.නක්ෂරා, එෆ්.වයි.පෝටර්, එන්.ටුරස්කි
ඉන්දියානු සාගර උදම් තාව නිරීක්‍ෂණය
සුනාමි - දෙසැම්බර් 26 2004, භූ භෞතික පර්යේෂණ ලිපි. 32, 2005

15. විජේරත්න, ඒ.එම්.එස්. සහ පට්ටියආරච්චි, සී.
ශ්‍රී ලංකාවේ වෙරළ තීරයේ 2004 දෙසැම්බර් 24 සහ 2005 මාර්තු 28 සුනාමි රළයන්ගේ දෝලනයන්.
3 වැනි ආසියා පැසිෆික් ජාත්‍යන්තර සමුළුව, 4-8 2005 සැප්තැම්බර්, කොරියාව.

16. විජේරත්න, ඒ.එම්.එස්.,
වෙරළේ සුනාමි කුණාටු හා ඉපිලීම් වල හැසිරීම.
21 වැනි වාර්ෂික සැසිය - ශ්‍රී ලංකා භූ විද්‍යා සංගමය.
"ස්වභාවික ව්‍යසනයන්හිදී භූ විද්‍යාඥයින්ගේ කාර්යය"
2005, පේරාදෙණිය විශ්ව විද්‍යාලය.

17. විජේරත්න, ඒ.එම්.එස්., චරිත බී. පට්ටියආරච්චි සහ එමා ගේල්.,
පෝක් සන්ධිය හරහා ජල හුවමාරුව හා මෝසම් චක්‍රයේ ආකෘතියක්.
IOMEC, 2005 පෙබරවාරි 14-18 , බටහිර ඕස්ට්‍රේලියාව.

18. විජේරත්න, ඒ.එම්.එස්., සහ එල්.රිඩ්බර්ග්.,
ශ්‍රී ලංකාවේ පුත්තලම කලපුවේ උදම් දෝලනයන්ගේ ආකෘතියක් හා නියම වේලාවන්හිදී විශාල ලෙස සිදුවන චක්‍රයන්.
IOMEC, 2005 පෙබරවාරි 14-18 , පර්ත්, බටහිර ඕස්ට්‍රේලියාව.

19. විජේරත්න, ඒ.එම්.එස්., චරිත බී. පට්ටියආරච්චි.
ශ්‍රී ලංකාවේ ජලයේ මුහුදු මට්ටම්වල වෙනස්වීම්.
IOMEC, 2005 පෙබරවාරි 14-18 , පර්ත්, බටහිර ඕස්ට්‍රේලියාව.

**පරීක්ෂාවන් / පුහුණු කිරීම්.**

1. එස්.ලියනගේ මෙනෙවිය -
වාස්තු විද්‍යා දෙපාර්තමේන්තුව, මොරටුව විශ්ව විද්‍යාලය.
2. එම්. එස්. සී. (වාස්තු විද්‍යාව) - කේ.තෙන්නකෝන්
3. ජේ.කේ.පී.පී.සංජීව - විද්‍යා පශ්චාත් උපාධි ආයතනය.
4. එම්. එස්. සී. (සාගර විද්‍යාව) එච්.බී.ජයසිරි
5. කේ.කතිර කීර්තන් - යාපනය විශ්ව විද්‍යාලය.
6. එච්.බී.ජයසිරි - ධීවර විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව.

**පුහුණුවීම් සඳහා.**

Geodesy වැඩමුළුව

දියතලාව මිණුම් පාසැල, ශ්‍රී ලංකාව.
11-15 ජුලි 2005, එස්.යූ.පී.ජිනදාස

ශ්‍රී ලංකාවේ මහාද්වීපික තටකයේ බාහිර තීරය නිරූපනය.
ඉන්දු ශ්‍රී ලංකා වැඩමුළුව.
ඉන්දියාව, 25-30 2005 අප්‍රේල්.
එස්.යූ.පී.ජිනදාස

මුහුදු නීතිය පිළිබඳ වැඩමුළුව, ශ්‍රී ලංකාව.
2005 මැයි 16-25 - එස්.යූ.පී.ජිනදාස

මුහුදු පර්යේෂණ කණ්ඩායමක් සමග පුහුණුව.
PNG සිට ඩාර්වින් - සිඩ්නි විශ්ව විද්‍යාලය.
24.06.05 - 08.07.05
ඩබ්.එන්.සී.ප්‍රියදර්ශනී

උදම් ධාරිතා හා උපකරණ භාවිතය පිළිබඳ උසස් පුහුණුව. Federal Maritime Agency (BSH) ජර්මනිය.
06-17.09.2005 - ඊ.එම්.එස්.විජේරත්න.

**ලිපි හා පත්‍රිකා.**

ද්‍රාව්‍ය ඔක්සිජන් හා ජීව විද්‍යාත්මක නිෂ්පාදනයන්.
පුවත්පත් සඳහා ව්‍යාප්ති අංශයට.

ද්‍රාව්‍ය ඔක්සිජන් (DO) හා Biota ජලජ පද්ධතින් (සිංහලෙන්)

**අනෙකුත් ක්‍රියාකාරකම්.**

ධීවර අමාත්‍යාංශය මගින් ගිංතොට මහා විද්‍යාලයේ සංවිධානය කළ වැඩ සටහනට සහභාගිත්වය.
2005 මැයි 28, ගාල්ල.

**සම්මන්ත්‍රණ/ වැඩමුළු/ සමුළු/බහු සාකච්ඡා සඳහා සහභාගිත්වය.**

සේතු සමුද්‍රම් සඳහා ශ්‍රී ලංකා - ඉන්දියානු කාර්මික මට්ටම් සාකච්ඡාව.
ප්‍රථම වටය 2-3 - ජනවාරි 2005
දෙවන වටය 1-08-2005
කේ.අරුලානන්තන්

IOGOOS/JCOMM බටහිර ඉන්දියානු සාගර XBT පුහුණු වැඩමුළුව මියන්මාරය, ගෝවා, ඉන්දියාව.
5-7 ඔක්තෝබර් 2005
කේ.අරුලානන්තන්

ඉන්දියානු සාගර සමුද්‍ර පරිසර සමුළුව (IOMEC)
පර්ත් ඔස්ට්‍රේලියාව - 14-18 පෙබරවාරි 2005.
කේ.අරුලානන්තන් හා ඊ.එම්.එස්.විජේරත්න.

පොදු සම්ප්‍රජානන කාලගුණ වෙනස්වීම්.
සම්මන්ත්‍රණය - කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකාව 25/10/05
ඩබ්.එන්.සී.ප්‍රියදර්ශණී

# සේවා හා මෙහෙයුම් අංශය.

## අංශ ප්‍රධානි : ඉංජිනේරු පී.ඕ.එල්.පී.බණ්ඩාර මහතා.

### 1. වර්ෂය පිළිබඳ සමාලෝචනය :

සේවා හා මෙහෙයුම් අංශය විසින් එදිනෙදා හා පහත සඳහන් අංශවල නඩත්තු කටයුතු පාලනය කිරීම කෙරෙහි වගකීම දරයි.

- ප්‍රවාහන පහසුකම් සැලසීම.
- සිවිල් වැඩ.
- යාන්ත්‍රික වැඩ.
- විදුලි / ඉලෙක්ට්‍රොනික්.
- වායු සමීකරණ, ඡායා පිටපත් උපකරණ.

නාරා ආයතනයේ පර්යේෂණ හා සංවර්ධන කටයුතු සිදු කරන අංශයන් සඳහා ප්‍රවාහන පහසුකම් සැපයීම ප්‍රධාන කටයුත්තයි. එදිනෙදා සහ ක්ෂේත්‍ර කටයුතු සඳහා වාහන ධාවනය සඳහා යෙදවීම සහ පාලනය කිරීම, සේවා හා මෙහෙයුම් අංශය විසින් සිදු කරනු ලබයි. පසුගිය අවුරුදු කිහිපයක පටන් අළුත් වාහන ලබා ගැනීමක් සිදු වී නැත. මෙනිසා නාරා ආයතනයේ පර්යේෂණ අවශ්‍යතා සඳහා වාහන වෙන් කිරීම ඉතා අපහසු තත්වයක පවතී. විශාල ප්‍රමාණයක් වාහන අවුරුදු 12 කට වඩා පරණ ඒවා වේ. මෙනිසා මෙම වාහන නඩත්තුව සඳහා කාලය හා මුදල් විශාල ලෙස වැය වේ. මෙනිසා පරණ වාහන වෙනුවට අළුත් වාහන මිලදී ගැනීම යෝග්‍ය වේ. නාරා ආයතනයේ රියදුරන් 26 දෙනෙකු සිටින නමුත් ධාවන තත්වයේ වාහන ඇත්තේ අවුරුද්ද සඳහා 18 ක් පමණි.

විද්‍යාගාරයන්හි උපකරණවල නඩත්තු හා සේවා කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී. මුහුදු ආශ්‍රිතව නිසා වායුසමනය උපකරණ වල නඩත්තු කටයුතු නිතරම සිදුකරන ලදී. ඡායා පිටපත් උපකරණ, මුද්‍රණ උපකරණ හා ෆැක්ස් යන්ත්‍රවල නඩත්තු අංශය මගින් ඉටු කරන ලදී.

**බාධකයන්.**

සුනාමි ව්‍යසනය නිසා නාරා ආයතනයේ උපකරණ, වාහන, ගොඩනැගිලිවලට විශාල ලෙස අලාභහානි සිදුවිය. මෙනිසා නාරා ආයතනයේ කළමනාකාරිත්වය නිතර නිතර වෙනස්වීම නිසා සමහර ක්‍රියාකාරකම් සිදු කිරීමට බාධක පැමිණුනි. (2005/03/01 සිට 2005/12/31 දක්වා කාලය තුළදී අධ්‍යක්ෂ ජනරාල්වරු හතරදෙනෙකු සේවය කරන ලදී.)

### 2. සිදු කරන ලද ක්‍රියාකාරකම් :

| වැඩ සටහන | ව්‍යාපෘතිය | වෙන් කළ මුදල රු. මි. | භාර නිලධාරින් | කාලසීමාව | |
|---|---|---|---|---|---|
| 1. සිවිල් ඉදිකිරීම් / අළුත්වැඩියා කිරීම. | 1.1 ප්‍රධාන ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු. | 5.0 | පී.ඕ.එල්.පී.බණ්ඩාර | 05/01/01 | 05/02/31 |
| | 1.2 පර්යේෂණ මධ්‍යස්ථානවල අළුත්වැඩියා කටයුතු. | 3.0 | පී.ඕ.එල්.පී.බණ්ඩාර | 05/01/01 | 05/12/31 |
| | 1.3 සුනාමියෙන් හානි වූ ගොඩනැගිලි අළුත්වැඩියාව. | 1.561 | පී.ඕ.එල්.පී.බණ්ඩාර | 05/01/01 | 05/12/31 |
| 2. වාහන අළුත්වැඩියාව | 2.1 20-3224 වින්කර්/ වර්ණාලේපනය 54-2074 වින්කර්/ වර්ණාලේපනය | 2.0 | පී.ඕ.එල්.පී.බණ්ඩාර බී.එල්.එස්.විමලසිංහ | 05/01/01 | 05/12/31 |

32/3417
විත්කර්/ වර්ණාලේපනය
61/0012
විත්කර්/ වර්ණාලේපනය
58-1378
එන්ජින් අළුත්වැඩියාව
57-4052
එන්ජින් අළුත්වැඩියාව
61-6251
අනතුරු අළුත්වැඩියාව
57-4053
අනතුරු අළුත්වැඩියාව
19-7768
අනතුරු අළුත්වැඩියා

| | | | | | |
|---|---|---|---|---|---|
| 3. උපකරණ මිළදී ගැනීම් | 3.1 වායු සම්කරණ මුදුණ යන්ත්‍ර වැඩපළ ආයුධ. | 0.77 | පී.ඕ.එල්.පී.බණ්ඩාර | 05/01/01 | 05/12/31 |

**3. කාර්ය සාධනය :**

**ව්‍යාපෘතිය 1.1 : ප්‍රධාන ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු.**

නාරා ආයතනයේ ප්‍රධාන ගොඩනැගිල්ල අවුරුදු 23 කට වඩා පැරණි අතර, එය අළුත්වැඩියා කළයුතු වේ. නමුත් අවුරුද්ද තුළදී අපට මෙය සපුරාගත නොහැකි විය. කුඩා ශ්‍රවණාගාරයේ අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කලත් තිර රෙදි දැම්ම සිදු නොවිය. ප්‍රධාන ගොඩනැගිල්ලේ සිදු වූ හානි සඳහා ඇලුමිනියම් දොර හා ජනේල සඳහා ටෙන්ඩර් කැඳවූවද, 2005 වසර තුළදී එය සම්පූර්ණ කරගත නොහැකි විය. මෙම අරමුණ 2006 වසර තුළදී සම්පූර්ණ කරගත හැකි වනු ඇත. ත්‍රිකුණාමලයේ උදම් ධාරිතා මැදිරිය සැදීම අවසන් විය.

ප්‍රගතිය (%) භෞතික : 42 % මූල්‍යමය : 53.29%

**ව්‍යාපෘතිය 1.2 : පර්යේෂණ මධ්‍යස්ථාන වල අළුත්වැඩියා කටයුතු.**

කඩොල්කැලේ හා කල්පිටිය මධ්‍යස්ථානවල අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට 2005 වසරට ටෙන්ඩර් කැඳවන ලදී. කල්පිටිය මධ්‍යස්ථානය අළුත්වැඩියාව සඳහා දෙදෙනෙකු ටෙන්ඩර් ඉල්ලුම් කළද ඔවුන් ටෙන්ඩර් පටිපාටියට අයත් ක්‍රමයන් අනුගමනය නොකළ බැවින් නැවත ටෙන්ඩර් කැඳවීමට සිදුවිය. කඩොල්කැලේ අළුත්වැඩියා කටයුතු සඳහා කිසිම අයෙකු ප්‍රතිචාර දැක්වූයේ නැත.

ප්‍රගතිය (%) භෞතික : මූල්‍යමය :

**ව්‍යාපෘතිය 1.3 : සුනාමියෙන් හානි වූ ගොඩනැගිලි අළුත්වැඩියාව.**

සුනාමියෙන් විනාශ වූ දොරවල් සඳහා ඇලුමිනියම් දොරවල් සවි කරන ලදි සභාපතිතුමාගේ හා අභ්‍යන්තර ජලජීවී වගා අංශයේ ගොඩනැගිල්ලේ අළුත්වැඩියා කටයුතු සම්පූර්ණ කරන ලදී

ප්‍රගතිය (%) භෞතික : 42 % මූල්‍යමය : 36.12%

**ව්‍යාපෘතිය 2.1 :**

20 - 3224 විත්කර් / වර්ණාලේපනය
50 - 2074 විත්කර් / වර්ණාලේපනය
32 - 3417 විත්කර් / වර්ණාලේපනය
61 - 0012 විත්කර් / වර්ණාලේපනය
58 - 1378 එන්ජින් අළුත්වැඩියාව
57 - 4052 එන්ජින් අළුත්වැඩියාව
61 - 6251 අනතුරු අළුත්වැඩියාව
57 - 4053 අනතුරු අළුත්වැඩියාව
19 - 7768 අනතුරු අළුත්වැඩියාව

| | |
|---|---|
| 20 - 3224 | ටින්කර් / වර්ණාලේපනය වැඩ සම්පූර්ණ කරන ලදී. |
| 50 - 2074 | ටින්කර් / වර්ණාලේපනය වැඩ සම්පූර්ණ කරන ලදී. |
| 32 - 3417 | ටින්කර් / වර්ණාලේපනය වැඩ සම්පූර්ණ කරන ලදී. |
| 61 - 0012 | ටින්කර් / වර්ණාලේපනය වැඩ සම්පූර්ණ කරන ලදී. |
| 58 - 1378 | එන්ජින් අළුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී. |
| 57 - 4052 | එන්ජින් අළුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී. |
| 61 - 6251 | අනතුරු අළුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී. |
| 57 - 4053 | අනතුරු අළුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී. |
| 19 - 7768 | අනතුරු අළුත්වැඩියාව සම්පූර්ණ කරන ලදී. |

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 90.74%

**ව්‍යාපෘතිය 3.1 : වායු සමීකරණ, මුද්‍රණ යන්ත්‍ර, වැඩපල ආයුධ.**

අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය, සභාපති කාර්යාලය සහ කුඩා ශ්‍රවණාගාරය සඳහා අළුත් වායු සමීකරණ උපකරණ සවි කරන ලදී. අනෙකුත් අවශ්‍ය උපකරණ වූ මුද්‍රණ යන්ත්‍ර, වැඩපල ආයුධ ආදිය ලබා ගැනීම සම්පූර්ණ කරන ලදී.

ප්‍රගතිය (%) භෞතික : 90 % මූල්‍යමය : 95.76%

**පුනරාවර්තන අයවැය යටතේ වූ නඩත්තු කටයුතු.**

පුනරාවර්තන අයවැය යටතේ ගොඩනැගිලි, විදුලිය, ජල සැපයුම්, දුරකථන, වායු සමීකරණ පද්ධති, පරිගණක පද්ධති උපකරණ හා ආයුධ පවත්වාගෙන යෑම සිදුවිය.

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## 2005 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය

| වත්කම් | අංකය | 2005 | 2004 |
|---|---|---|---|
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපළ ගොඩනැගිලි හා උපකරණ | (13) | 1,239,419,618.39 | 301,515,540.00 |
| **ජංගම වත්කම්** | | | |
| 2005/12/31 දිනට තොගය | (14) | 2,311,484.51 | 862,698.00 |
| ණයගැතියෝ සහ පූර්ව ගෙවීම් | (15) | 2,208,938.14 | 3,460,766.00 |
| තැන්පතු | (16) | 807,2590.00 | 807,250.00 |
| අත්තිකාරම් | (17) | 934,667.96 | 2,026,820.00 |
| කාර්ය මණ්ඩල ණය | (18) | 9,179,213.04 | 8,018,427.00 |
| අත ඇති සහ බැංකුවේ ඇති මුදල් | (19) | 18,268,489.51 | 2,267,175.00 |
| | | 33,710,043.16 | 17,443,136.00 |
| **මුළු වත්කම** | | **1,273,129,661.55** | **318,958,679.00** |
| **ස්කන්ධයන් සහ බැරකම්** | | | |
| **ප්‍රාග්ධනය සහ තොගය** | | | |
| ප්‍රාග්ධන ප්‍රතිපාදන (රාජ්‍ය) | (20) | 577,833,380.00 | 528,865,380.00 |
| ප්‍රති තක්සේරු ඉතිරිය | (21) | 1,267,097,871.69 | 306,770,949.00 |
| විදේශාධාර | (22) | 206,381,615.30 | 144,371,574.00 |
| දේශීය ආධාර | (23) | 25,433,230.64 | 25,920,138.00 |
| පර්යේෂණාධාර තැන්පතු | (24) | 14,650,862.20 | 5,760,076.00 |
| උපදේශක තැන්පතු | (25) | 222,853.34 | 1,382,139.00 |
| වාරික ආදායම් | | 1,250,814.62 | ----- |
| ආදායමට වැඩි වියදම් අතිරික්තය | (26) | (858,041,249.22) | (728,709,003) |
| | | **1,234,829,378.57** | **284,361,253.00** |
| **ජංගම නොවන බැරකම්** | | | |
| පාරිතෝෂික දීමනා | | 28,489,647.00 | 26,793,761.00 |
| **ජංගම බැරකම්** | | | |
| ණයහිමියෝ සහ උපචිත වියදම් | (27) | 9,810,635.98 | 7,803,662.00 |
| ස්කන්ධයන් සහ බැරකම් වල එකතුව | | **1,273,129,661.55** | **318,958,678.00** |

| | | |
|---|---|---|
| කේ.හපුතන්ත්‍රි | යොෂාත් සද්ධාසේන | එම්.ඩී.සේනාරත්න |
| සභාපති. | අධ්‍යක්ෂ ජනරාල්. | වැ.බ.ගණකාධිකාරී. |

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

## 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ආදායම් හා වියදම් ගිණුම.

| ආදායම් | | 2005 | 2004 |
|---|---|---|---|
| රජයේ දායකත්වය | (1) | 84,843,000.00 | 67,200,000.00 |
| විවිධ ආදායම් | (2) | 11,625,350.13 | 11,292,547.00 |
| පොලී ආදායම් | (3) | 338,904.12 | 381,650.00 |
| තක්සේරු කර විකුණුම් වලින් ලද ලාභය | | 20,000.00 | ----- |
| වෙනත් දායකත්වයන් | (4) | 870,180.21 | 2,433,689.00 |
| | | **97,697,434.46** | **81,307,886.00** |

| වියදම් | | | |
|---|---|---|---|
| **පරිපාලන වියදම්** | | | |
| පුද්ගල වැටුප් | (5) | 67,135,554.24 | 53,547,634.00 |
| පාරිතෝෂික දීමනා | | 3,445,874.48 | 9,394,479.00 |
| ගමන් වියදම් හා සංයුක්ත දීමනා | (6) | 265,298.43 | 243,363.00 |
| පාලක මණ්ඩල ගෙවීම් | | 54,000.00 | 69,000.00 |
| වෙනත් ගෙවීම් හා දීමනා | | 787,224,80 | 635,496.00 |
| ආරක්ෂක වියදම් | | 3,685,022.00 | 1,641,896.00 |
| වාහන සඳහා ඉන්ධන | (6) | 764,683.64 | 660,678.00 |
| කාර්ය මණ්ඩල ප්‍රවාහන හා කුලීරථ වියදම් | | 2,695,506.30 | 3,030,906.00 |
| වාහන සඳහා බදු ගෙවීම් | | ----- | 183,540.00 |
| දැන්වීම් සඳහා වියදම් | | 307,406.50 | 331,689.00 |
| ලිපි ද්‍රව්‍ය | (7) | 631,626.23 | 634,894.00 |
| තැපැල් | | 98,245.00 | 79,735.00 |
| සංග්‍රහ | | 189,974.75 | 163,522.00 |
| කාර්ය මණ්ඩල සුභසාධන | | 152,784.40 | 236,071.00 |
| කාර්ය මණ්ඩල පුහුණුවීම් | | 194,588.50 | 107,213.00 |
| දුරකථන | (8) | 1,030,677.41 | 975,598.00 |
| විදේශගතවීම් | | 881,324,58 | 522,778.00 |
| රක්ෂණ | | 150,636.33 | 82,520.00 |
| අලුත්වැඩියා හා පවත්වා ගැනීම් | (9) | 10,582,621.97 | 7,969.485 |
| විගණන ගෙවීම් | | 71,093.00 | 82,186.00 |
| බැංකු ගාස්තු | | 211,187.08 | 175,836.00 |
| රසායන ද්‍රව්‍ය හා වෙනත් | (10) | 208,573.95 | ----- |
| පවිත්‍රතා | (VI) | 649,745.76 | 382,817.00 |
| මුද්‍රණ | | 48,748.70 | 81,760.00 |
| විදුලිය ගාස්තු | (6) | 7,817,763.14 | 8,395,838.00 |
| ජල ගාස්තු | (6) | 2,563,960.88 | 2,203,582.00 |
| බදු හා වරිපනම් | | 594,000.00 | 660,000.00 |
| | | | |
| විශේෂ ව්‍යාපෘති වියදම් | (4) | 870,80.21 | 2,433.689 |
| පර්යේෂණ හා සංවර්ධන වියදම් | (12) | 21,148,429.14 | 20,944.833 |
| කෙටිකාලීන සැපයීම් | | ---- | 120,297.00 |
| සුනාමියෙන් වූ හානිවීම් | | 96,890,859.00 | ------ |

| | | | |
|---|---|---|---|
| ක්ෂයවීම් සඳහා සැපයීම | (13) | 44,421,102.28 | 39,414,294.00 |
| | | 268,552,655.74 | 155,465,297.00 |
| ආදායමට වැඩි වියදම් අතිරික්තය | | **(170,855,231.28)** | **(74,157.411)** |

## ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය

## 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ගැලීම් ප්‍රකාශය.

| | | |
|---|---|---|
| ආදායමට වැඩි වියදම් අතිරික්තය සැකසීම | | (170,855,231) |
| වර්ෂය සඳහා ක්ෂයවීම් | 44,421,102 | |
| පාරිතෝෂික දීමනා | 3,445,874 | |
| මූලික ප්‍රදානයේ වාරික වශයෙන් ලැබීම් | (555,469) | |
| සුනාමියෙන් වූ අලාභයන් | 96,890,859 | |
| ඇස්තමේන්තු කර විකිණීම් වලින් ලත් ආදායම | (20,000) | 144,182,367 |

### මූල්‍ය ප්‍රාග්ධන හිග

| | | |
|---|---|---|
| **ප්‍රාග්ධනයන්ගේ අඩුවීම් / වැඩිවීම්.** | | |
| (වැඩිවීම්) / තොග අඩුවීම් | (1,448,737) | |
| අඩු : එකෝසවුන්ඩර් සඳහා ගත් කඩදාසි | 1,250,815 | |
| (වැඩිවීම්) / තැන්පතු හා ණය අඩුවීම් | 1,251,827 | |
| (වැඩිවීම්) / කාර්යාල ණය හා අත්තිකාරම් ආදායම් | (68,634) | |
| (වැඩිවීම්) / (අඩුවීම්) ණය හා උපචිත | 2,006,974 | |
| ප්‍රධාන මූල්‍යයේ වෙනස්වීම් | | 2,992,196 |
| ක්‍රියාකාරකම් සඳහා උත්පාදන වූ ශුද්ධ මුදල් | | (23,680,669) |
| **ආයෝජන ක්‍රියාකාරකම් වල මුදල්.** | | |
| – ස්ථිර තක්සේරු වල මිලදී ගැනීම් | (15,287,529) | |
| – පාරිතෝෂික ගෙවීම් | (1,749,989) | |
| – භාණ්ඩ විකිණීමෙන් ආදායම් | 20,000 | |
| ආයෝජන ක්‍රියාකාරකම් වලින් ශුද්ධ මුදල් | | (17,017,518) |
| **මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා මුදල්.** | | |
| – ප්‍රධාන වැය කිරීම් සඳහා රජයේ මුදල් | | 48,968,000 |
| – පර්යේෂණ හා ව්‍යාපෘති ආධාර | | 7,731,501 |
| ශුද්ධ වැඩිවීම් / අඩුවීම් මූල්‍ය හා මුදල් සමතුල්‍ය | | 16,001,314 |
| වර්ෂයේ ආරම්භයේදී මුදල් හා මුදල් සමතුල්‍ය (01,01,2005) | | 2,267,175 |
| වර්ෂය අවසනදී මුදල් හා මුදල් සමතුල්‍ය (31.12.2005) | | 18,268,490 |

# විගණකාධිපති වාර්තාව

මගේ අංකය : එෆ්/ඒ/නාරා/එෆ් ඒ/05/101 දිනය : 2006 මැයි 26 දින.

සභාපති,
ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනය.

**ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ (නාරා), 2005 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ගිණුම් පිළිබඳව 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(1) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධි විධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර නියෝජිතායතනයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතුයැයි මා අදහස් කරන, මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් නියෝජිතායතනයේ සභාපතිවරයා වෙත යථා කාලයේදී ඉදිරිපත් කෙරෙනු ඇත.

## 1.2 විගණන විෂය පථය.

මෙම වාර්තාවේ ඇතුලත් විගණන මතය, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන් පිළිබඳ සමාලෝචනයන් සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය සහ පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් සහ කාලවේලාව යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි පරිද්දෙන් පිළියෙල කරන ලද්දකි. මූල්‍ය ප්‍රකාශනයන් ප්‍රමාණාත්මක, සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස ශ්‍රී ලංකා විගණන ප්‍රමිතීන්, විධි සහ පරිචයන්ට අනුකූලව විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශයන්හි දැක්වෙන අගයයන් සහ හෙළිදරව් කිරීම් වලට උපකාර වන සාක්ෂි පරීක්ෂා කිරීම, මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කිරීමේදී අනුගමනය කරන ලද ගණකාධිකරණ මූලධර්ම හා වැදගත් ඇස්තමේන්තු සහ නිගමන තක්සේරු කිරීම, මූල්‍ය ප්‍රකාශ වල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම සහ යොදා ගන්නා ලද ගණකාධිකරණ ප්‍රතිපත්ති සුදුසු ද, ඒවා ඒකාකාරීව අනුගමනය කරන ලද්දේ ද සහ ප්‍රමාණවත් පරිදි හෙළිදරව් කරන ලද්දේ දැයි නිගමනය කිරීම විගණනයට ඇතුලත් විය. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

## 2. ගිණුම්.

## 2.1 විගණන මතය.

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු වලින් උද්ගත වන ගැලපීම් හේතුවෙන් දැක්වෙන බලපෑම් හැර, 2005 දෙසැම්බර් 31 දිනට නියෝජිතායතනයේ මූල්‍ය තත්වය සහ එදිනෙන් අවසන් වන වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල ප්‍රතිඵල සහ මුදල් ප්‍රවාහය ගණකාධිකරණ ප්‍රමිති සහ මූල්‍ය ප්‍රකාශයන්හිදී ඇති අංක 1 සිට 7 දක්වා සටහන් වල දැක්වෙන පරිදි වූ ගණකාධිකරණ ප්‍රතිපත්ති වලට අනුකූලව සියලුම ප්‍රමාණාත්මක කරුණු / සාධාරණ ලෙස දැක්වෙන පරිදි සතුටුදායක ලෙස මූල්‍ය ප්‍රකාශ පිළියෙල කර ඇති බව මාගේ මතයයි.

2.2 ගිණුම් පිළිබඳ අදහස් දැක්වීම.

2.2.1 ගිණුම් ප්‍රතිපත්ති

රු. 4,740,501 ක්වූ විද්‍යාත්මක සගරාවල වටිනාකම ගිණුම්වලදී ස්ථාවර වත්කම් යටතේ දක්වා ඇත.

2.2.2 ගිණුම් වල අත්හැර දැමීම්.

සුනාමි ව්‍යසනය සිදුවූ වකවානුවේ පොත්පත් වලින් ලියා අස් කරන ලද රු. 38,890,859 ක්වූ භාණ්ඩවල ඉතිරි වටිනාකම් ගිණුම් වල සඳහන් කර නැත.

2.2.3 ගිණුම් වල ඌන ප්‍රකාශන හා අධි ප්‍රකාශන.

අභ්‍යන්තර ජලජීවි වගා සංවර්ධන අංශයට නැවත සැපයීම සඳහා දළ වටිනාකම් වූ රු.5,133,000 ක වටිනා භාණ්ඩ සුනාමි ව්‍යසනයේදී විනාශ වී ඇතත් මෙම මුදල ගිණුම් වලින් ලියා අස් කිරීමට ක්‍රියා මාර්ග ගෙන නැත.

2.2.4 ගිණුම් වල නුසුදුසු හෙළිදරව් කිරීම්.

අමාත්‍යාංශයේ පැරණි පිටපත් කිරීමේ යන්ත්‍රය නව යන්ත්‍රයකට මාරු කිරීමේදී ලබා ගන්නා ලද රු. 20,000/- ක මුදල ආයතනයේ ස්ථාවර වත්කම් ලෙර නොපෙන්වා ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද ලාභයක් සේ දක්වා ඇත.

2.2.5 පාලනාධිකාරියේ තීරණ නීති රීති අනුව කටයුතු නොකිරීම.

පහත දක්වා ඇති ඌනතා නිරීක්ෂණය කරන ලදී.

(ඒ) මුදල් රෙගුලාසි

(i) මු. රෙ. 105 (d) - නැතිවූ භාණ්ඩ නැවත සැපයීම හා 25% දෙපාර්තමේන්තු ගාස්තු අය නොකිරීම.

(ii) මු. රෙ. 110 - පාඩු හා නැතිවීම් පිළිබඳ ලේඛණය නඩත්තු නොකිරීම.

(iii) මු. රෙ. 371 (2) (b) - රු. 20,000/- ඉක්මවූ අත්තිකාරම් ගෙවීම.

(iv) මු. රෙ. 327 (2) (c) - අත්තිකාරම් නිරවුල් කිරීම පමා කිරීම.

(v) මු. රෙ. 880 - ඇප තැබීමට අවශ්‍ය පුද්ගලයින් ඇප ඉදිරිපත් නොකිරීම.

(බී) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ.

1998 අප්‍රේල් 3 දිනැති අංක 12/98 - සම්මුඛ පරීක්ෂණය සඳහා වැඩිපුර අත්තිකාරම් ගෙවීම.

(සී) රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ.

2000 ජනවාරි 11 දිනැති පී එෆ්/පීඊ 05 අනුමැතිය රහිතව දීමනා ගෙවීම.

(3) මූල්‍ය හා ක්‍රියාත්මක නිරීක්ෂණය.

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කර ඇති ගිණුම් අනුව 2005/12/31 දිනෙන් අවසන් වූ ආයතනයේ ක්‍රියාවන් හේතුවෙන් රු.170,855,231 ක මුදල් හිගයක් සිදුව ඇති අතර ඊට පෙර වර්ෂය සඳහා වූ හිගය

රු.74,157,411 ක් වී ඇත. මේ අනුව මූල්‍ය ප්‍රතිඵල වල රු. 96,697,820 ක පහළ බැස්මක් පෙන්වයි.

**3.2 ක්‍රියාකාරකම්.**

(a) සුනාමි ව්‍යසනය හේතුවෙන් ආයතනයේ ඇති ස්ථාවර වත්කම් වලට සිදුවූ ඇති හානියේ අගය රු.122,511,769 ක් සේ තක්සේරු කර ඇතත්, නිරීක්ෂිත වර්ෂය තුල හානි වී ඇති අත්‍යවශ්‍ය රසායනාගාර උපකරණ නැවත සැපයීම සඳහා ප්‍රතිපාදන ලැබී නැත.

(b) අදාල වර්ෂය තුල අභ්‍යන්තර ජලජීවී වගා අංශයේ ව්‍යාපෘති 10 ක් සම්පූර්ණ කිරීමට රු.7,927,000 ක මුදලක් ඇස්තමේන්තු වී ඇතත්, නිරීක්ෂිත වර්ෂය තුල ඉලක්ක ගත මුදලින් විදයම් කොට ඇත්තේ රු.2,791,317 ක මුදලක් පමණි. තවද අදාල ව්‍යාපෘති කිසිවක් සම්පූර්ණ කිරීමට නොහැකි වී ඇත.

**3.3 පාඩු සහිත ගනුදෙනු.**

2005 වර්ෂය තුල ආයතනයේ පුස්තකාලයට වාරික සැපයීම සඳහා පෞද්ගලික ආයතනයකට රු.142,784 ක මුදලක් ගෙවා ඇතත් මෙම වාරික ආයතනයට ලැබී නැත.

**3.4 ප්‍රයෝජනයට නොගන්නා සහ අඩුවෙන් ප්‍රයෝජනයට ගන්නා වත්කම්.**

(ඒ) රු. 267,877 ක් වටිනා භාණ්ඩ 33 ක් හා රු. 126,235 ක් වටිනා ස්ථාවර වත්කම් භාණ්ඩ පිළිවෙලින් වසර 5 හා 2 ක කාලයක් ප්‍රයෝජනයට නොගෙන ගබඩාවේ නිකරුණේ තබා ඇත.

(බී) මෝටර් බයිසිකල් 2 ක් වසර 6 ක් පුරාද, එක මෝටර් බයිසිකලයක් වසරකට වැඩි කලක්ද අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ ඉවත් කිරීමට පියවර නොගෙන ප්‍රධාන කාර්යාලයේ තබඩාවේ පැත්තක දමා ඇත.

**3.4 හඳුනාගත් පාඩු.**

(ඒ) කඩොල්කැලේ ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානයේ අඩි 100 ක් දිග මායිම් තාප්පය නියමිත ප්‍රමිතියට අනුව ගොඩ නගා නැතත්, ඒ සඳහා වූ කොන්ත්‍රාත්තුවේ මුළු මුදල වන රු.134,470 ක මුදල කොන්ත්‍රාත්කරුට ගෙවා ඇත. තවද, ඊට අමතරව තවත් රු.149,000 ක මුදලක් මෙම ගනුදෙනුවේ ආරාවුල් සමනය කිරීම සඳහා වැය කර ඇත.

(බී) කඩොල්කැලේ කකුළුවන් ඇති කිරීමේ මධ්‍යස්ථානයක් ගොඩ නැගීම සඳහා රු. 503,215 ක මුදලක් වැයකර ඇතත්, එම ගොඩ නැගීමේ කටයුතු අත්හැර දමා ඇත.

(සී) ණය හිමියන් අතුරින් රු. 301,278/- ක් අයකරගත නොහැකි මුදලක් සේ හඳුනාගෙන ඇත.

(ඩී) ආයතනයේ සේවයෙන් ඉවත්ව ගොස් ඇති සේවකයින් ගෙවීම් පැහැර හැර ඇති රු.180,081/- ක ආපදා ණය මුදලක් අයකර ගැනීමට පියවර ගෙන නැත.

(ඊ) නිරීක්ෂණයට අදාල වර්ෂය තුල නියමිත දිනට විදුලි බිල්පත් නොගෙවීම නිසා රු.24,700/- ක මුදලක අධිභාරයක් සේ ගෙවා ඇත.

(4) **ක්‍රමවේදය හා පාලනය.**

විගණනයේදී සොයාගත්තා ලද අඩුපාඩු, ඌනතා වරින් වර ජාතික ජලජ සම්පත් පර්යේෂණ සහ සංවර්ධන නියෝජිතායතනයේ සභාපතිතුමා වෙත දන්වා ඇත. පහත දක්වා ඇති පාලන ක්ෂේත්‍ර සඳහා විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

(ඒ) අත්තිකාරම්.
(බී) ගොඩනැගීම් සඳහා වූ ගෙවීම්.
(සී) ස්ථාවර වත්කම්.
(ඩී) ගබඩාව.

(එස්.සී.මායාදුන්නේ)
විගණකාධිපති.

## 26.05.2006 දින වාර්තාවෙන් 2005 වසර සඳහා විගණකාධිපති වාර්තාව පිළිබඳ ගත්තා ලද පියවර.

**2.2 ගිණුම් පිළිබඳ විවේචන.**

**2.2.1 ගිණුම් කිරීමේ ප්‍රතිපත්ති.**

වාර්ෂික අයවැයේ ප්‍රධාන වැය කිරීම් වලින් විද්‍යාත්මක සගරා මිලදී ගැනීමට මුදල් සැපයීම සිදුවිය. මෙම විද්‍යාත්මක සගරා විවිධ වසර වල අනෙක් සගරාවලට වඩා වෙනස් ඒවා වේ. එම නිසා මෙම සගරා ස්ථිර තක්සේරුගත කිරීම් පමණක් පෙන්වා ඇත .

**2.2.2 ගිණුම් වලින් අත්හැර දැමීම්.**

අදහස් හා එකග විය. ගිණුම් පිළියෙල කරන කාලය වනවිට සුනාමිය නිසා විනාශ වූ උපකරණ වල වටිනාකම් ඇස්තමේන්තු කිරීම් අසම්පූර්ණ ව තිබූ නිසා ගණනය කිරීම් අපහසු විය. කෙසේ වුවද මෙම ගිණුම් 2006 දී නිවැරදි විය හැක.

**2.2.3 ගිණුම් වල ඌන ප්‍රකාශ හා අධි ප්‍රකාශ.**

අදහස් හා එකග විය. කෙසේ වුවද, මෙය 2006 ගිණුම් වලදී නිවැරදි විය හැකිය.

**2.2.4 ගිණුම් වල එළිදරව් වන නුසුදුසුකම්.**

අදහස් හා එකග විය. කෙසේ වුවද, මෙය 2006 ගිණුම් වලදී නිවැරදි විය හැකිය.

**2.2.5 නීති රීති හා කළමනාකාරිත්ව අදහස් සමග එකග නොවීම්.**

a. (i) එෆ් ආර් 105(ඩී) නැතිවූ භාණ්ඩවල වටිනාකම් වෙනුවෙන් ආපසු ලබා ගැනීම් හා 25% දෙපාර්තමේන්තු ගාස්තු.

මූල්‍යමය රෙගුලාසිවලට අනුව 25% දෙපාර්තමේන්තු ගාස්තු සඳහා ක්‍රියාමාර්ග ගැනිනි.

(ii) එෆ් ආර් 110 – නැතිවීම් හා හානිවීම් වල රෙජිස්ටරයක් පවත්වාගෙන නොයෑම.

2004/12/26 සුනාමිය නිසා ගබඩාවේ තිබූ නැතිවීම් හා හානිවීම් වල ලේඛණය විනාශයට පත්විය. කෙසේ වුවද, අලුත් ලේඛණයක් පවත්වා ගැනීමේ පියවර ගත යුතුය.

(iii) එෆ් ආර් 371 (2) (බී) : රුපියල් 20,000/- ට වඩා ඉක්මවූ අත්තිකාරම් ගෙවීම්.

පර්යේෂණ හා සංවර්ධන ආයතනයක් ලෙස ක්ෂේත්‍ර වැඩ සටහන් වලදී රු. 20,000/- ක සීමා කිරීම් වලට සිදු කිරීමේදී ප්‍රායෝගික වශයෙන් ගැටළු ඇතිවීම ආවේණික වේ. එම නිසා මේ සඳහා අත්තිකාරම් ගෙවීම් වැඩි කරන ලෙස භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් තිබිය යුතුය.

(iv) එෆ් ආර් 371 (2) (සී) : අත්තිකාරම් සඳහා එකගවීම් වල ප්‍රමාදයන්.

මූල්‍ය රෙගුලාසි යටතේ මේ සඳහා ක්‍රියාමාර්ග ගැනීමට එකග විය.

(v) එෆ් ආර් 880 : ඇප තැබීමට අවශ්‍ය පුද්ගලයින් ඇප නොතැබීම.

අදාල සේවකයින්ගෙන් ඇප ලබා ගැනීම සඳහා කටයුතු කරනු ඇත.

b. පොදු පරිපාලන චක්‍රලේඛණ.
1998 අප්‍රේල් මස 03 දින අංක 12/98 – සම්මුඛ පරීක්ෂකයින් සඳහා වැඩිපුර ගෙවූ සංයුක්ත දීමනා –

වහාම ක්‍රියාත්මක වන පරිදි සිදු කරන ලදී. විශ්ව විද්‍යාලයීය සාමාජිකයින් ආදී නිලධාරීන් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය සඳහා පත්කර ඇත. විධායක ශ්‍රේණිවල පත් කිරීම් හා උසස් කිරීම් සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයට පත්කර ඇත. ඔවුන්ගේ සේවය සඳහා වර්තමානයේ ගෙවනු ලබන ප්‍රමාණය මද බැවින් චක්‍රලේඛණයේ පිළිවෙලින් පළමුවන හා දෙවන කොටස්

අනුව දිනකට රු. 1000/- ක හා 500/- ලෙස ගෙවීමට අවසර ලබා ගැනීමට ආයතන අධ්‍යක්ෂකට ඉල්ලුම් කර ඇත.

c. රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛණ.
පීඑෆ්/පීජී 05 2001 ජනවාරි 11 - අනුමැතිය නොමැතිව ගෙවනු ලබන දීමනා.

දැනට බලපවත්වන මණ්ඩලයේ අනුමැතිය ඇතිව වාර්ෂිකව සිදුකරන තොග ගණිත් ගැනීමේ නිලධාරීන් හට දීමනා ගෙවා ඇත. මක් නිසාද යත්, අන් ආයතන වලට වඩා වෙනස් සංකීර්ණ පර්යේෂණ භාණ්ඩ තොග ගණන් ගැනීම සිදුවූ නිසා මෙම දීමනා ගෙවා ඇත. මීට අමතරව දුරකථන ක්‍රියාකරු නොමැති විට ඒ සඳහා යෙදවූ අයට ඔවුන්ගේ රාජකාරියට අමතරව යෙදුණු බැවින් ඔවුන් හට දීමනා ගෙවා ඇත. නමුත් අනාගතයේදී මේ සඳහා අවසර ලබා ගන්නා තෙක් ගෙවීම් නතර කර ඇත.

**3. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය.**

3.1 මූල්‍ය ප්‍රතිඵලය.

3.2 කාර්යසාධනය.

a. සුනාමි ව්‍යසනය නිසා සිදුවූ හානිය ස්ථිර නක්සේරු කිරීම් සඳහා ආයතනය විසින් ආධාර ලබා ගැනීමට ආධාර දෙන ආයතන හා භාණ්ඩාගාරයෙන් ඉල්ලීමක් කරන ලදී. මෙම වර්ෂය තුලදී ඒ සඳහා සතුටුදායක ආධාර ලබා ගැනීමක් සිදු නොවුනි.

b. අභ්‍යන්තර ජලජීවී වගා අංශය මගින් පහත සඳහන් කාරණා නිසා එම අංශයේ ව්‍යාපෘති සම්පූර්ණ කල නොහැකි විය.

(1) සුනාමිය නිසා අංශයේ විද්‍යාගාර හා උපකරණ මිලදී ගැනීම 2005 වසරේදී ප්‍රමාද විය. මත්ස්‍ය රෝග හඳුනා ගැනීම සඳහා වූ PCR විද්‍යාගාරය 2007 වසර තුරු අලුත්වැඩියා කිරීම් සිදු කිරීමට නියමිතය.

(2) සුනාමිය නිසා වාහනවලට වූ හානිය අලුත්වැඩියා කිරීම 2005 වසරේදී පමා විය. එනිසා ක්ෂේත්‍ර චාරිකා සඳහා වාහන ලබා ගැනීම දුෂ්කර විය. එනිසා සැලසුම් කල ක්‍රමයට ක්ෂේත්‍ර චාරිකා සිදු කිරීමට නොහැකි විය.

(3) උතුරු නැගෙනහිර පළාතේ ආරක්ෂක තත්වය නිසා ක්ෂේත්‍රයෙන් එකතු කර ගැනීමට නියමිත වූ "කොස්සා මත්ස්‍ය" යන්ගේ පැටව් එකතු කිරීමට නොහැකි විය. එනිසා සිදු කිරීමට නියමිතව තිබූ පරීක්ෂණ සම්පූර්ණ කල නොහැකි විය.

(4) වාහන ලබා ගැනීමේ දුෂ්කරතා නිසා ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථාන වූ රුකව හා කඩොල්කැලේ ව්‍යාපෘති සිදු කිරීම පමා විය. මෙම ප්‍රාදේශීය පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා වාහන අනුයුක්ත කොට නොමැත.

(5) සුනාමි ව්‍යසනය නිසා පාරිසරික බලපෑම් හේතුකොටගෙන මුහුදු පැලෑටි හා මිරිදිය ඉස්සන් පැටව් විනාශ විය. මෙනිසා මුහුදු පැලෑටි වගාව හා මිරිදිය ඉස්සන් පිළිබඳ වැඩසටහන් ක්‍රියාත්මක නොවුනි.

(6) සුනාමි ව්‍යසනය නිසා අභ්‍යන්තර ජලජීවී වගා අංශයේ පරිගණක සියල්ල විනාශ විය. 2005 නොවැම්බර් වනතුරු මිලදී ගැනීම් සිදු නොවීය. එබැවින් ව්‍යාපෘති වල ඉලක්ක කරා ලගා විය නොහැකිය.

(7) සුනාමිය නිසා එකතු කර තිබූ ආවේණික / විසිතුරු මසුන් හා බෝ කිරීම් සඳහා වූ සියලු දේ විනාශයට පත්විය. අලුත් එකතු කිරීම් සිදු කරන තුරු ව්‍යාපෘතිය සඳහා බලපෑම් ඇති වේ.

3.3 **ඵලදායි නොවූ ගනුදෙනු.**

අදහස් සමග එකග විය. 2006/02/17 දින මේ සඳහා ගෙවිය යුතු ප්‍රමාණය වූ 15% මුදලක් සැපයුම්කරු වන්ගෙන් අයකර ගැනීමට ක්‍රියා මාර්ග ගැනිනි. ඊට අමතරව සගරා කෙලින්ම ප්‍රකාශකයන්ගෙන් මිළදී ගැනීමට ක්‍රියාමාර්ග ගැනිනි.

මේ සඳහා වගකිව යුතු නිලධාරින් සඳහා අවශ්‍ය විනයානුකුල ක්‍රියාමාර්ග ගැනිනි.

3.4 **නිෂ්ප්‍රයෝජන හා ඌන භාවිත තක්සේරු.**

(a) තොග මිළදී ගැනීම් වලදී සමහර නිෂ්ප්‍රයෝජන භාණ්ඩ ගබඩාවට ගෙන ඇත. මෙනිසා අවුරුදු 5 කට වඩා කාලයක් ඉක්මවූ මිළදී ගත් භාණ්ඩ ගබඩාවේ ඇත. මෙනිසා මෙම භාණ්ඩ චක්‍රානුකාර ක්‍රියාමාර්ග සඳහා යොදා ගැනීමට සැලසුම් කෙරිණි.

(b) ත්‍රිකුණාමලය බංගලා භාරකරුට හා සුනාමි අනතුරු සංඥා මධ්‍යස්ථානය සඳහා එක් මෝටර් බයිසිකලයක් යොදවා ඇත. නමුත් වාහන පැදවීම් බලපත්‍රයක් නොමැති බැවින් තාවකාලිකව අත්හිටුවා ඇත. වාහන පැදවීමේ බලපත්‍රයක් ලබාගත් පසු එම බයිසිකලය ලබා දීමට ක්‍රියා මාර්ග ගනු ඇත.

3.5 **හඳුනාගත් අලාභ.**

(a) ඉදිකිරීම් සඳහා වගකිවයුතු නිලධාරින් සඳහා වූ විනයානුකුල ක්‍රියාමාර්ග ගනිමින් සිටී.

(b) කඩොල්කැලේ පර්යේෂණ මධ්‍යස්ථානය සඳහා ලබාගත් කකුළු පැටවුන් බෝ කරන ස්ථානය ඉදි කිරීමට වූ රු. 160,347.75 ක වැඩිපුර ගෙවීමක් සිදුකර ඇත. මෙසේ වැඩිපුර ගෙවන ලද අත්තිකාරම් මුදල් කොන්ත්‍රාත්කරුගෙන් අයකර ගැනීමට නීතිමය පියවර ගෙන ඇතත්, ඔහු නැවත එම ප්‍රමාණය ගෙවීම සිදුකර නොමැත. කෙසේ වුවද මේ පිළිබඳ වගකිව යුතු නිලධාරින් හඳුනාගන්නා තෙක් පරීක්ෂණ සිදුවෙමින් පවතී.

(c) අදහස් හා එකග විය. පාලක මණ්ඩලයේ නීති රීති හා මුදල් රෙගුලාසි අනුව අයකර ගැනීමට නොහැකි ඉතිරි ණය මුදල් ලියා අස් කිරීමට කටයුතු කර ඇත.

(d) අවුරුදු 15 ක් තිස්සේ අයකර ගැනීමට නොහැකිව තිබූ නොගෙවන ලද ආපදා ණය මුදල් අයකර ගැනීම සඳහා හැකි සැම උත්සාහයක්ම දරා ඇත. නමුත් අයකර ගැනීම පිළිබඳ විශ්වාසයක් තැබිය නොහැක. අයකර ගැනීමට නොහැකි මුදලක් ලෙස සලකා රු.11,235/- ක මුදලක් ලියා අස් කිරීමට පාලක මණ්ඩල අනුමැතිය ලැබිණි. විවිධ හේතූන් නිසා අයකර ගැනීමට නොහැකි මුදල් (එනම් නොදන්වා සේවය අත්හැර යාම) අදාල මුදල් රෙගුලාසි හා පාලක මණ්ඩල අනුමැතිය සහිතව ලියා අස්කර තැබීමට සලකා බැලිණි.

(e) භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට පමා වූ නිසා විදුලි බිල් ගෙවීම කල් දමා ඇත. ඒ අනුව දඩ මුදලක් නියම කර ඇත.

(4) **පද්ධතිය හා පාලනය.**

යෝජනා සටහන් කර ගැනිනි. වාර්තාවේ සඳහන් කාරණා පිළිබඳ අනාගතයේදි විශේෂ අවධානයක් දැක්වීමට කටයුතු කෙරෙනු ඇත.

**National Digitization Project**

***National Science Foundation***

Institute : National Aquatic Resources Research and Development Agency(NARA)

1. Place of Scanning : Crow Island, Colombo 15
2. Date Scanned : ..2017...04....26.........................................................
3. Name of Digitizing Company : Sanje (Private) Ltd, No 435/16, Kottawa Rd, Hokandara North, Arangala, Hokandara
4. Scanning Officer

Name : ..chamod....Lakshan...............................................

Signature : .........................................................................

Certification of Scanning

*I hereby certify that the scanning of this document was carried out under my supervision, according to the norms and standards of digital scanning accurately, also keeping with the originality of the original document to be accepted in a court of law.*

Certifying Officer

Designation : Chief Librarian

Name : B G Sunethra Kariyawasam

Signature : .........................................................................

Date : ..2017...04...26...............

*"This document/publication was digitized under National Digitization Project of the National Science Foundation, Sri Lanka"*